# ප්‍රජාශක්ති

# 2024



ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

RDTRI

# ප්‍රජාශක්ති

## අර්ධ වාර්ෂික ප්‍රකාශනය
## 2024 පළමු කලාපය

**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය,**
**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය**
**අංක 24/4,**
**කාසල් වීදිය,**
**කොළඹ 08**

දුරකථන :- **011 269 5579**
ෆැක්ස් :- **011 269 6592**
වෙබ් :- **www.rdtri.gov.lk**

# ප්‍රජාශක්ති - 2024 පළමු කලාපය

## උපදේශකත්වය

**තිලිණි සුරංගිකා කරස්නාගොඩ**
අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**ඩබ්ලිව්.ජී.පී.වේරවැල්ල**
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**එම්.එස්.එස්. නස්ලි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## සංස්කරණය

| | | |
|---|---|---|
| ප්‍රියශාන්ත කාරියවසම් | - | පුහුණු හා පර්යේෂණ නිලධාරි |
| ඩී.ඒ.පී.දාස්වත්ත | - | පුහුණු හා පර්යේෂණ නිලධාරි |
| කේ.එම්.ජී.සමරසේන | - | පුහුණු හා පර්යේෂණ නිලධාරි |
| එස්.ඩී.අල්ගම | - | පුහුණු හා පර්යේෂණ නිලධාරි |
| ඒ.එන්.විතානගේ | - | සංවර්ධන නිලධාරි |
| එස්.බී.එන්.මල්ෂානි ආනන්ද | - | සංවර්ධන නිලධාරි |

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## විද්‍යුත් මාධ්‍යගත කිරීම

පී.ඒ. චිත්‍රා ජයසිංහ
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## පිටකවරය

කේ.බී.එම්.තිසත් ගීමල්

## ප්‍රකාශනය


ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
අංක 24/4,
කාසල් විදිය,
කොළඹ 08

දුරකථන :- 011 269 5579
ෆැක්ස් :- 011 269 6592
වෙබ් :- www.rdtri.gov.lk

# අධ්‍යක්ෂගේ පණිවිඩය

ගෝලීය සමාජය තුළ බහු ආංශික ගැටලු අතර දිළිඳුකම ප්‍රධානතම ගැටලුවකි. විවිධ හැඩතල මෙන්ම විවිධ මුහුණුවරින් මෙම ප්‍රබල අභියෝගය ජනතාව තුළ ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම අභියෝග සහ ගැටලුව ජය ගනු වස් විවිධ වැඩසටහන්, ක්‍රියාකාරකම් රාජ්‍ය තන්ත්‍රය මෙන්ම විවිධ සංවිධාන සමාජ ගත කර ඇත. එහි ප්‍රතිඵල අඩු වැඩි ලෙස දිළිඳු ප්‍රජාවට බලපෑම් කර ඇත. කරනු ද ලබයි.

ඊට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයද සාපේක්ෂ වශයෙන් දායකත්වය දරා ඇත. දිළිඳුකම අවම මට්ටමකින් හෝ සමාප්ත කර ගැනීමට විවිධ ක්‍රමෝපායන් භාවිතා කරයි. මේ අතර සහභාගීත්ව සංවර්ධනය නම් ප්‍රබල මෙවලම සමාජගත කිරීමෙන් ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ තීරණයන් තුළට සජීවී ලෙස බලපෑම් කිරීම දිළිඳු ප්‍රජාවගේ ජීවිතවලට ආලෝකයක් සැපයීම ප්‍රශංසනීය බව මෙහිලා සඳහන් කරනුයේ කෘතවේදීවය.

නව චින්තනයක් තුළින් සමාජ පෙරළියකට සංවර්ධන හැරවුම් ලක්ෂණයක් විය යුත්තේ ව්‍යවසායකත්ව සංවර්ධන ක්‍රියාකාරකම් බව සඳහන් කළ යුතුමය. ව්‍යවසායකයින් බිහිකිරීම තුළ, බිහිවීම තුළ දිළිඳු බවේ ශාපය තීරණාත්මක ලෙස ජයගැනීමට හැකි යැයි විශ්වාස කරමි.

පළකරනු ලබන මෙම ප්‍රකාශනයට අදහසක් ගොනු කිරීමට අවස්ථාව ලැබීමත් සතුටට කරුණකි.

නව කෝණයකින් හා නව මානයකින් සංවර්ධනය පිළිබඳ අරුත්ගැන්වීමට එකතු වූ අදහස්වලට ඉඩ හසර ඉදිරි ප්‍රකාශනවලින්ද අවකාශ සලසමින් සියල්ල ජය ගැනීමට සැවොම පෙළ ගැසෙමු.

# සංස්කාරක සටහන

සංවර්ධන ඉලක්ක ජයගනු සඳහා එම සංස්කෘතියේ විවිධ ස්වභාවයන් වඩාත් නිවැරදිව හඳුනාගත යුතුව ඇත.

යහපාලන සංස්කෘතියක් තුළ සිව්පසය නම් මානව අවශ්‍යතාවය නිදන්ගත වූවාට දිළිඳු ජනතාවට එහි වටිනාකමක් නොමැත.

නිදන්ගත වූ එම අවශ්‍යතා සතර මානව සමාජය විසින් ළඟා කර ගැනීමට සටන් කළ යුතු වේ. එය ඉතා සංයමයකින් මෙන්ම ගැඹුරු කල්පනාවකින් දියත් කළ යුතු බව සඳහන් කළ යුතුය. ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන මෙම ප්‍රජාශක්ති සඟරාවෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ ද සංවර්ධන ඉලක්ක ජය ගැනීමට හා දිළිඳු ප්‍රජාවගේ අවශ්‍යතා සපුරා ගැනීමට විභව ශක්තීන් අවධි කිරීමකි.

තමන් සතුව පවතින ව්‍යවසායකත්ව ගති ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම ද මෙම ප්‍රකාශනයෙන් මතු කෙරේ.

මෙම ප්‍රකාශනය සඳහා සහය දැක්වූ ලේඛක ලේඛිකා වියතුන්ට  අපගේ ගෞරවනීය ස්තුතියත් සහය දැක්වූ සියලුම නිලධාරීන්වද සිහිපත් කරනු කැමැත්තෙමි.

# ලිපි දිගහැරුම ......



1-6

*නව චින්තනයක් තුළින් සමාජ පෙරළියක්*

බී. විජයරත්න

7-10

*විසඳුම අප තුළම බව තේරුම් ගත්තානම් අපි ගොඩ*

චාමින්ද හෙට්ටිආරච්චි

11-16

***A Social Revolution through New Thinking***

Professor M. Thilakasiri

17-20

*සමාජ යහපැවැත්ම ළඟා කර ගැනීම උදෙසා කාන්තාව බලගන්වමු*

ඩී.ඒ.පී. දාස්වත්ත

21-22

*සංවර්ධනයට නව චින්තනයක්*

කුමාරි ජයසේකර

23-26

*නව චින්තනයක් තුළින් සමාජ පෙරළියක් උදෙසා බලපාන ප්‍රධාන සාධක*

කපිල ගාමිණී ප්‍රේමතිලක

27-30

*ග්‍රාමීය සවිබලකරණය තුළින් සංවර්ධනය උදෙසා තුලනාත්මක හා තිරසාර ප්‍රවේශයක්*

ජී.ආර්.එම්. ගම්ලත්

31-35

*සංස්කෘතික මානවයාගේ පුම්තිරිභාවය*

එස්.ඩී. අල්ගම

36-38

*ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම: ග්‍රාමීය සංවර්ධනය, අධ්‍යාපනය සහ ව්‍යවසායකත්වය තුළ කෘතීම බුද්ධිය (ARTIFICIAL INTELLIGENCE) හි බලය*

බුද්ධික ලක්මාල්

**39-41**

*ග්‍රාමීය සංවර්ධනයට නව්‍ය ප්‍රවේශයක් සුහුරු - ගම්මාන සංකල්පය*

කේ.බී.ධර්මප්‍රිය

42-46

*ග්‍රාමීය සංවර්ධනයෙන් ඔබ්බට......... හෝ ගමෙන් අන්තරයට .......*

චන්දිම ද සොයිසා

47-52

*ග්‍රාමීය සංවර්ධන උපායමාර්ගයක් ලෙස මහජන සම්බන්ධතාවය*

ඒ.එන්.විතානගේ

53-56

*නව චින්තනයට සාම්ප්‍රදායික හරයන් මිහිදන් කළ හැකිද*

සුනීතා .සී කරුණාරත්න

# 01. නව චින්තනය තුළින් සමාජ පෙරළියක් ......

බී.විජයරත්න

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරී

හිටපු අමාත්‍යාංශ ලේකම්

නව චින්තනයක් තුළින් සමාජ පෙරළියක් යන මෙම ලිපියේ මාතෘකාවම ඒ ගැන සාකච්ඡා කිරීමට අවශ්‍ය ශාස්ත්‍රීය ප්‍රවේශය ලබා දෙයි. මන්ද මෙහි ඇති අදෘශ්‍යමාන විශාල චිත්‍රය ආර්ථික අර්බුදය නොහොත් රාජ්‍ය බංකොලොත් බව ප්‍රකාශ කිරීම ලෙස නම් කළ හැකිය. මෙම තත්ත්වයට හේතු වූ කරුණු විශ්ලේෂණය කිරීමෙන් විශාල චිත්‍රය පිළිබඳව පළල් අවබෝධයක් ලබාගත හැකි හෙයින් හා ඒ අනුව විසඳුමක් යෝජනා කිරීමට "සමස්තය ගැන සිතීමේ සංකල්පීය රාමුව" ඔස්සේ මේ ගැන සාකච්ඡා කළ හැකිය. (Holistic thinking is the ability to see the big picture and the interconnections between different aspects of a problem or a situation.) නව චින්තනයක් යන්නෙන් විකල්ප චින්තනයක අවශ්‍යතාවයත්, පවත්නා චින්තනය සමාජ අර්බුදයකට මං පෑදූ බවත් එය තවදුරටත් සමාජ පෙරළියකට උපකාරී නොවන බවත් ගම්‍ය කරයි.

"නව චින්තනයක්" සහ "සමාජ පෙරළියක්" යන වාක්‍යාංශ දෙක එක පෙළට දෙපසක තැබුවහොත් එහි මැදින් ඇති හිඩැස මත ඇදෙන සිරස් තීරුවක මෙම නව චින්තනයට අවශ්‍යතාවය මතු කළ හේතූන් ගොනුගත කළ හැකිය.

එවන් පිවිසීමකට පෙර අපි පහත දැක්වෙන උපුටා ගැනීම කෙරෙහි සිත යොමු කරමු. මෙය මවිසින් අන්තර්ජාලයෙන් ලබාගත් තොරතුරු වලින් සමන්විත වෙයි. මෙම YouTube සටහන "කෑමත් හොඳට කන්න දීලා කෑම ඉතිරි කළොත් රුපියල් 100 දඩයක් ගහන අමුතු කඩේ" නමින් දැක්වෙයි. මේ කඩේ මුදලාලිගේ හඬ කෙටි කර ගත්විට මෙසේ සඳහන් කළ හැකිය.

"කෑම ටිකක් හරියට පාරිභෝගිකයින්ට දෙන්න ඕන කියලා හිතුවා. ඒ අනුව පාරිභෝගික මහතුන්ට බෙදාගෙන කන්න ව්‍යාංජන සෙට් එකක් තිබිය යුතුයිනේ. ඉස්සෙල්ලම මේ බෝඩ් එක දැම්මේ නෑ. ඊට පස්සේ ඕනවට වඩා බෙදාගෙන ඉතුරු කරනවා මම දැක්කා. එහෙම දැකලා මම එවන් පාරිභෝගිකයන්ගෙන් ඇහුවා මොනවා හරි කෑමවල අප්සට් එකක් තියෙනවාද කියල. ඒගොල්ලො කිව්වේ, නෑ, එහෙම කෑමවල වරදක් නෑ, අපි බෙදා ගත්තා, ඇති තරම් කෑවා, ඒත් ඔක්කොම කන්න බෑ, ඒ නිසයි ඉතුරු කළේ කියලා.

මෙහෙම අහපුවහම මට හිතුණා මේ පාරිභෝගිකයන් නොදන්න පැත්තක් තියෙනවා කියල, මං ඒ ගොල්ලන්ට කිව්වා බත් පිඟානක බත් ඇට පහළොස් දහසක් විතර තියෙනවා, ඒකට වී කරල් දෙසීයකට වැඩියෙන්ම ඕනෑ වෙනවා කියලා. බත් ඇට දෙකක් විසි කළොත් දෙකෝටි විසි ලක්ෂයෙන් වැඩිකරපුවහම කොච්චර ප්‍රමාණයක් වෙයිද? මං හිතන්නේ, අක්කර පන්සියයක විතර අස්වැන්න වෙන්න පුළුවන් කියල"

මෙම YouTube වීඩියෝවට අදාළව විශාල ප්‍රමාණයක ධනාත්මක ප්‍රතිචාර තිබේ. එමෙන්ම සෘණාත්මක ප්‍රතිචාර ද තිබේ. මේ YouTube අනාවරණයට ඇතුළත් කර ඇති ප්‍රතිචාර / අදහස් අතර පහත සඳහන් ලෙස ඇතුළත් කර ඇති සටහන් තිබේ.

මලින්ද දික්මාදගොඩ මහතාගේ සටහන මෙසේය.

> "ආයුබෝවන්! ඔබේ කතාවට සියයට සීයක් එකඟයි. ඒත් ඔබේ පිටිපස්සෙන් තියෙන කරි පවුඩර් ටබ් ටිකෙන් පේනවා ඔබ හරියට ගණන් හැදුවටම කන්න හොඳ ගුණදායක දේ ගැන හරි අවබෝධයක් නෑ වගේ. අජිනමොටෝ අඩංගු ඒ කරි පවුඩර් වස.. පිළිකා කාරක. ඒ ගැනත් පොඩ්ඩක් හිතන්න"

සුජීව ප්‍රේමරත්න මහතාගේ අදහස මෙලෙසයි,

> "හොඳ වැඩක්, ඔහොම වෙන්න හේතු සහ ලොකුම වැරදි ඔතන කියවෙන්නෙ නෑ. ලංකාවේ මිනිස්සු බුෆේ එකකට ගිහිල්ල කන්න දන්නෙ නෑ. බොහෝ අය කියන්නේ සැරින් සැරේට ඇවිදලා ටික ටික බෙදාගෙන කෑම කන ක්‍රමයක් . ඔක්කොම එක පාර බෙදාගෙන ඇවිත් ඉඳගෙන කන පුළුවන් ප්‍රමාණය මැටි මෝල් විදියට උල් කරගන්න අවශ්‍ය නෑ, සුද්දන්ගේ ක්‍රමය අපි ආදේශ කර ගත්තට ඒක බත්වලට අනුකරණය කර ගන්න විදිය අපි දන්නෑ, කෑම ඔක්කොම එකපාර අනාගෙන කන්නෙත් නෑ. උන් කෑම වෙනම කාලා ඒවායේ රස විඳිනවා වෙන වෙනම. අපි ඉතින් හැමකටම එකම රසට තමයි කන්න ආස ......ඕවා කොහොම උනත් කන බත් ප්‍රමාණය කෑ යුතු ප්‍රමාණයට වඩා දෙගුණයකට වඩා වැඩියි, ඒක නියම ගානට අඩු කරානම් ලංකාවේ ලෙඩ වලින් බාගයක් අඩුවෙනවා. ලංකාවේ වගාවට කියලා නාස්ති කරලා දාන මුදල්, කාලය, ඉඩම්, කැලෑ සහ විදුලිය නිපදවන්න තියෙන ජලය ප්‍රමාණයත් බාගෙකට වැඩිය අඩුවෙනවා" ..

සුජීව ප්‍රේමරත්න මහතාගේ අදහස සැබැඳිව විජිනි විමලසිරි නම් ඇය විසින් මෙසේ සටහනක් තබා තිබේ.

> "එතන නොදන්නකම වගේම පෙරේතකම, කම්මැලිකම කියන ඒවා තියෙනවා හදන්න. ඉතින් ආකල්ප, ආචාර ධර්ම තමයි දියුණු කරන්න ඕනේ. පිටත තැනකට ගිහින් කනකොට මේකට අපි නෙමෙයිනේ ගෙවන්නෙ කියලා ඕනෙ තරම් බෙදාගෙන කන්න බැරි උනාම කිසිම දුකක් නැතුව කුණු භාජනයට හලනවා. හිතන්නෙ නැහැ මේ හලන්නෙ තව ටික දවසකින් ආපහු මටම කන්න ඕන වෙන බත් ටිකක් නේද කියල. අපේ මිනිස්සුන්ට අර හැඟීම කියන එක ගොඩක් අඩුයි. ඉස්සරට වඩා ගොඩක් අඩුවෙලා. දැන් ඉන්න ළමයින්ට කොහොමත්ම නැහැ. ජපන්නු දිහා බලන් හිටියනං ආසාවටම හැදෙන්න පුළුවන්. හැබැයි ඉතින් 5Sවත් හරියට දිගටම කළේ නැහැ. අපේ කෙනෙක් දිහා බලලා හැදෙන එකත් නිකං කට්ටියට මදිකමක් වගේනෙ"

සාරංග කුමාර මහතා මෙසේ සටහන් තබා තිබේ.

> “ඉස්කෝලවලින් අවුරුදු දහතුනක්ම වැඩකට නැති ඒවා උගන්වන එකේ එදිනෙදා ජීවිතයට වැදගත් මූලික නීතිය, කෘෂිකර්මාන්තය, ජීවන කුසලතා, ඇළක දොළක යන්තම් පීනන්න වගේ ඒවා ටිකක් උගන්නන්න ඕන හැම ළමයටම. බත් ඇටයක් පිඟානට ගේන්න මිනිස්සු කොච්චර දුක් විඳිනවද කියලා ඒව කරවලම පෙන්නන්න ඕනේ. දානෙ ගෙවල්වල මඟුල් ගෙවල්වල මිනිස්සු බත් බෙදා ගන්නවා දැක්කම අප්පිරියයි. අනලා අනලා කුණු කූඩෙට.

මදුශංක රණසිංහ මහතාගේ සටහන මෙසේ ය.

> “ඉතින් උගේ කඩේට යන පිස්සෝ කෑම ටිකට ගෙවලා තියෙනවා නම් ආයෙ කන්න බැරි එකට වෙනම ගෙවන්න ඕනද නාස්ති කරන එක හොඳ නැති එක වෙනම කතාවක් එහෙම කියලා මුගෙ කඩේ කෑම කන්න පුළුවන් ඒවද කියල කවුද දන්නේ? පාරිභෝගික අධිකාරියට දන්වලා මේවා සීල් තියන්න ඕනේ. කඩවල්වලට දඩ ගහන්න අවසර දුන්නේ මොන නීතිය යටතේද”

මදුශංක රණසිංහ මහතාගේ අදහසට ප්‍රතිසටහනක් තබන බුද්ධික සජිත් මහතා මෙසේ කෙටි අදහසක් දක්වයි.

“කමෙන්ට්ස් ටික දෙස බලනු”.

ඉහත දැක්වූ සියලු උපුටන පිටුපස ඇති මහා සේයාව චින්තනය (ඉතා සරල අර්ථයෙන් ගතහොත් සමාජයක මිනිසුන් සමස්තයක් වශයෙන් සිතන මතන ආකාරය) නොවෙයිද?

චින්තනය නම් වූ සංකල්පයෙන් නොඑසේ නම් චින්තනය යන පදයෙන් හැඟවෙන්නේ කුමක්ද යන්න ගැඹුරින් තේරුම් ගැනීමේ දී ඒ සඳහා වූ සමුද්දේශ ලක්ෂය හෙවත් එය ස්ථානගත වන්නේ කවර පදනමකට සාපේක්ෂව ද යන්න පළමුවෙන්ම සලකා බැලිය යුතුය. මෙහිදී අපට වචන දෙකක් හමුවේ. එනම් බටහිර ප්‍රවාදය වූ විඥානයවාදය (Idealism) හා පෙරදිග (බුදුසමයේ) ප්‍රවාදය වූ විඤ්ඤාණවාදය (Consciousnism) යන්නයි. චින්තනය යන්න විග්‍රහ කර ගැනීමේදී මෙම වචන දෙකෙහි තේරුම් වෙන වෙනම පැහැදිලිව තේරුම් නොගතහොත් අපි දාර්ශනික අවුලක පැටලෙන බව බන්දුපාල ගුරුගේ මහතා පෙන්වා දෙයි. විඥානය (Idealism) යන පදයේ අධිකාරය අයත් වන්නේ දෙවියන්ටය, බයිබලයටය. ලෝකය මැවූ දෙවියන් හා බයිබලය ඇසුරින් උපන් මෙම වචනය නිරන්තරයෙන්ම සිත දෙවැනි කොටස දෙවියන් ඔසවා තබන්නේය. මේ අනුව ක්‍රිස්තු භක්තිකයාගේ සිත මෙහෙයවන්නේ දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුවය.

බටහිර දැනුම හා බටහිර චින්තනය සම්බන්ධයෙන් මහාචාර්ය නලින්ද සිල්වා මහතා මෙසේ කියා සිටියි. බටහිර දැනුම ගොඩනැගී ඇත්තේ ග්‍රීක, යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පදනම් කරගෙනය. මේ චින්තනය අප විසින් කලකට පෙර යුදෙව් චින්තනය ලෙසද පසුව යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ලෙසද එයටත් පසුව යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය ලෙසද හඳුන්වා ඇත. මේ කුමන නමකින් හැඳින්වුවද ඉන් කියවෙන්නේ එකම චින්තනයක් ගැනය. ඒ කෙසේ වුවත් චින්තනය වෙනස් වීම යන්නෙන් අදහස් කෙරෙන්නේ එක් චින්තනයක් නැති වී වෙනත් චින්තනයක් ඇතිවීම නොව, එවකට තිබූ ප්‍රධාන චින්තනය පසෙකට ලා වෙනත් චින්තනයක් ප්‍රධාන තැනට පත්වීමයි. සමාජයක බොහෝවිට ප්‍රධාන චින්තනයක් වෙයි. එයට අමතරව ආන්තික චින්තන තිබිය හැකිය.

මේ සම්බන්ධයෙන් තවදුරටත් අදහස් දක්වන ඔහු අද අප උගන්වන, ඉගෙන ගන්නා බටහිර දැනුම ප්‍රචලිත වන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදයේ අංගයක් ලෙස බව කියයි. බටහිරයන් අද අප පාලනය කරන්නේ තුවක්කුවේ ආධාරයෙන් නොව ඔවුන් නිර්මාණය කරන දැනුමෙහි ආධාරයෙනි. අපට බටහිරයන්ගෙන් නිදහස් විය හැක්කේ ඔවුන්ගේ දැනුමෙන් නිදහස් වීමෙන් පමණකි. ඒ සඳහා අපේ දැනුමක් නිර්මාණය කළ යුතුය.

එහෙත් බුදු දහමේ කතා කෙරෙන විඤ්ඤාණය (Consciousnism) සිත පෙරටු කරගත් එකකි. “මනෝ පුබ්බංගමා දම්මා මනෝ සෙට්ඨා මනෝමයා” එනම් සිතෙහි ඇතිවන ගතිගු සිත පෙරටු කොට ඇති බවත් ගතිගු සිත ක්ෂේය කොට පවතින බවත් මනස හෙවත් මනෝ යන්න ඉන්ද්‍රිය බවත් විඤ්ඤාණය යනු ඉන්ද්‍රිය හා විෂය ගැටුමින් පහළවන පුබුදුකම බවත් සළකනු ලැබේ. ඒ අනුව මනුෂ්‍ය හෝ සත්ව ජීවිතය හෝ ගොඩනැගී ඇත්තේ සිත හෙවත් විඤ්ඤාණය මූලික කර ගෙන බව පැහැදිලි වේ. මේ ගැන මහාචාර්ය නලින් ද සිල්වා මහතා මෙසේ පැහැදිලි කරයි. අප දැනුම නිර්මාණය කරන්නේ ඉන්ද්‍රිය පද්ධතියට මනසට හා සංස්කෘතියට සාපේක්ෂව යැයි කිව හැකි වුවත් මනසින් සිදුවන කාර්යයන් සුවිශේෂ බැවින් මනස වෙනම සඳහන් කිරීම වැදගත් යැයි සිතමු.

සංකල්ප නොමැතිව සංජනන හට නොගත්තද සංජනන නොමැතිව සංකල්ප ඇතිවිය හැකිය. සියලු දැනුම් මනසේ නිර්මාණ වන අතර මනස ද මනසෙහි නිර්මාණයක් වෙයි. පංචෙන්ද්‍රය, මනස, චින්තනය හා සංස්කෘතිය අතර ඇති සම්බන්ධතාවය මහාචාර්ය නලින් ද සිල්වා මහතා මෙසේ පැහැදිලි කරයි. චින්තනය යන්න අප යොදා ගන්නේ සිතීම යන අරුතින් නොවේ. යම් සංස්කෘතියක ජීවත්වන ජනතාවගේ මානසිකව කෙරෙන කටයුතු එකට බැඳ තබන්නේ චින්තනය විසින්ය. සංස්කෘතියක පදනමෙහි චින්තනය වෙයි. සංස්කෘතියක් යනු මිනිසුන් විසින් නිර්මාණය කෙරෙන්නකි. සංස්කෘතියෙහි ආරම්භය කවරදා කෙසේ ඇති විණිදැයි කීමට හෝ සෙවීමට අප උත්සාහ නොගත්තද සංස්කෘතියක් පරම්පරාවෙන් පරම්පරාවට උරුම කෙරෙන බව පැහැදිලිය. සංස්කෘතිය යනු කැවුම් කිරිබත් පොල්තෙල් පහන ආදිය පමණක් නොව ඇඳුම් පැළඳුම්, නැටුම් ගැයුම්, කලා ශිල්ප, ආගමික කටයුතු, විද්‍යාවන්ද ඇතුළු දැනුම, ආචාර ධර්ම, කෙළිසෙල්ලම්, භාෂාව, වෙදකම, ඉංජිනේරු ශිල්පය, ආදී සියල්ල වෙයි. යම් පුද්ගලයෙකු ජෛවීයව හෝ සංසාරිකව හෝ උරුම කර නොගන්නා වූ දෑ උරුම කරගන්නේ සංස්කෘතිකවය.

ඊළඟට මෙම ලිපියේ සංක්ෂිප්ත බව රැකීම සඳහා විශාල චිත්‍රය (1948 නිදහසින් පසු ශ්‍රී ලංකාව මේ වන විට මුහුණ දෙන අභියෝගාත්මක ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටී. එහි දුක්ඛිත කූටප්‍රාප්තියේ ආරම්භය 2019 වසරේ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ව්‍යාප්ත කොවිඩ්-19 වසංගතයෙන් උග්‍ර වීම) පළල් ලෙස අවබෝධ කර ගැනීම සඳහා ඊට හේතු වූ කරුණු දීර්ඝ ලෙස විස්තර /විශ්ලේශනය කිරීම වෙනුවට එය කදිමට නිරූපණය කරන හා ඉල්ලා සිටිනු ලබන සමාජ පෙරළියේ හැඩය කියාපාන පහත සඳහන් උපුටනය මෙහි තබමි.

*“විවිධ වූ ඉල්ලීම් මත සමාජයේ බහුවිධ කොටස් වෙතින් සටන් පැන නගින ආකාරය අපිට මේ වනවිට දක්නට පුලුවන්. වෘත්තීය සමිති අරගල හා ගොවි උද්ඝෝෂණ මීට උදාහරණ. වැඩකරන ජනතාව තම ඉල්ලීම් ඉදිරියට දමන ආකාරය හා ප්‍රභූ පිරිස් හා පාලක පන්තීන් ඊට ප්‍රතිචාර දක්වන ආකාරය අනුව අනාගතය තීන්දු වීමට නියමිතයි. පසුගිය දශක හතරක කාලය තුළ ලංකාව තුළ ප්‍රභූ පන්තිය ගතකළ අධිකතර ජීවිතය; ඔවුන් කළ අධම ප්‍රාග්ධන සමුච්චනය හා අති සුඛෝපභෝගී පරිභෝජනය සිදුවූයේ ඇඟලුම් කම්හල්වල, තේ වතුවල කම්කරුවන්, සංක්‍රමණික ගෘහ සේවිකාවන් හා අවිධිමත් අංශයේ කම්කරුවන් ආදී වූ වැඩ කරන ජනතා කොටස්වල සුබසිද්ධිය කැප කරමින්. එහෙත් මේ මාවත එහි තාර්කික අවසානය වෙත එළැඹ තිබෙනවා. වසංගතය විසින් ඇති කළ විනාශය පසුපස සැඟව තිබූ, එහෙත් වැඩෙන ආර්ථික අර්බුදය සමග එළියට එමින් තිබෙන පන්ති අරගලය විසින් අපගේ අනාගතය තීන්දු කරාවි.”*

ආචාර්ය අහිලන් කදිරගාමර්

අප ඊළඟට සලකා බැලිය යුත්තේ සමාජ පෙරළියක් ඉල්ලා සිටිනු ලබන නීතියේ ආධිපත්‍ය බිඳ වැටීම, වංචාව දූෂණය නාස්තිය රජයන මජර දේශපාලන ඇබ්බැහිය, ආර්ථික කඩා වැටීම, හා සදාචාරාත්මක අගනාකම් හා පුරුෂාර්ථ බිඳ වැටීම හමුවේ දියත් කළ යුතු නව චින්තනය කුමක් විය යුතු ද යන්නයි.

මෙහිදීම අනගාරික ධර්මපාල තුමාගෙන් පටන් ගෙන මාටින් වික්‍රමසිංහ, කුමාරතුංග මුනිදාස, ගුණදාස අමරසේකර, නලින් ද සිල්වා යන විද්‍යාර්ථයන් විසින් ගෙන එන ලද ජාතික චින්තනය හෙවත් සභ්‍යත්වය, රාජ්‍ය මහින්ද චින්තනය සෞභාග්‍ය දැක්ම දක්වා රාජාභිෂේකවූ හා අරගලයෙන් ඔටුනු බිඳ දැමූ ජාතික චින්තතනය තවදුරටත් ඔසවා තැබිය හැකිද යන්න සලකා බැලිය යුතුය. එය කෙසේ වුවද ගෝලීය මට්ටමින් ගත් කළ බටහිර හා පෙරදිග චින්තනය නමින් චින්තන ධාරාවන් දෙකක් පවතී. බටහිර චින්තනය යුදෙව් ක්‍රිස්තියානි ආගම් සමඟ බද්ධ වී ඇති අතර එහි පෞද්ගලිකත්වයන් ඉස්මතු වෙයි. ඒ අනුව පුද්ගල නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, අයිතිවාසිකම්, සෘජු හා ස්වයං ප්‍රකාශනය, ස්වාධීනත්වය, පුද්ගල අත්කර ගැනීම් සහ ළඟාවීම් එහි ප්‍රධාන හරයන් වෙයි. විශේෂයෙන් බුදු දහම, හින්දු ආගම, කොන්පියුසියස් දහම, තාවෝ දහම පදනම් කරගත්තේ පෙරදිග චින්තනයේ අරටුව වන්නේ සාමූහිකත්වයයි. සමගිය, පවුල් සම්බන්ධතා, සමාජීය බැඳීම්, අල්පේච්ඡ දිවිපැවැත්ම, දෛලෙක්තික පරස්පරයන් පිළිගැනීම, චිරාත් කාලයක් අනුගමනය කළ චාරිත්‍ර වාරිත්‍ර මෙන්ම ඇදහිලි හා විශ්වාසය කෙරෙහි නැඹුරුව, එකිනෙකාට ගරුකිරීම, අචාර් හා අභිනය මුසු සන්නිවේදන, යුතුකම් කෙරෙහි නැඹුරුව, අධිකාරියට අවනතවීම මෙහි ඇති ගති ලක්ෂණයන් වෙයි.

නව චින්තනයක් ගැන සාකච්ඡා කිරීමේදී අත් නොහැල හැකි චින්තන ධාරාවක් අප රට තුළ අවුරුදු 2500කට වැඩි කාලයක් තිස්සේ මුල් බැසගෙන තිබේ. එය සිංහල බෞද්ධයයි හඳුන්වාදීමෙන් කවරෙකු වුවද හිරන්තියට පත් නොවිය යුතුය. බුදුදහමේ මූලික ඉගැන්වීම වන්නේ චතුරාර්ය සත්‍ය හා අෂ්ටාංගික මාර්ගයයි. මේ ඉගැන්වීමට අනුව ජීවිතය දුකකි. දුක ඇතිවන්නේ තෘෂ්ණාව හෙවත් උපාදානයන් හේතුකොටගෙනය. දුක් සහිත මෙම ජීවිතයෙන් මිදිය හැක්කේ නිවන අවබෝධ කරගැනීමෙනි. මෙම ගමනේදී මධ්‍යම ප්‍රතිපදාව අනුව දිවිපැවැත්ම සවිකර ගැනීම ගිහි පුරවැසි සමාජයකට අදාළ වෙයි. එනම් ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුව ජීවිතයේ සියලු කටයුතුයි මෙහෙයවා ගැනීමයි.

මෙනයින් ගත් කළ අප රට විවිධ ජාතීන්ගෙන් සමන්විත, විවිධ ආගම් අදහන, සංස්කෘතික විවිධත්වයක් ඇති රටක් බැවින් අපට අවශ්‍ය වන්නේ මෙම සංස්කෘතික විවිධත්වය අගය කරන, ගරු කරන හා පවත්වාගෙන යන පෙර අපර දිග චින්තනයන්ගේ සාධනීය ගති ලක්ෂණයන් එකට මුසු කරගත් චින්තනයක් මිස වෙන කුමක්ද?

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. සභ්‍යත්ව රාජ්‍ය - බන්ධු පාලගුරුගේ
2. ශ්‍රී ලාංකේය දේශපාලනයේ අනන්‍යතාවය සහ අනම්‍යතාවය - ආචාර්ය අලුත්වැව සෝරත හිමි
3. මගේ ලෝකය - නලින් ද සිල්වා
4. අපේ ප්‍රවාදය - නලින් ද සිල්වා
5. විකල්ප මතවාද - එච්. ඩී සුමනරත්න
6. මන්දිර කැළඹූ අරගලය - පෙරටුගාමී සමාජවාදී පක්ෂය
7. https://www.himalmag.com/interview/rethinking-sri-lankas-economic-crisis-interview-ahilan-kadirgamar-2022

https://www.facebook.com/share/v/R15q9M1Bsip@kr9u/?mibextid+TGkgF5

9. https://thespanishgroup.org/blog/how-is-eastern-culture-different-from-western-culture/
10. https://australiantranslationservices.com.au/western-vs-eastern-culture/#Eastern_and_Western_Cultures_The_Economic_Differences

## 02. විසඳුම අප තුළම බව තේරුම් ගත්තානම් අපි ගොඩ ......

චාමින්ද හෙට්ටිආරච්චි
දිසාපති / දිස්ත්‍රික් ලේකම්
ත්‍රිකුණාමලය

'විසඳා ගැනීමට අපහසු ගැටලු' වනාහී ඕනෑම මානව සමාජයකට පොදු ධර්මතාවයකි. ශ්‍රී ලාංකික සමාජයටද එය සාමාන්‍ය කාරණයකි. මෙකී නානාවිධ ගැටලු "රජයන් විසින් ජනතාව වෙනුවෙන් විසඳා දිය යුතු" ඒවා ලෙස බොහෝ සභාවන්හි විග්‍රහ කරනු දකින්නට ලැබේ. ඒ අනුව දේශපාලනඥයන්ගෙන් හා නිලධාරීන්ගෙන් සමන්විත විවිධ රජයන් මගින් ජනතා ගැටලු විසඳීමට විවිධ ප්‍රයත්නයන් දරනු ලැබේ. මෙම සටහන මගින් රචකයා උත්සාහ කරන්නේ ගැටලු විසඳීම කෙරෙහි යොදා ගත හැකි ප්‍රවේශයන් අතරින් වඩාත් ඉක්මන් ප්‍රතිඵල ගෙනෙන ප්‍රවේශයක් කෙරෙහි අවධානය යොමු කිරීමට ය.

සමහරවිට ගැටලුවකට විසඳුම ලෙස බැලූ බැල්මට විද්‍යාමාන වන විසඳුම විශාල මුදල් ප්‍රමාණයක් යෙදවීම විය හැකිය. ශ්‍රී ලංකාව වැනි රටකට ක්ෂණිකවම එවන් විශාල මුදලක් සපයා ගැනීම අසීරු කරුණකි. එමෙන්ම තවත් ගැටලුවකට බැලූ බැල්මට පෙනෙන විසඳුම අතිරේක ඉඩම් ප්‍රමාණයක් විය හැකිය. එයද එක්වර ජය ගත නොහැකි අභියෝගයකි. දැඩි ශුෂ්ක ප්‍රදේශයක පවත්නා දැවෙන ගැටලුවකට කවුරුත් සිහින මවනා විසඳුම පානීය ජල ව්‍යාපෘතියක් වීමට පුලුවන. එයද දවසින් දෙකෙන් ඉටුකර ගත හැකි කාරණයක් නොවේ. මෙවන් කවුරුත් දකින එක්වර පෙනෙන එහෙත් විසඳා ගත හැකි මානයක්වත් නොපෙනෙන විසඳුම් කෙරෙහිම එල්බ සිටීමෙන් ප්‍රශ්න විසඳුම් නොමැති සංකීර්ණ තත්ත්වයන් බවට පත්වේ.

මා මෙහිදී මතු කිරීමට අදහස් කරන කාරණය වන්නේ ගැටලු සහිත පාර්ශ්වයන් විසින් විසඳුම ඇත්තේ අප තුළමය විනා වෙනත් පාර්ශ්වයක් භාරයේ නොවේය යන විශ්වාසය ඇතිව ගැටලුවලට විසඳුම් සෙවීමට උත්සුක වන්නේ නම් බොහෝ ප්‍රශ්න වලට සාධනීය විසඳුම් කෙටි කලක් තුළම අප වෙතින්ම නිර්මාණය කර ගත හැකි බවය.

මේ සඳහා සැපයිය හැකි මෑත කාලීන මහා උදාහරණය නම් මුලු රටම ඉන්ධන අර්බුදයෙන් ගිල ගත් මොහොතේ ඒ සඳහා නිර්මාණය කර ගත් විසඳුමයි. එකල මා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙක් ලෙස සේවය කළ බැවින් මෙම ගැටලුවට සෘජුවම මැදිහත් වීමට සිදුවිය. එම දිනවල කිලෝමීටර් ගණනින් ඉන්ධන පෝලිම් නිර්මාණය විය. පෝලිම්වල මහා ගැටුම් පමණක් නොව පෝලිම්වලදී මහජන මරණ පවා වාර්තා විය. රටෙහි පොදු කටයුතු සැහෙන තරම් අඩපණ විය. ඩොලර් වලින් මුදල් ගෙවා ගත නොහැකිව සති ගණන් මුහුදේ නැව් රඳවා ගැනීමට සිදුවිය. මුලු රටම ඉන්ධන අර්බුදය නිසා කුමකින් කුමකට පත්වේදැයි සිතා ගැනීමට නොහැකිව සිටින අවස්ථාවක ඒ සඳහා

නිර්මාණය කරගත්, කාටත් පිළිගත හැකි ප්‍රායෝගික විසඳුම වූයේ QR කේත ක්‍රමයක් මගින් සෑම වාහනයකටම නිශ්චිත ඉන්ධන ප්‍රමාණයක් ලබා දිය හැකි ක්‍රමවේදයක් නිර්මාණය කිරීමයි. ඒ මගින් විදේශයකට ඩොලර් ණය වීමකින් තොරව රටෙහි සියලු කටයුතු සෑහෙන මට්ටමකින් පවත්වා ගත හැකි මට්ටමකට රැගෙන ඒමට හැකිවිය.

අද වනවිට ඩොලර් අර්බුදය යම් ප්‍රමාණයකට සමථයකට පත්වී තිබුණද QR ක්‍රමවේදය පැවති කාලයේ ජනතාව හුරුවූ ඉන්ධන පිරිමසාගෙන පරිහරණය කිරීමේ පුරුද්ද නිසා ඉන්ධන භාවිතයේ අඩුවක් අදටත් නිරීක්ෂණය වේ. ඒ අනුව රටට ඉන්ධන අර්බුදයට මුහුණ දිය හැකි වූයේ ඒ සඳහා අප වෙතින්ම විසඳුමක් සොයාගත හැකිය යන දැඩි විශ්වාසයෙන් අදාළ සියලුම දෙනා කටයුතු කළ නිසාවෙනි. ප්‍රශ්නයට ප්‍රායෝගික විසඳුමක් ලැබ දුන්නේ ප්‍රශ්නය කෙරෙහි වෙනස් ආකාරයට සිතීමට හැකිවූ නිසාය.

මම මීට සති කීපයකට පෙර අපූරු සිද්ධියකට මුහුණ දුන්නෙමි. ඒ පුල්මුඩේ ප්‍රදේශයේ වී ගොවිතැන් කරන ගොවීන් හා කිරි හරකුන් ඇති කරන කිරි ගොවීන්ගේ ගැටලුවකට මැදිහත් වීමෙනි. වී ගොවීන්ගේ චෝදනාව වූයේ කිරි ගොවීන් නිසි අකාරයෙන් කිරි හරකුන් බලා කියා නොගන්නා බැවින් උන්ගෙන් වී වගාවට හානි සිදු වීමයි. කිරි ගොවියන් ප්‍රකාශ කළේ වැට සැකසීමට අවශ්‍ය ලී දඬු නොමැතිවීම නිසා වැට සකස් කළ නොහැකි බවයි. ගොවි කණ්ඩායම් දෙකම එකිනෙකාට චෝදනා කර ගනිමින් විසඳුම මා ඇතුලු රාජ්‍ය නිලධාරී පිරිස වෙත පවරමින් විශාල කල බැගෑනියක් ඇති කරමින් තිබුණි. ප්‍රදේශයේ සාමයටද එය තර්ජනයක් වන මට්ටමට ඇවිලී යමින් තිබුණි. මේ පිළිබඳව අධ්‍යයනයේදී ඉතා හොඳින් පැහැදිලි වූයේ වී වගා නොකර ගවයින්ට නිදැල්ලේ සිටිය හැකි ඉඩම් ප්‍රමාණය සාපේක්ෂව වැඩි බවයි. ඒ අවබෝධයත් සමඟ සියලුම ගොවීන් හා නිලධාරීන් එක්ව පුල්මුඩේ ප්‍රදේශයේදී ඒ ගැන සාකච්ඡා කළ අතර මුල සිටම මා අවධාරණය කළේ ඔවුන්ගේ ප්‍රශ්නයට ඔවුන්ම විසඳුමක් නිර්මාණය කර ගත යුතු අතර අපේ කාර්යභාරය ඊට පහසුකම් සැලසීම බවය. පැය දෙකක සාකච්ඡාව තුළ අදාළ ගැටලුව නිරාකරණය කර ගැනීමට අපට හැකිවිය. එනම් හැමවිටම කුඹුරුවල සිට මීටර් 500 කට වඩා ඈතින් ගවයින් රඳවා තැබීමත්, කිරි ගවයින් අතරම තෝරා ගත් කණ්ඩායමක් මගින් ගවයින් බලා ගැනීමට සැලැස්වීමත් ය. තවද ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට වී ගොවීන්ද ඉදිරිපත් විය. මේ සටහන තබන මොහොත තෙක් එම විසඳුමට අදාළව කිසිදු ගැටලුවක් පැන නොනැගුණි.

රාජ්‍ය සේවය තුළදී සාමාන්‍ය ජනතාව විශාල ප්‍රමාණයක් ඇසුරු කිරීමේ අත්දැකීම් හමුවේ සිතෙහි ගැඹුරට කිඳාගත් අදහසක් ඇත. එනම් ජනතාව බොහෝ දෙනෙක් තුළ දියුණුවීම පිළිබඳ අදහසක් නොමැති අතර දියුණුව තවත් කෙනෙක් විසින් රැගෙන ආ යුතුය වැනි අදහසක් ඔවුන් තුළ පවතින බවයි. ඒ නිසාම උපයන දෙය අරපිරිමැස්මෙන් පාවිච්චි කර අනාගතය වෙනුවෙනුත් යමක් ඉතිරි කරනවා වෙනුවට හරි හම්බ කරන වේගයට වැඩි වේගයෙන් වියදම් කිරීමටත් අවසානයේ ණය වීමටත් ණය ගෙවීමට තවත් ණය ගෙන ණය උගුල්වල සිරවීමටත් සිදුව ඇත. අප විසින් එකම මට්ටමේ ආදායම් ලබන්නන් තුළ ජීවිත දියුණුවේ අහස පොළව මෙන් වෙනස්කම් දකින්නේ මේ ආකාරයට සිතීමේ වෙනසින් ආරම්භව හැසිරීමේ කෙළවරින් අවසන්වන මේ වෙනස නිසාය. ඒ නිසා ජනතාව වෙනුවෙන් යම් යම් භෞතික දේ සපයා දෙන අතරේ අපේ

දියුණුව අප විසින්ම සලසා ගත යුතුය යන අදහස මෙන්ම ඒ සඳහා විසඳුම් අප අතරම පවතීය යන විඥානය ජනතා සිත්හි පුබුදුවාලීම අපගේ කාර්යභාරයකි.

මේ දිනවල මුලු රටම වෙලාගත් උණුසුම් දේශගුණ තත්ත්වයක් පවතී. ත්‍රිකුණාමලයේ වැව් ආශ්‍රිත වාරි කර්මාන්තය තුළ උද්ගත වී ඇති බරපතළ අවශ්‍යතාව නම් මෙම යල කන්නය අවසන් වනතෙක්, එනම් ලබන අගෝස්තු වනතෙක් තිබෙන ජල ප්‍රමාණය රැක ගැනීමයි. විශේෂයෙන්ම පවතින වියලි කාලගුණික තත්ත්ව යටතේ වාෂ්පීකරණය හේතුවෙන්ද යම් ජල ප්‍රමාණයක් වැව්වලට අහිමිවේ. මෙම ජල සම්පත පාලනය කිරීමේ පූර්ණ වගකීම ප්‍රදේශයේ වාරි ඉංජිනේරුවරයා හා දිසාපති වෙත පවරා කටයුතු කරන ගොවි මහත්වරුන් මේ දිනවල අපට හමුවේ. නමුත් අවශ්‍ය අවම මට්ටමෙන් මේ දිනවල වාරි ජලය පරිහරණය කර වැඩි ජල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමත් ජල සම්ප්‍රේෂණයේදී සිදුවන අධික බාහිර කාන්දුවීම් තත්ත්වයන් පාලනයට පියවර ගැනීමත් මේ සඳහා හොඳම විසඳුම් වන අතර එහි මුඛ්‍ය කාර්යභාරය පැවරී ඇත්තේ ගොවි ජනතාව වෙතමය. ඒ බව ඔවුන් අවබෝධ කරගෙන දහස් ගණන් ගොවි ජනතාව එක්සත්ව එක්සිත්ව වැඩ කළ තරමට මේ අභියෝගය ජය ගත හැකි වනු බව මාගේ දැඩි විශ්වාසයයි.

අපේ විසඳුම්කරු අපිම විය යුතුය යන චින්තනයට දැඩි බාධාවක්ව පවතින දැනුමේ හිදැස ගැනද මෙහිදී අවධානය යොමු කළ යුතුය. රාජ්‍ය නිලධාරියෙකුගේ පරම වගකීමක් වන්නේ මේ දැනුමේ හිදැස පිරවීමට හැකි උපරිමයෙන් කටයුතු කිරීමයි. එක්තරා විදේශ රටක මහත්මයෙක් ලංකාවේ මහත්මයෙක් සමඟ කන්තලේ පහුකරගෙන හබරණ පැත්තට වාහනයකින් ගමන් කර තිබෙනවාලු. අතරමගදි අර විදේශිකයා අවට පෙන්නලා ඔබ මොනවද දකින්නෙ කියල ඇහුවලු. අපේ ලංකාවෙ මහත්මය, මම තණකොළ දකිනවා කීවලු. එතකොට අර විදේශිකයා ඉංග්‍රීසියෙන් කීවලු යූ සී ග්‍රාස් අයි සී ඩොලර් (ඔබ තණකොළ දකිද්දි මම ඩොලර් දකිනවා) කියල. සැබවින්ම ඒ සම්පත්වලින් පශු කර්මාන්තය හා කෘෂිකර්මාන්තය දියුණු කළොත් අපනයනය කළ හැකි මට්ටමේ නිෂ්පාදන සැකසිය හැකිවේ. ඒ බව තේරුම් ගත් සමහර ව්‍යවසායකයින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විශාල ව්‍යාපාරිකයින් බවට පත්ව ඇත්තේ මේ අවස්ථාවන් උකහා ගැනීමෙනි.

මා සේරුවිල පසුකර ත්‍රිකුණාමලයේ කෙළවර වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තෙක් ගමන් කරද්දී මග දෙපස ගහකොළ අඩු දැඩි කාෂ්ටක පෙදෙසක් හමුවේ. බොහෝ නිවෙස්වලට අඩුවක් නැතිව ලැබෙන්නේ හිරු රැස් පමණි. ආර්ථික ගැටලු එම නිවෙස්වල රජයනවාට සැක නැත. එම නිවාසවලට සූර්ය විදුලි පද්ධති සවිකළ හැකිනම් ඔවුන්ගේ විදුලිබිල පියවා ගැනීම මෙන්ම අතිරික්ත විදුලියෙන් ඔවුන්ට ආදායමක්ද උපයා ගත හැකිය. ඒ අවබෝධය ඔවුන් වෙත ලබා දීමේ කටයුතු දැනට සිදුවෙමින් පවතින අතර කාලයක් විවිධ ගැටුම්කාරී අත්දැකීම් ලද එම ජනතාව අපගේ ගැලවුම්කරුවාණන් අපම බව සිතන්නට අසීරුකමකින් පෙළෙන බවක්ද නිරීක්ෂණය වේ. එය ජය ගත හැක්කේ ඔවුන් වෙතින් සාර්ථක මිනිසුන් උපද්දවා ගැනීමෙනි.

ත්‍රිකුණාමලයේ දරුවන්ට විද්‍යා හා ගණිත උපකාරක පන්ති පහසුකම් නොමැතිබවට මහා මැසිවිල්ලකි. කතාව ඇත්තය. රටේ ජනප්‍රිය නමගිය ගුරුවරු ත්‍රිකුණාමලයේ නැත. නමුත් පවතින ඉතාම කාර්යක්ෂම බස් සේවා ප්‍රයෝජනයට ගනිමින් පැය තුනකට අඩු කාලයකින් ළමයින් කුරුණෑගලට ඇදෙති. රටෙහි ඉහළම උපකාරක පන්ති අවස්ථාව සපුරා ගනිති. විශ්ව විද්‍යාල ප්‍රවේශයේදී ලකුණු වාසියක්ද ලබා ගනිති. මේ සඳහා යම් ආර්ථික ශක්තියක් අවශ්‍ය බව සත්‍යයක් වුවද එය තිබෙන අයද මේ ආකාරයට සිතීමේ නොහැකියාවෙන් ජීවිත ගමනින් පසු බසින අතර එසේ සිතන දරුවන් වෛද්‍ය විද්‍යාල, ඉංජිනේරු පීඨ හෝ වෙනත් විශ්ව විද්‍යාලීය පීඨයන්ට සුදුසුකම් ලබති.

ත්‍රිකුණාමලයේ ජනතාව විශාල පිරිසකට සෑහෙන ඉඩක් සහිත ඉඩකඩම් ඇත. සමහර ඉඩම්වල නැති දෙයක් නොමැත. සමහරුන් සතිපතා දඹුල්ලට එළවලු එවති. නමුත් අවාසනාවන්ත සිද්ධිය වන්නේ සමහර ඉඩම් වසර විසි තිස් ගණන් තිස්සේ කිසිම සංවර්ධනයක් නොකර පැවතීමයි. එම පවුල් අදටත් රජයේ උදව් පතති. ගැටලුව පවතින්නේ සිතීමේ ක්‍රමය තුළ විනා වෙනත් දෙයක් නොවේ යැයි මා තර්ක කරන්නේ එවැනි සම තත්ත්වයේ ඉඩම්වල වගාවෙන් පමණක් නිර්මාණය වූ ධනවතුන්ගේ කුලීකරුවන් ලෙස එවැනිම ඉඩම් හිමි අය කටයුතු කිරීමයි.

මේ අනුව අප අවබෝධ කරගතයුතුම වූ සත්‍යය වන්නේ ප්‍රජාව සවි බල ගන්වමින් ජනතාව දියුණු කිරීමට නම් ඔවුන්ගේ ගැලවුම්කරුවා වෙන කාටත් වඩා ඔවුන්මය යන විශ්වාසය ඔවුන්ගේ සිත් තුළ තහවුරු කිරීමට කටයුතු කිරීමම වේ. මේ සිතීමේ වෙනස තුළ විශාල සමාජ පෙරළියක් සිදුකර ජනතාව නගා සිටුවීමේ ශක්තියක් මේ සුන්දර ලංකා භූමිතලය තුළ පවතින බව මාගේ ඒකායන විශ්වාසයයි.

# 03. A Social Revolution through New Thinking ……

Prof. M. Thilakasiri
Former Director-General, SLIDA
Senior Consultant, ADB, APO,
Chairman, Highflyer Global) Pvt) Ltd.

## Introduction

Social revolution is a profound transformation of a society's economic, political, and social structures, often driven by the population's shift of values, beliefs, and aspirations. A social revolution has become an urgent need in today's rapidly evolving global landscape. In recent years, "new thinking" has emerged as a powerful tool for driving positive social change. By challenging traditional assumptions and embracing innovative approaches, societies can foster transformations that are not only profound but also sustainable and equitable. This article delves into the concept of a social revolution driven by new thinking, exploring the significant shifts that can be accomplished through innovative new thinking processes. Employing new ways of thinking, societies can catalyze changes that are not only profound but also sustainable and equitable.

## Defining Social Revolution

A social revolution refers to a substantial change in how society's structures and institutions function, often leading to profound transformations in its laws, leadership, and economic systems. Unlike political revolutions, which may involve sudden violent upheavals, social revolutions are typically more gradual and aim to alter the social fabric of society to better align with contemporary values and needs.

## What is New Thinking?

New thinking involves a fundamental shift in how individuals and societies approach problems and opportunities. It encompasses a willingness to question established norms, consider alternative perspectives, and embrace creativity and innovation. In the context of social revolution, new thinking encourages a critical examination of existing systems and structures and the development of novel solutions to address societal challenges.

## The Significance of New Thinking

New thinking is significant because it has the potential to unlock new possibilities for social progress. By breaking free from the constraints of traditional thinking, individuals and societies can explore uncharted territories and discover innovative solutions to complex problems.

New thinking fosters a culture of adaptability and resilience, enabling societies to navigate the challenges of a rapidly changing world.

Moreover, new thinking is crucial for addressing complex modern challenges such as inequality, environmental degradation, and technological disruption. It fosters a more holistic understanding of problems and encourages solutions not confined by traditional boundaries

**The Role of New Thinking in Social Revolution**

New thinking in the context of social revolution involves a paradigm shift in how individuals and communities perceive and solve problems. At the heart of social revolution lies the concept of new thinking, which challenges conventional wisdom and encourages innovative approaches to longstanding issues. It advocates involves:

- Critical thinking: Questioning longstanding beliefs and practices.

- Creative solutions: Innovating beyond traditional methods.

- Inclusivity: Embracing diverse perspectives to enrich decision-making processes.

**Relevant Concepts and Approaches**

Several key concepts and approaches are relevant to the idea of a social revolution through new thinking:

**Systemic Thinking**

Systemic thinking involves understanding the interconnectedness of various elements within a system and how changes in one area can impact others. This approach encourages a holistic understanding of societal challenges and the development of comprehensive solutions.

**Design Thinking**

Design thinking is a human-centered approach to problem-solving that emphasizes empathy, creativity, and experimentation [5]. By focusing on individuals' needs and experiences, design thinking can lead to more effective and impactful solutions.

**Theory of Change:**

This framework helps organizations and communities plan and participate in social change by outlining necessary steps to achieve long-term goals.

### Collaborative Innovation

Collaborative innovation involves bringing together diverse stakeholders, including experts, practitioners, and community members, to develop and implement solutions to societal challenges collectively. This approach leverages a community's collective intelligence and resources to drive positive change.

### Strategies and Techniques

Several strategies and techniques can be employed to foster a social revolution through new thinking:

### Education and Awareness - Raising

Educating individuals about the importance of new thinking and its potential for driving social change is a crucial first step. This can involve incorporating new thinking concepts into educational curricula, organizing public awareness campaigns, and providing community leaders and activists with training and resources.

### Educational Reforms

Implementing curricula that foster critical and creative thinking skills from an early age

### Experimentation and Prototyping

Encouraging experimentation and prototyping can help individuals and organizations test and refine new ideas and approaches. Societies can accelerate developing and implementing practical solutions by creating safe spaces for innovation and learning from failures.

### Collaboration and Networking

Collaboration and networking among diverse stakeholders can help amplify the impact of new thinking initiatives. By connecting individuals and organizations working towards similar goals, societies can leverage their collective resources and expertise to drive more effective and sustainable change.

### Policy Innovation

Developing policies that encourage sustainable practices and technological innovation to tackle social issues.

### Community-based Initiatives

Empowering local communities to lead change efforts ensures that transformations are culturally relevant and widely supported.

## Benefits of a Social Revolution through New Thinking

The adoption of new thinking in driving social revolution offers several potential benefits, including:

- Increased innovation and creativity in addressing societal challenges

- Greater adaptability and resilience in the face of change

- More equitable and inclusive solutions that prioritize the needs of marginalized communities

- Stronger collaboration and community engagement in driving positive change

-Sustainable Development: Innovations in thinking can lead to more sustainable economic and environmental practices.

- Reduced Inequalities: A shift towards more inclusive social structures can help reduce social and economic disparities.

- Enhanced Community Engagement: New thinking encourages broader participation in democratic processes, strengthening civil society.

## Challenges of a Social Revolution

However, there are also several challenges associated with this approach, including:

- Resistance to change and the inertia of established systems and structures

Individuals and institutions often resist changes that threaten their power or way of life.

- Lack of resources and funding to support new thinking initiatives

Significant transformations require substantial resources, which may only sometimes be readily available.

- Difficulty in measuring and evaluating the impact of new thinking approaches

- Complex Implementation: Translating innovative ideas into practical actions can be challenging and require careful planning and adaptation

- Potential for unintended consequences and the need for ongoing monitoring and adjustment

-Complexity of Scale: Expanding successful small-scale innovations to a broader context can be complex and fraught with logistical challenges.

## Actionable Steps towards Positive Transformation

To foster a social revolution through new thinking, individuals and organizations can take several actionable steps:

1. Foster Multi-Stakeholder Partnerships: Collaboration between governments, the private sector, civil society, and academia can pool resources and knowledge for more effective outcomes.

2. Engage in critical self-reflection to identify and challenge their assumptions and biases.

3. Seek out diverse perspectives and engage in open and respectful dialogue with individuals with different views.

4. Experiment with new approaches and be willing to learn from failures and setbacks.

5. Collaborate with others who are committed to driving positive social change.

5. Advocate for policy changes that support and incentivize the adoption of new thinking approaches.

6. Invest in Technology and Infrastructure: Support technologies that facilitate social change, such as broadband internet and renewable energy sources.

7. Promote Continuous Learning: Encourage ongoing education and training programs to keep skills and knowledge relevant as society evolves.

8. Continuous Evaluation: Regular assessment of progress and obstacles helps refine strategies and maintain momentum towards achieving revolutionary change.

## Conclusion

In conclusion, the idea of a social revolution through new thinking offers a powerful framework for driving positive and sustainable change in society to address the multifaceted challenges of the modern world. By embracing innovative approaches, fostering collaboration and experimentation, and prioritizing the needs of marginalized communities, individuals and organizations can work towards a more just, equitable, and resilient world. While there are challenges to overcome, the potential benefits of this approach are immense, and the time to act is now. The journey toward a transformative social revolution is complex. It requires collective effort and persistence, but the potential rewards—sustainable development, reduced inequalities, and a more engaged society—are profoundly significant.

**References**

**Books**

1. Senge, P. M. (2006). The Fifth Discipline: The Art & Practice of The Learning Organisation. New York: Currency Doubleday.

2. Gladwell, M. (2000). The Tipping Point: How Little Things Can Make a Big Difference. Boston: Little, Brown and Company.

3. Kuhn, T. S. (2012). The Structure of Scientific Revolutions. Chicago: University of Chicago Press

**Journals**

4. Journal of Social Issues (2023)

5. Innovation: The European Journal of Social Science Research (2023).

6. American Journal of Sociology (2023).

**Articles**

7. Westley, F., & Antadze, N. (2010). "Making a Difference: Strategies for Scaling Social Innovation for Greater Impact." The Innovation Journal:

8. Meadows, D. H. (1999). "Leverage Points: Places to Intervene in a System." Solutions Journal, Vol. 1, No. 1.

9. Ganz, M. (2009). "Why David Sometimes Wins: Leadership, Organization, and Strategy in the California Farm Worker Movement." Oxford University Press, New York.

**Online Resources**

10. The Stanford Social Innovation Review (2023).

11. TED Talks on Social Innovation.

## 04. සමාජ යහපැවැත්ම ළගා කර ගැනීම උදෙසා කාන්තාව බලගන්වමු ......

ඩී.ඒ.පී. දාස්වත්ත
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ඕනෑම සමාජයක පැවැත්ම උදෙසා මානව ක්‍රියාකාරකම් බලපානු ලබයි. ධනාත්මක සමාජ ප්‍රගමනයක් උදෙසා යහපත් වූ මානව ක්‍රියාකාරකම් සංවර්ධනය ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකා සමාජය තුළ කාන්තාවගේ භූමිකාව ආර්ථික සමාජීය දේශපාලන මෙන්ම මානව විද්‍යාත්මකව ද ඉතා වැදගත් වේ. සමාජ යහපැවැත්ම උදෙසා සහ සාධාරණ සමාජයක් නිර්මාණය කිරීම උදෙසා කාන්තාවන් සවිබල ගැන්වීම අත්‍යවශ්‍ය වේ. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මූලික මානව අයිතිවාසිකමක් පමණක් නොව ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා පූර්ව අවශ්‍යතාවයකි. කාන්තා සවිබල ගැන්වීම යනු ඔවුන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට, තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට, සම්පත් සහ අවස්ථා ළඟාකර ගැනීමට, සහ ඔවුන්ගේ ජීවිත පාලනය කිරීමට, ඔවුනට අවස්ථාව උදාකර ලීමේ ක්‍රියාවලියයි. අප රටේ ක්‍රියාත්මක බොහෝ සංවිධාන සහ රජයන් කාන්තාව සවිබල ගැන්වීමේ වැදගත්කම හඳුනාගෙන ඇත. කාන්තාවන් සවිබල ගැන්වූ විට ඔවුන්ගේ පවුල්වලට, ප්‍රජාවට සහ ආර්ථිකයට වඩාත් ඵලදායි ලෙස දායක විය හැකිය. තිරසාර සංවර්ධනයේ දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය කෙරෙහි විශේෂ අවධානය යොමු කොට තිබේ. බොහෝ දෙනෙකුට ගෝලීය සංවර්ධන න්‍යාය පත්‍රයේ කාන්තා සවිබල ගැන්වීම තීරණාත්මක ප්‍රශ්නයක් වී ඇත. ආර්ථික, සමාජීය සහ දේශපාලන බලය කාන්තාවන් සවිබල ගැන්වීම සාක්ෂාත් කර ගැනීම සඳහා ඉතා වැදගත් වේ. මෙම ලිපිය කාන්තාවන් සවිබල ගැන්වීමට සහ ඔවුන්ගේ සමාජ යහපැවැත්ම වැඩිදියුණු කිරීමට විවිධ උපාය මාර්ග සහ මූලපිරිම් ගවේෂණය කරයි. මේ ඔස්සේ සමාජ වෙනසක් සඳහා කාන්තා බලසතුකරණයේ වැදගත්කම වෙත අවධානය යොමු කර ලීමට අපේක්ෂා කෙරේ. එසේම කාන්තා සවිබල ගැන්වීමට බාධා කරන විවිධ සාධක සහ සාර්ථක උපාය මාර්ග හඳුනා ගැනීම වර්තමාන සමාජ ආර්ථික පසුබිම තුළ අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව ඇති බව ද මතක් කරනු කැමැත්තෙමි.

කාන්තාවන් බල ගැන්වීමේදී විවිධ දෘෂ්ටිකෝණ ඔස්සේ සමාජ විද්‍යාඥයින් විසින් කාන්තාවගේ සමාජ තත්ත්වය විග්‍රහ කර ඇති ආකාරය විමසා බැලීම ඉතා වැදගත් වේ. මාක්ස්වාදීන්ට අනුව පීතෘ මූලික සමාජ ක්‍රමය නිසා පවුල තුළ කාන්තාව පීඩාවට සහ පුරුෂ ආධිපත්‍යයට ලක් වන බවට තර්ක කෙරේ. පවුල තුළින් කාන්තාව පුරුෂයාගේ පුද්ගලික ආධිපත්‍යයට ලක් කරන අතර මාක්ස්වාදි විග්‍රහය තුළින් තව දුරටත් පෙන්වා දෙන්නේ කාන්තාව ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය තුළ සූරාකෑමට ලක්වන තැනැත්තියක් බවයි. කාන්තාවගේ ගෘහස්ථ ශ්‍රමය සංවිධානය කරන මූලික ආයතනය පවුලයි. පවුල තුළ ඇය විසින් වැය කරන ශ්‍රමය ඵලදායි ශ්‍රමයක් නොවන බවත් ඒ තුළින් කාන්තාවගේ දියුණුවට බාධාවක් සිදුවන බවත් පෙන්වා දේ. පවුල තුළ ඇතිවන මෙම පීඩනයෙන් ඇය මුදවා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කිහිපයක්ද ඔවුන් විසින් පෙන්වා දෙනු ලබයි. කාන්තාවගේ ගෘහස්ථ ශ්‍රමයට වටිනාකමක් ලබාදීම, කාන්තාව බාහිර සමාජය සමග සම්බන්ධ කොට ඇයට සංවිධාන ගොඩනගා ගැනීමට අවස්ථාව ලබාදීම, පංති විඥානයක් ඇති කිරීම,

කාන්තාව සාමූහිකව හා සංවිධානාත්මකව පොදු කටයුතුවලට සම්බන්ධ කිරීම හා ඒ තුළින් අරගල කිරීමට හුරුවක් ලබාදීම, කාන්තාවන්ට මූල්‍යමය ස්වාධීනත්වයක් ලබාදීම එහිලා වැදගත් වන බවද පෙන්වා ඇත.

කාන්තා සවිබල ගැන්වීමේ සංකල්පයට දිගු ඉතිහාසයක් ඇත, එය 19 වන සියවසේ සිදුවූ මුල්ම ස්ත්‍රීවාදී චලනයන් දක්වා දිව යයි . ස්ත්‍රීවාදයේ පළමු රැල්ල කාන්තා දේශපාලනය, එනම් ඡන්ද අයිතිය වැනි අයිතිවාසිකම් කෙරෙහි අවධානය යොමු කළේය. 1960 සහ 1970 ගණන්වල ස්ත්‍රීවාදයේ දෙවන රැල්ල සමාන වැඩ සඳහා සමාන වැටුප් වැනි කාන්තාවන්ගේ සමාජ සහ ආර්ථික අයිතීන් කෙරෙහි අවධානය යොමු කරන ලදී. එසේම කාන්තාවන් සඳහා අධ්‍යාපන ප්‍රවේශය වෙතද මෙහිදී අවධානය යොමු කරන ලදි. 1990 ගණන්වල ඇතිවූ ස්ත්‍රීවාදයේ තුන්වන රැල්ල විවිධත්වය කෙරෙහි අවධානය යොමු කළේය.

මෙලෙස කාන්තා සවිබල ගැන්වීමේ සංකල්පය කාලයත් සමඟ විවිධ නිර්වචන සහිතව විකාශනය විය. ඉහත මූලික ප්‍රවේශ ඔස්සේ ආරම්භ වූ කාන්තා සවිබල ගැන්වීම විවිධ දිශානතීන් ඔස්සේ වර්තමානය දක්වාම සිදු වෙමින් පවතී. සාමාන්‍යයෙන් කාන්තා සවිබල ගැන්වීම යනු කාන්තාවන් සක්‍රීය කිරීමේ ක්‍රියාවලියයි. කාන්තාවන් සවිබල ගැන්වීමට ඔවුන්ගේ ආර්ථික, සමාජීය සහ දේශපාලනික ක්‍රියාවලින් ඇතුළත් වේ.

**ආර්ථික සවිබල ගැන්වීම යනු කාන්තාවන්ගේ සමාජ යහපැවැත්ම වැඩිදියුණු කිරීමේ වැදගත්ම මාර්ගයකි. අධ්‍යාපනය, රැකියා අවස්ථා සහ මූල්‍ය සම්පත් සඳහා කාන්තාවන්ට සමාන ප්‍රවේශයක් ඇති බව සහතික කිරීම ඉතා වැදගත් වේ. බාල වියේ සිටම ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ගැහැණු ළමයින්ට ප්‍රවේශය ලබා දීම මූලික වේ. උගත් කාන්තාවන්ට වඩා හොඳ රැකියා සුරක්ෂිත කිරීමට, ඉහළ ආදායම් උපයා ගැනීමට සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සක්‍රීයව සහභාගී වීමට අවකාශ සළසාලීම වැදගත් වේ. රැකියා වෙළඳපොළේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි වෘත්තීය සහ තාක්ෂණික පුහුණුව ලබා දීමෙන් කාන්තාවන්ට විවිධ වෘත්තීන් සඳහා අවශ්‍ය කුසලතා ලබා ගැනීමට උපකාර වන අතර එමඟින් ඔවුන්ගේ රැකියා නියුක්තිය වැඩිදියුණු වේ. සමාන වැඩ සඳහා සමාන වැටුප් සහතික කරන ප්‍රතිපත්ති බලාත්මක කිරීම සහ කුලියට ගැනීමේ පරිචයන් හි වෙනස්කම් ඉවත් කිරීම කාන්තාවන්ට ආර්ථික ස්වාධීනත්වය ළඟා කර ගැනීමට උපකාරී වේ. කාන්තාවන් සඳහා ක්ෂුද්‍ර ණය, ප්‍රදාන සහ ව්‍යාපාරික පුහුණුව ලබා දීමෙන් කාන්තා ව්‍යවසායකත්වය පෝෂණය කළ හැකිය. ආර්ථික වර්ධනයට සහ රැකියා උත්පාදනයට කාන්තා දායකත්වය ලබාගැනීමට හැකි වේ. කාන්තාවන්ට බැංකු සේවා, ණය සහ ඉතුරුම් ගිණුම් සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීම ඉතා වැදගත් වේ. මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් මගින් කාන්තාවන්ට තම මූල්‍ය කටයුතු ඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීමට අවස්ථාව ලබාදීම වැදගත් වේ.**

කාන්තාවන්ට තම ජීවිතයට සහ ප්‍රජාවට බලපාන තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි හඬක් නැගීමට දේශපාලන බලගැන්වීම අත්‍යවශ්‍ය වේ. දේශපාලන කාර්යයවල දී සහ තීරණ ගැනීමේ ආයතනවල කාන්තාවන් සඳහා කෝටා ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රමාණවත් නියෝජනයක් සහතික කළ හැකිය. දේශපාලනයේ යෙදෙන කාන්තාවන් සඳහා ජාල සහ සංසද පිහිටුවීම මගින් දේශපාලන ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය උපදේශනය, සහයෝගය සහ සම්පත් සැපයිය හැකිය. කාන්තාවන් බල ගැන්වීම උදෙසා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී නීති, කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කරන සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කරන නීති වෙනුවෙන් පෙනී සිටීම සහ ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. ගෘහස්ථ

ප්‍රචණ්ඩත්වය, ලිංගික හිංසනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කිරීම වැනි නීති මෙයට ඇතුළත් විය යුතුය. අප රටේ කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු පිළිබඳව දැනුවත් කිරීම සඳහා බිම් මට්ටමේ ව්‍යාපාර සහ රාජ්‍ය නොවන සංවිධාන ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

සාම්ප්‍රදායික සමාජ සම්මතයන්ට අභියෝග කිරීම උදෙසා කාන්තාවන් බල ගැන්වීම අත්‍යවශ්‍ය කරුණක් වන අතර මෙය සමාජ සවිබල ගැන්වීම ලෙස අර්ථ දක්වයි. ප්‍රජනක සෞඛ්‍ය සේවා ඇතුළුව දැරිය හැකි සහ ගුණාත්මක සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය කාන්තාවන්ට සහතික කිරීම ඔවුන්ගේ සමස්ත යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වේ. එමෙන්ම මානසික සෞඛ්‍ය සේවා සහ ආධාරක ජාලයන් සැපයීමෙන් කාන්තාවන්ට මානසික ආතතිය හා කම්පනයට මුහුණ දීමට උපකාර වන අතර එමඟින් සමස්ත සෞඛ්‍ය තත්ත්වය යහපත් කළ හැකිවේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන් සඳහා නවාතැන්, ක්ෂණික දුරකථන සහ උපදේශන සේවා ස්ථාපිත කිරීම අර්බුදයේ සිටින කාන්තාවන්ට තීරණාත්මක සහයක් ලබා දීම ද අත්‍යවශ්‍ය කරුණකි. කාන්තාවන් අතර නායකත්ව කුසලතා සහ සිවිල් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරන ප්‍රජා පාදක වැඩසටහන් මගින් ඔවුන්ගේ ප්‍රජාවන් තුළ ක්‍රියාකාරී භූමිකාවන් ගැනීමට ඔවුන්ව දිරිමත් කළ හැක.

කාන්තාවන් සඳහා තාක්ෂණික සවිබල ගැන්වීමද අත්‍යවශ්‍ය කරුණකි . තොරතුරු, අධ්‍යාපනය සහ ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ලබා දීමෙන් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා තාක්ෂණය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන් ඉදිරිපත් කිරීමෙන් කාන්තාවන්ට ඩිජිටල් ලෝකයේ සැරිසැරීමට අවශ්‍ය නිපුණතාවලින් සන්නද්ධ කළ හැකි අතර, ඔවුන්ගේ සේවා නියුක්තිය සහ තොරතුරු සඳහා ප්‍රවේශය වැඩි දියුණු කළ හැකිය. කාන්තාවන්ට ඩිජිටල් උපාංග වෙත ප්‍රවේශය ඇති බව සහතික කිරීම සහ ඩිජිටල් ආර්ථිකයට ඔවුන්ගේ සහභාගීත්වය ලබා ගැනීම සඳහා දැරිය හැකි අන්තර්ජාල පහසුකම් අත්‍යවශ්‍ය වේ. ඔන්ලයින් අධ්‍යාපන වේදිකා මගින් කාන්තාවන්ට නව කුසලතා ඉගෙන ගැනීමට සහ ඔවුන්ගේ අධ්‍යාපනය ඉදිරියට ගෙන යාමට අවස්ථාව ලබා දිය හැක. එසේම කාන්තා ව්‍යවසායකයින්ට සබැඳි වෙළඳපොළවල් භාවිතා කිරීමට සහාය වීම මගින් ඔවුන්ගේ ව්‍යාපාර නංවාලමින් පාරිභෝගික පදනම පුළුල් කළ හැකිය.

සමාජ ක්‍රමයේ විකාශයත් සමග විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කාන්තාවන් සවිබල ගැන්වීමේ ප්‍රතිඵල පහත ලෙස සාරාංශ ගත කළ හැකිය. කාන්තා දේශපාලන සවිබල ගැන්වීමට ලක් වන විට දේශපාලන බලය, ඔවුනට ලැබෙන විට ඔවුන් වැනි අනෙකුත් කාන්තාවන්ට වාසි වන ප්‍රතිපත්තිවලට ප්‍රමුඛත්වය දීමට වැඩි ඉඩක් ඇත. සෞඛ්‍ය හා අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර වල නායකත්ව භූමිකාවන්හි සිටින කාන්තාවන් තීරණ ගැනීමේදි කාන්තාවන් වෙත අවධානය යොමු කිරීමක් සිදුවේ.

**තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී කාන්තා සවිබල ගැන්වීමේ වැදගත්කම**

තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කාන්තා සවිබල ගැන්වීම ඉතා වැදගත් වේ දරිද්‍රතාවය අඩු කිරීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ගොඩනැංවීම, ආර්ථික වර්ධනය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම, මාතෘ මරණ ළමා මරණ අඩු කිරීම, ළමා සෞඛ්‍යය වැඩි දියුණු කිරීම වැනි වඩා හොඳ සෞඛ්‍ය ප්‍රතිඵල ළඟාකර ගැනීමට, සංවර්ධන ඉලක්ක ළගාකර ගැනීම පහසු කර ලීමට, හා තිරසරභාවය

ඇති කරලීමට කාන්තාව සවිබල ගැන්වීම තුළින් හැකියාව ලැබේ. විශේෂයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලියන්හි කාන්තාවන්ගේ සහභාගීත්වය ඉහළ යාම පාලනය සහ සමාජ සාධාරණත්වය වැඩි කිරීම සඳහා ද හේතු වේ. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම, විශේෂයෙන් ඉලක්ක 5, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම අරමුණු කරයි.

කාන්තාවන් බලගැන්වීම සම්බන්ධයෙන් රජය, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය විසින් ඉටු කළ යුතු තීරණාත්මක කාර්යභාරයක් පවතී. මෙම සියලු අංශ ඒකාබද්ධව කටයුතු කිරීම මෙහිදී ඉතා වැදගත් වේ. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට, කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කරන නීති ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය අංශයට හැකියාව පවතී. කාන්තාවන්ට අධ්‍යාපනය හා පුහුණුව ලබාදීම, සෞඛ්‍ය සේවා සහ ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ලබා දීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටීමට, රැකියා ස්ථාන වල සමානාත්මතාවය, කාන්තාවන්ට සමාන වැටුප් සහ වෘත්තීය අවස්ථා ලබා දීම, සහ කාන්තාවන් විසින් මෙහෙයවන ව්‍යාපාර සඳහා ආයෝජන අවස්ථා ලබාදීම වැනි කාර්යයන් කිරීමට රාජ්‍ය නොවන සංවිධාන වලට හැකියාව පවති. වඩාත් සාධාරණ සහ සාධාරණ ලෝකයක් නිර්මාණය කිරීම සඳහා කාන්තා සවිබල ගැන්වීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, සමහර ක්ෂේත්‍රවල ප්‍රගතිය තිබියදීත්, කාන්තාවන් තවමත් අභියෝග රැසකට මුහුණ දෙයි. ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ වෙනස්කම් , ප්‍රචණ්ඩත්වය සහ සම්පත් බෙදීයාමේ අසමාන ප්‍රවේශය මෙහිලා සුවිශේෂී වේ.

අවසාන වශයෙන්, කාන්තාව සවිබල ගැන්වීම යනු පවුලක් සමාජයක් බලගැන්වීම දක්වා දිවෙන දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක් වශයෙන් හඳුන්වාදිය හැකි අතර ඒ සඳහා හැකි ශක්ති ප්‍රමාණයෙන් දායක වීම ඔබ අප සියලු දෙනාගේ සමාජ වගකීමක් වනු ඇත.

ආශ්‍රිත ග්‍රන්ථ


- Reshi, I. A., & Sudha, T. (2021). The Self-Help Group movement has made great strides in the field of women's empowerment. Turkish Online Journal of Qualitative Inquiry, 12(7).

- Reshi, I. A. (2023). WOMEN'S SELF-HELP GROUPS-ROLE IN POVERTY NEXUS AND EMPOWERMENT. International Journal of Economic, Business, Accounting, Agriculture Management and Sharia Administration (IJEBAS), 3(1), 79-84.

# 05. සංවර්ධනයට නව චින්තනයක් ……

කුමාරි ජයසේකර

විශ්‍රාමික ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරී

ලෝකයෙහි කිසිදිනක "නව චින්තනයක්" නොවූවේය. සිදුවූයේ, සදාකාලිකව පැවැතියාවූ විශ්වීය ප්‍රඥාව, විවිධ යුගයන්හිදී, විවිධ මානයන්ගෙන් ප්‍රකාශිත වීමයි. පැවැත්ම සඳහා වූ ජීවන අරගලයන්හිදී ද, නොපැවැත්ම වූ සඳහා වූ ආධ්‍යාත්මික ගවේෂණයන්හිදී ද, විවිධ වූ චින්තකයන්, ප්‍රබල වූ මතවාදයන් තුළින්, ප්‍රජාවන් වෙත මඟ පෙන්වීම් සිදුකලාහුය. අනුගාමිකයන් විසින් එම චින්තනයක් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තුළින් සමාජ පෙරළියන් සිදුවූ ආකාරයන් ලෝක ඉතිහාසය පුරාවට සටහන්ව ඇත. රතු ඉන්දියානුවන්, ඇබොරිජින්වරුන්, මෞරිවරුන් වැනි පැරණි ගොත්‍රිකයන් සිය ශිල්පීය ඥානය විකාශනය කළේ පරිසරය ආත්මය කර ගනිමිනි. ආයුර්වේදය, වානේ කර්මාන්තය, ශිලාමය ශිල්පය හා ජල කළමනාකරණයෙහි නිපුණවූ අපේ පැරණි රජසමය බුදුසමය පදනම් කරගත් චින්තන රටාවක් තුළ ප්‍රජාව පවත්වා ගත්තෝය.

සුදු අධිරාජ්‍යවාදීහු එවැනි ස්වයංපෝෂිත අර්ථක්‍රමයන් බිඳ දමා සිය ග්‍රහණයට නතු කරගැනීම සඳහා දීර්ඝකාලීනව පවත්නාවූ උපායමාර්ග යොදාගෙන ඇති ආකාරය බොහෝ රටවලදී දුටුවෙමි. ඈත පෙරදිග නවසීලන්ත කෞතුකාගාරයකදී අපගේ උඩරට ගිවිසුම වැනිම වූ ව්‍යාජ භූමි සිතියමක් හා ව්‍යාජ ගිවිසුමක් ප්‍රදර්ශනයට තබා තිබෙනු දැක තිගැස්සී ගියෙමි. ඉංග්‍රීසි බසින් ඉගෙනුම ලැබුවද මෞරි ගෝත්‍රයෙන් එන ශිෂ්‍යයෝ උපාධි ගිවිසුම් පාඨය විදේශ භාෂාවකින් කියවීම ප්‍රතික්ෂේප කර, සිය මව් බසින් ප්‍රතිඥා දෙනු අසා සිටියෙමි.

විදේශීය ආක්‍රමණයන් නිසා ගිලන්ව ගිය ස්වදේශීය චින්තනයන්, නිදහස ලැබූ පසු ක්‍රියාත්මක වූ ආකාරයන් පිළිබඳ අපගේ කලාපීය අත්දැකීම්, අතිශයින් විවිධය. අධ්‍යයනය හා පර්යේෂණය සඳහා අගනේය. කාර්මික විප්ලවය නිසිසේ මෙහෙයවූ ඇතැම් ආසියානු දේශයන් අනන්‍ය වූ ශිල්පීය කුසලතාවයන් ගොඩනගමින් සංවර්ධනය වෙද්දී, ගිජුබව හා බහු භාණ්ඩ සංස්කෘතික රටාවන් තුළ අපේ දේශය මංමුලාවූ ආකාරය ඛේදනීයය.

තිරසර දිශානතියක් දක්වන්නාවූ ප්‍රජා ශක්ති - ක්‍රමවේදයන් බලගැන්වීම යුග මෙහෙවරක් වන්නේ එබැවිනි. අප කලාපයේ රටවල ග්‍රාම සංවර්ධන ප්‍රවේශයන් සිදුවූ ආකාරයන් අධ්‍යයනය සඳහා ද, පර්යේෂණය සඳහා ද, අගනා මූලාශ්‍ර සපයයි. විවිධ ඵලදායී ක්‍රමවේදයන් ශ්‍රී ලාංකිකත්වයට ගැලපෙන අයුරින් දේශීයකරණය කර භාවිතයට ගත් අවස්ථා මෑතකාලීන ග්‍රාම සංවර්ධන ඉතිහාසය තුළ දක්නට

ලැබේ. සිද්ධි අධ්‍යයනයන් තුළින් සාර්ථක මෙහෙයුම් හඳුනාගෙන වැඩි දියුණු කිරීම හා ව්‍යාප්ත කිරීම කාලීන අවශ්‍යතාවයක් ලෙස දකින්නෙමි.

සිද්ධි අධ්‍යයන වටිනාකමකින් යුතු, සමාජ පෙරළියක් සිදුකළ කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියක් උතුරු මැද පළාතේදී දුටුවෙමි. ආන්තිය දරිද්‍රතාවය හා ඉවසිය නොහැකි කුසගින්න, හොරොව්පතානෙහි ගම්වැසියන් සියදිවි නසාගැනීමට පෙළඹවූ අතීතයක් තිබූ බව ලේඛනගතය. වාර්ගික අර්බුද සමයෙහි මායිම් ගම්මානයක්වූ පරංගියාවාඩියෙහි වත්මන් වැඩිහිටි ප්‍රජාව දුගීබව නිසා ළමාවිය හා අධ්‍යාපනයද, යුද්ධය නිසා යොවුන් වියද අහිමි වූවෝය. තරුණවිය අගල් තුළ ගෙවූ, සොහොයුරන්, පියවරුන්, හිමිවරුන් අහිමි වූ ඔවුහු යකඩ ගැහැනුන් ලෙස බලගැන්වී ඇත්තේ උපුල්විල කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය නමින් ඒකරාශී වෙමිනි. අද මෙම ගමේ සියලු නිවාස ස්ථිරය. හැම නිවසකම කෘෂි වාහනයක්, යතුරු පැදියක් හෝ ත්‍රිරෝද රථයක් ඇත. සියලු දරුවන් පාසැල් යන අතර අධ්‍යාපන ශිෂ්‍යත්ව දරන්නෝය. ගමෙහි සියලුම දරුවෝ ළමා ඉතුරුම් ගිණුම් හිමියෝය. උපුලියන්ගෙ සමිතියද බොහෝ වත්කම් දරයි. ධාන්‍ය ගබඩා, ඇඹරුම්හලක් හා තවත් ආදායම් උපයන ක්‍රම සහිත මෙම සමිතිය බස් රථයක් මිලදී ගැනීමට බස් ගිණුමක් අරඹා තිබේ. ඔවුන්ගේ ව්‍යවස්ථාව, බැංකු ක්‍රම, විගණන ක්‍රම අනන්‍යය. මෙම සාමූහිකත්වය තුළ දූප්පතුන් නොමැති, විනයගරුක ගම්මානයක් ගොඩනැගී ඇත. රජයෙන් කිසිවක් අනවශ්‍ය බවද, දැනුම ලබාදෙන්නේ නම් එපමණක් පිළිගන්නා බවද ඔවුන් විසින් මා හට පවසන ලදි. මගේ හතලිස් දෙවසරක රාජ්‍ය සේවය තුළ එවැන්නක් ඇසූ එකම තැන, මෙම උපුල්විල ගම්මානයයි. මෙම ක්‍රියාන්විතය අභ්‍යාසය හා පර්යේෂණය සඳහා උචිත නොවන්නේද ?.

ගම්මට්ටමින් දියත්වන විවිධ අධ්‍යයන පාඨමාලාවන් NVQ තත්ත්ව මට්ටමේ පවතින බව මිහින්තලයේදී දැකගත හැකි විය. මෙය අගනුවරදී ගිවිසුමක් අත්සන් තබමින් කළ ප්‍රතිපත්ති සැලසුමකදී දුටු එම සිහිනය සැබෑ වී ඇති අයුරු ඇත මිහින්තලේ සිට දකිමින්, අපරිමිත සතුටක් අත්වින්දෙමි. ගම් මට්ටමේ ක්ෂේත්‍ර නිලධාරීන් හා ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන් ධනාත්මකව අභිප්‍රේරණය කරමින්, ගෝලීය අර්ථක්‍රමය තුළ ස්ථාවර ප්‍රජාවක් ස්ථාපනය සඳහා , මැනිය හැකිවූ කාර්යසාධන ඉලක්ක පිහිටුවිය යුතුය. අද අපේ දේශය ප්‍රජා ශක්තියෙන් බලගැන්වීම සඳහා අවශ්‍ය වන්නේ, ආගන්තුක චින්තනයක් නොව අප විසින්ම නොසලකා හරින ලද, සාරධර්මයන් හා වෘත්තීය ආචාරධර්මයන් පදනම් කරගත් තාක්ෂණික ශිල්පීය ඥානයයි. සම්ප්‍රදායික ක්‍රමෝපායන් තිරසාර වන්නේ, ඒවා පරිසරය හා සමතුලිතතාව රැකගන්නා දිගුකාලීන ක්‍රියාන්විතයන් බැවිනි. එවන් වූ මාවතක ගමනක් සඳහා දූරදර්ශීබව, කැපවීම හා ප්‍රඥාව අවශ්‍ය වෙයි. වෙහෙසකර ගමනක් අවසානයේ සංවර්ධනයෙහි ප්‍රතිලාභ සමස්ත ප්‍රජාවටම උරුම වෙයි. ක්ෂණික ප්‍රතිඵලයන්, අධිවේගී ප්‍රතිලාභයන් පිළිබඳ මවාපෑම් තුළින්, විදෙස් වෙළෙඳපොළක ගොදුරු බවට පත්වී ඇති අපේ දේශය ගොඩනැංවීම පිණිස බහුවිධ කුසලතා බලගන්වන්නාවූ මෙහෙයුම් දියත් කළ යුත්තේ අප විසින්මය.

# 06. නව චින්තනය තුළින් සමාජ පෙරළියක් උදෙසා බලපාන ප්‍රධාන සාධක .....

මහාචාර්ය කපිල ගාමිණී ප්‍රේමතිලක

ඌව විශ්වවිද්‍යාලය

බදුල්ල

අප රට නිදහස ලබා වසර 75 ක් ද ඉක්මවා ගොස් ඇතත් ජනතාවගේ සුභ සිද්ධිය පිණිස වූ රටේ සංවර්ධන කටයුතුවල ප්‍රගතියක් දක්නට හැක්කේ ඉතා අල්ප වශයෙනි එමෙන්ම එකී කටයුතු සිදුවනුයේ ඉතාම ඉබි ගමනේය. මෙයට පාදක වී ඇති හේතූන් හා දුර්වලතාවයන් පිළිබඳව අප සැමටම මනා අවබෝධයක් ඇතත් ඒවාට පිළියම් යෙදීමක් දැකිය හැක්කේ ඉතා මන්දගාමීවය. ජාතියක් වශයෙන් අපගේ චින්තන රටාවෙහි සැලකිය යුතු ආකාරයේ වෙනසක් මෙතෙක් දක්නට නොලැබීම මීට පාදක වී ඇති ප්‍රධාන සාධකයක් සේ දැක්විය හැක.

**අධ්‍යාපනය**

ලොව විවිධ රටවල වේගවත් සංවර්ධනයට ඉමහත් ලෙස දායක වී ඇති මූලික සාධකය වී ඇත්තේ ඒ ඒ රටවල හඳුන්වා දී ඇති පාසැල් අධ්‍යාපන ක්‍රමවේදයන්ය. මේ අතරින් ළමාවිය අධ්‍යාපනය හා පාසැල් අධ්‍යාපනය ඵළදායී ලෙස යොදා ගැනීම එම රටවල ඉතා ප්‍රශස්ථ අන්දමින් සිදුව තිබේ. අධ්‍යාපනය මූලික වශයෙන් ඇනුම වර්ධනය, කුසලතා වර්ධනය හා යහපත් ආකල්ප ගොඩනැගීම යන තෙකුලුනු පදනම් කරගෙන ගොඩනැංවිය යුතුය. මෙරට ක්‍රියාත්මකව පවතින පොතපත කටපාඩම් කිරීම හා විභාගවලට පෙනීසිටීම යන ක්‍රියා දාමයකින් පමණක් මෙම අරමුණු සපුරා ගැනීමට නොහැකි වේ.

**විනයගරුක හා සදාචාර සම්පන්න දරුවකු බිහිකිරීම**

ඕනෑම සමාජයක් තුළ යහපත් ආකල්ප ගොඩනැගී තිබීම ඒම රටෙහි සංවර්ධනය උදෙසා ප්‍රධාන වශයෙන් ඉවහල් වේ. නූතන සමාජයේ දරුවන් ඔවුන්ගේ වැඩිහිටියන් තුළ පෙර සිට ආගමික මුහුණුවරයෙන් පැවතගෙන එන ගුණදම් වලින් පෝෂණය වී ඇති දැයි සැක සහිතය. වැඩිහිටියන්ට හා ගුරුවරුන්ට ගරුකිරීම සවන් දීම පරාර්ථකාමී බව අන්‍යයන්ට උදව්උපකාර කිරීම වැනි උසස් ගුණධර්ම සමාජයෙන් ක්‍රමයෙන් බැහැරවන ලකුණු පෙනේ. සුභාෂිතය, ලෝකෝපකාරය, ලෝවැඩ සඟරාව වැනි ග්‍රන්ථ තුළින් එකල සමාජය මේවා පිළිබඳව දැන්වත් වුනි. ජපානය වැනි රටවල දරුවන් තුළ මෙවැනි යහපත් ආකල්ප සංවර්ධනය ඉතා කුඩා අවදියේ සිටම ලබාදේ. ඒ මඟින් ඔවුන් ළමාවියේදී සිටම රටට වැඩදායී සමාජශීලී පුද්ගලයින් බවට පත් වේ. අන්‍යයන්ට උදව්උපකාර කිරිම ඔවුන් විසින් සිදුකල යුතු විශාල යුතුකමක් සේ සලකති.

තම අවට පරිසරය රැකගැනීම කාලීන වශයෙන් වැදගත්වන එමෙන්ම කුඩා අවධියේ සිටම පුරුදු පුහුණු කළ යුතු තවත් වැදගත්වන කටයුත්තකි. අද කෙතරම් දැනුවත් කළද කුණුකසල සැම තැනකටම බැහැර කිරීම මෙන්ම බස් රථ තුළ අපිරිසිදු කිරිම ආදිය තවදුරටත් සිදුවෙමින් පවතී. ඒ නිසා මෙවැනි කාරණා පිළිබඳව

ළමා අවධියේම දැනුවත් කිරිම ඉතා වැදගත්වේ. ජපානය විසින් ලොවටම හඳුන්වා දුන් 5S (5 එස් ) ක්‍රමය එරට ප්‍රචලිත වී ඇත්තේ මුලින්ම දරුවන් තුළට එම සංකල්පය ක්‍රමක් ක්‍රමයෙන් ඒත්තු ගැන්වීම තුළිනි. අප අවට පරිසරයේ පවිත්‍රතාව පිළිබඳව විශේෂ උනන්දුවක් අප සමාජය තුළ පැවතියේ නම් පසුගිය දිනක මහනුවර දුම්රිය ස්ථානය අසල විදේශික සංචාරකයින් පිරිසක් විසින් පිරිසිදු කිරීම වැනි සිදුවීමක් අසන්නට නොලැබීමට ඉඩ තිබුණි. කෙසේ වෙතත් ඊට පසු දිනක මහනුවර වැව රවුමෙහි කිසියම් සංවිධානයක් විසින් කුණු කසල එකතු කරනු දක්නට ලැබීම ඉතා සුභදායී මෙන්ම අගය කළ යුතු සිද්ධියකි. ශ්‍රී පාදය වැනි ස්ථානවලද මෙවැනි පවිත්‍ර කිරීම් කටයුතුවල විවිධ කණ්ඩායම් නිරතවීමද අසන්නට ලැබේ. පාසැලේදී ඉවත් කළ යුතු අපද්‍රව්‍ය තම බෑගයේ දමා නිවසටම ගෙනවිත් බැහැර කිරීම වැනි සුභදායී ප්‍රවෘත්ති ද මේ අතර ඇතැම් පාසැල් වලින් අසන්නට ලැබේ. මෙවැනි යහපත් කටයුතු සමාජය විසින් ඉහළින් අගය කළ යුතු නමුත් ජනමාධ්‍යයේ පවා ඒවාට එතරම් ප්‍රමුඛත්වයක් නොලැබේ. එවැනි අගයකිරීම් තුළින් ඔවුන් තවදුරටත් මෙම කටයුතුවලට උද්‍යෝගීව පෙළඹේ.

**සහජ කුසලතා මතුකර ගැනීම**

දරුවන් හට සිය අනාගතය සකසා ගැනීම සඳහා සුදුසුම ආකාරය වන්නේ ඔවුන්ගේ සහජ කුසලතා කවරේදැයි මුල් අවධියේම හඳුනාගෙන ඒ ඔස්සේ නිසි අධ්‍යාපනයක් ලබාදීමයි. කිසියම් අසතුටකින් යම් යම් ක්ෂේත්‍ර සඳහා ඔවුන් යොමු වුවහොත් එහි ප්‍රතිඵලය වන්නේ අතර මඟදී අධ්‍යාපනය අතහැර යාම හෝ අදාළ විභාග අසමත් වීමය. අද විශ්වවිද්‍යාලයට ඇතුළුවන ඇතැම් ශිෂ්‍යයන්ද ඉහළ ලකුණු මත පදනම්ව එහෙත් කුසලතා පදනමකින් තොරව තමාට ආගන්තුක වූ පාඨමාලා හදාරන්නේ ඉතා අවිනිශ්චිත මානසිකත්වයකිනි. අප දැන් දෙදහස් සහස්‍රයේ දෙවන දශකයද ගතකරමින් සිටියත් එමෙන්ම ලෝකය සමඟ ඉතා පුළුල් ලෙස ගනුදෙනු කළ හැකි වටපිටාවක් පැවතියත් තවමත් බොහෝ දෙමාපියන්ගේ ආකල්ප ලෙස පවතින්නේ තම දරුවා බටහිර වෛද්‍යවරයකු හෝ ඉන්ජිනේරුවරයකු කරවීමට පමණි. එහෙත් අද ලොව ඉතා පුළුල් පරාසයකට විහිදුනු ක්ෂේත්‍ර ගණනාවක රැකියා අවස්ථා බිහිවී තිබෙන අතර ලොව විශිෂ්ඨයින් බිහිවී ඇත්තේද එකී විවිධ ක්ෂේත්‍රවලින් බව ඔවුන් සිහි තබාගත යුතුය. එබැවින් එවැනි සහජ කුසලතාවක් හා හැකියාවන් උපයෝගී කරගනිමින් ඔවුනට නිසි අධ්‍යාපනයක් ලබා දී ඒ තුළින් සිය අනාගත ජීවන මඟ සාර්ථකකර ගැනීමට පියවර ගත යුතුය. කෙසේ නමුත් මෙය දෙමාපියන්ගේ චින්තනීය වෙනසක් තුළින් පමණක් ක්‍රියාත්මක කිරිම අපහසුය. ඒ සඳහා රටේ අධ්‍යාපන ප්‍රතිපත්ති තුළින් ද අදාළ ක්‍රියා මාර්ග ගත යුතුය.

**ව්‍යවසායකත්වය**

නවීන ලෝකයේ ඒ ඒ රටවල් තම සංවර්ධනය සඳහා ප්‍රමුඛතම මෙවලම ලෙස යොදාගෙන ඇත්තේ ව්‍යවසායකත්වය ගොඩනැංවීමයි. ව්‍යවසායකත්වය යනු තනි තනිව කිසියම් ව්‍යාපාරයක් සඳහා ආයෝජනය කර මුදල් ඉපයීම ලෙස අර්ථකථනය කිරීමට බොහෝ දෙනෙකු පෙළඹී ඇත. එහෙත් එහි නියම අරුත නම් සුපුරුදු රාමුවෙන් පිටතට පැමිණ සිතීම (Out of box thinking) තුළින් මෙන්ම සිය නිර්මාණශීලිත්වය උපයෝගී කරගනිමින් නව්‍යතාවයකින් යුතු යම්කිසි භාණ්ඩයක් නිෂ්පාදනය කර හෝ යම් සේවාවක් පාරිභෝගිකයා හට නොකඩවා සැපයිම හා ඒ තුළින් වෙනත් පිරිසකට යම් රැකියා අවස්ථා ප්‍රමාණයක්ද බිහි කිරීමට හැකිවන ආකාරයේ පුළුල් ක්‍රියාදාමයකි. සිය සහජ හැකියාවන් ප්‍රදර්ශනය කරමින් ඉතා සුළු පිරිසක් පමණක් වර්තමානයේ මෙලෙස ව්‍යවසායකයින් බවට පත්ව ඇත. එම සංඛ්‍යාව මෙරට

ජනගහනයෙන් 1% ටද වඩා අඩුය. එහෙත් ජපානය වැනි රටවල ජනගහනයෙන් 25% ක පමණ ප්‍රතිශතයක් ව්‍යවසායකයින් ලෙස කටයුතු කරමින් විදේශ විනිමය ඉපයීම මෙන්ම එමගින් විශාල පිරිසකට රැකියා අවස්ථා බිහිකිරීමටද සමත්වී ඇත. එසේම දකුණු කොරියාව වැනි රටවල විශ්වවිද්‍යාල මඟින් වසරකට නව නිශ්පාදන සඳහා පේටන්ට් බලපත් 300-400 ක් පමණ ලබාගන්නා බව වාර්තා වේ. කෙසේ වෙතත් මෙරටද ව්‍යවසායකයින් බිහි කිරීම සඳහා විශ්ව විද්‍යාල තුළින් දැනුම හා තාක්ෂණය ලබාදීම ඇතුලත්ව විවිධ පියවර දැනටමත් ගෙන තිබීම සතුටට කරුණකි. විශේෂයෙන්ම යම් නිශ්පාදන සඳහා අගය එකතු කිරීම (Value Addition) තුළින් භාණ්ඩ හා සේවා සඳහා වැඩි ආකර්ෂණයක් දේශීය හා විදේශීය වෙළඳපල තුළ නිර්මාණය කළ හැක. මෑතකදී ඌව විශ්වවිද්‍යාලයෙහි උපාධිධාරිනියක ආටිසන් තේ (Artisan Tea) නමින් නව අගය එකතු කළ (Value Added) නිෂ්පාදනයක් විදේශ වෙළඳපලට ඉදිරිපත් කරමින් විදේශ විනිමය උපයමින් සිටින අතර, ඇය තම ඉදිරි ජීවන වෘත්තීය ලෙසද එයම තෝරා ගෙන තිබේ. බලංගොඩ ප්‍රදේශයේ වෛද්‍යවරියක් වැනිලා වගාවක් පවත්වාගෙන යමින් එමඟින් රූපලාවන්‍ය සඳහා යොදා ගතහැකි නිෂ්පාදන කීපයක් හඳුන්වා දෙමින් කාන්තාවන් රාශියකට රැකියා අවස්ථාද සම්පාදනය කර දී තිබේ. මහනුවර ප්‍රදේශයෙන් වාර්තා වී ඇති මෙවැනි ව්‍යවසායකයන් ලෙස ආචාර්ය සරත් රණවීර විසින් ආරම්භ කොට තිබෙන ‘Bio Food’ ව්‍යාපෘතිය මඟින් විදේශ වෙළඳපලට කාබනික ලෙස වගාකළ ආහාර නිෂ්පාදන සැපයීම සඳහන් සඳහන් කළ හැක. පිළිමතලාවේ ආචාර්ය නිමල් බණ්ඩාර විසින් බෝග පළිබෝධ පාලනය සඳහා කොහොඹ බීජ නිස්සාරකයක් (Neem extract) ද පළතුරු මැස්සාගෙන් වන පළතුරු හානිය ජීව විද්‍යාත්මක ලෙස වලක්වා ගැනීම සඳහා වූ දේශීය ඇමක් (Bait) වෙළඳපලට හඳුන්වා දී තිබේ. තවද, හල්ලොලුවේ මහාචාර්ය ජයන්ත රාජපක්ෂ විසින් පිළිකා රෝගීන්ගේ පිළිකා සෛල වැඩීම පාලනය කරන කරවිල බීජ ආශ්‍රිත ඖෂධයක් වසර ගණනාවක පර්යේෂණ ආශ්‍රයෙන් නිපදවා තිබේ. මේවා දේශීයව බිහිවූ නව ව්‍යවසායයන් වේ.

තවද භාණ්ඩ හා සේවා පදනමකින්ම නොව කලාව සාහිත්‍යය වැනි සමාජයේ වැදගත් ස්ථානයක් හිමිවන ක්ෂේත්‍ර තුළින්ද ව්‍යවසායකත්වය ගොඩනගා ගතහැක. එම ක්ෂේත්‍ර සඳහා සහජමය හැකියාවන් ඇති පුද්ගලයින් හට ග්‍රන්ථකරණයෙන්, නාට්‍ය කලාවෙන්, සංගීත මාධ්‍යයෙන් හෝ මාධ්‍ය කලාව ආදියෙන්ද ඉදිරියට පැමිණ ව්‍යවසායකයින් ලෙස සිය ජීවන මඟ සකසා ගැනීමට වර්තමානයේ පහසුකම් බහුලව පවතී. මහනුවර මහමායා විද්‍යාලයේ ආචාර්යවරයකු වන සෙනෙවිරත්න මහතා විසින් නව චින්තනයක් ඔස්සේ 2014 සිට දියත් කර ඇති ‘මහනුවරින් අංකුර සාහිත්‍ය කරුවන් බිහිකිරීමේ ව්‍යාපෘතිය’ තුළින් මේ වනවිට දිවයිනේම 41,000ක් පාසැල් දරුවන් ග්‍රන්ථකරණය සඳහා යොමුකොට ඇත. ඒ අනුව පුෂ්පදාන විද්‍යාලයේ ප්‍රතිභා නිර්මාණී දියණිය විසින් 8 වසරේ සිට ප්‍රගුණ කරගත් තම ලිවීමේ හැකියාව 2024 වසරේදී ළමා කෘති දෙකක් එළිදැක්වීමෙන් තව දුරටත් ප්‍රදර්ශනය කර තිබේ. සාර්ථක ආරම්භයක් සමඟින් ඉදිරියට පැමිණ සිටින මෙවැනි දරුවන්ට එම ක්ෂේත්‍රයේම විශිෂ්ටයකු බවට පත්වීමට සුදුසු ගමන් මඟක් සැලසී ඇත.

**නවීකරණ කෘෂිකර්මය හඳුන්වා දීම**

වර්තමාන සමාජයේ දක්නට ලැබෙන සුලභ සංසිද්ධියක් වී ඇත්තේ ග්‍රාමීය කෘෂිකර්මයෙන් නව පරපුර ඈත්වී යාමයි. වෙනත් ක්ෂේත්‍රයකට යොමුවීමට නොහැකි වූ පිරිසක් පමණක් අවසානයේ ගමට සීමාවී කෘෂිකර්මයේ නිරත වෙති. මොවුන් සඳහා සමාජයේ පිළිගැනීමක්ද ඉතා අවම තලයක පැවතිමද විශාල

සමාජ ගැටළුවකි. එසේම කෘෂිකර්ම කටයුතු සඳහා අවශ්‍ය යෙදවුම් සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීම හා ශ්‍රම හිඟතාවය ආදී හේතූන් නිසාද බොහෝ දෙනෙක් කෘෂිකර්මයෙන් ඈත්වීමට පෙළඹේ. විශේෂයෙන්ම කුඹුරු ගොවිතැන ආදිය අද නවීන පරපුරට අධික වෙහෙසකාරී කටයුත්තක් ලෙස පෙනී යන බැවින් මෙන්ම ලාභදායී නොවන ආයෝජනයක් ලෙස හැගෙන බැවින් එයින් ඈතිව සිටී. එනිසා මෙවැනි ගැටළු සඳහා අවශ්‍ය පිළියම් යෙදිය යුතුව තිබේ. කෘෂිකාර්මික කටයුතු සඳහා යාන්ත්‍රීකරණය සමඟ නව තාක්ෂණය වැඩි වැඩියෙන් හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම තුළින් මෙම ගැටළුවට යම් ආකාරයකින් පිළියම් යෙදීමට හැකි වේ. ඒ සඳහා රාජ්‍ය අනුගහය ලබාදීම විශේෂයන්ම අත්‍යාවශ්‍ය වේ.

**දුර්වල ඉඩම් පරිහරණ රටාව**

මෙරට ඉඩම් පරිහරණ රටාවේ දුර්වල මෙන්ම යල් පැනගිය ක්‍රියාවලට බොහෝ සේ පාත්‍ර වී ඇති බව කිව යුතුමය. පාළුවට ගිය අතහැර දැමූ ඉඩමම් ඉතා බහුලය. ගෙවත්තක් ගත් කල ඉහළ ඵලදායිතාවක් ඇති කළ හැකි සේ සුදුසු භෝග හා ඒවා නිසි පරතරවලින් වගා කර නැත. ප්‍රයෝජනයකට ගත නොහැකි ගස් වැල් හා වල් පැළෑටි වලින් ඉඩම පිරීගොස් ඇත. ඒ නිසා ගොවිමහතුන් විසින් තම කුඩා ඉඩමෙහි ඵළදායිතාවය උපරිම කරගනු වස් නිසි පාලනයකින් සිය වගාවන් පවත්වා ගෙන යාමට උත්සුක විය යුතුය. සමහර කුඹුරු ඉඩම් යායන්ම වගා නොකොට අතහැර දමා තිබේ. මීට මූලික හේතුව වන්නේ අවශ්‍ය ශ්‍රම හිඟයයි. ඊට පිළියමක් ලෙස ඉඩමි සංවර්ධනය සඳහා යාන්ත්‍රීකරණය යම් පමණකින් හෝ හඳුන්වා දිම සඳහා මේ සුදුසුම කාලයයි. එමෙන්ම කුඩා ඉඩමිකැබලි එක්කොට විශාල ඉඩම් ඒකක ලෙස සකස් කර ගැනීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වුවහොත් යන්ත්‍ර භාවිතයෙන් ඉඩම් සැකසීම හා නව තාක්ෂණ ක්‍රම මඟින් බෝග රැකබලා ගැනීම පහසුවනවා මෙන්ම එයට වැයවන ශ්‍රම බලකාය හා පිරිවැය බොහෝ සේ අඩුකරගැනීමට හැකි වේ.

**ජාතික චින්තනය හා දේශාභිමානත්වය නැවත ගොඩනැගීම**

පසුගිය යුධ සමයේ මුළු රටෙහිම තාරුණ්‍යය තුළ දේශාභිමානත්වය දෝරෙ ගලායන තරමට ඉස්මතු වුවද පසුගිය වසර කිහිපයේ රටේ පැවති තත්ත්වය සමඟ එවැනි චින්තනයක් ඔවුන් අතරින් බොහෝ සේ ගිලිහී ගොස් ඇත. රටේ පුළුල් සංවර්ධනයක් සඳහා ජාතිකමය චින්තනයක් සැමදෙනා තුළ ජනිත වීම ඉතාම අත්‍යාවශ්‍ය කරුණකි. සිංගප්පූරුව සිය මූලික සංවර්ධන අවධියේදී එරට පාසැල් දරුවන් තුළ සිය දේශය ගොඩනැංවීම සඳහා පැවති උනන්දුව හා ඒ සඳහා තිබූ බලවත් ඇල්ම පිළිබඳව ප්‍රවෘත්ති අසන්නට ලැබුණි.

මෙරට සංවර්ධනයේ අරුණලු දැකබලා ගැනුමට මහත් අපේක්ෂාවෙන් සිටින ඔබ අප සැවොම මෙලෙස තම චින්තන රටාවේ පැහැදිලි පෙරළියක් සඳහා සූදානම් විය යුතුය. එය අධ්‍යාපනික වශයෙන්, සමාජීය ආකල්ප වශයෙන්, මෙන්ම දේශපාලන වශයෙන් විය යුතුය. එවැනි චින්තන වෙනසක් තුළින් හෝ මෙම අඳුරු ආවාටයෙන් රට ගොඩගෙන අනාගත ළමා පරපුරට හෝ එහි ඵල නෙලාගැනීමට ඉඩදීම අපගේ ස්ථිර අදිටන විය යුතුය.

# 07. ග්‍රාමීය සවිබලකරණය තුළින් සංවර්ධනය උදෙසා තුලනාත්මක හා තිරසාර ප්‍රවේශයක් ......

ජී.ආර්.එම්. ගම්ලත්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
මූල්‍ය කළමනාකරණ විද්‍යාපීඨය,
වවුනියා විශ්වවිද්‍යාලය,

ඕනෑම රටක වෙසෙන ජනතාව සහ ඔවුන් වෙසෙන භූගෝලීය සහ සමාජ පරිසරයන් අනුව එම රටෙහි විවිධ ප්‍රදේශයන් ග්‍රාමීය, වතු, අර්ධ නාගරික සහ නාගරික වශයෙන් වර්ගීකරණය කර ඇත. ඒ සඳහා විවිධ නිර්ණායකයන් යොදා ගනිමින් රාජ්‍ය සහ විවිධ ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ සංවිධාන විවිධ ආකාරයෙන් ඒවා නිර්වචනය කර ඇත. මෙම ප්‍රදේශ වර්ගීකරණය අනුව ගත්කල ශ්‍රී ලංකාවේ බහුතර ජනතාව ජීවත්වන්නේ ග්‍රාමීය අංශවල වන අතර, වතු ආශ්‍රිත ප්‍රදේශවලද සැලකිය යුතු ජනතාවක් වාසය කෙරෙති. රටක සංවර්ධනය පිළිබඳව සිදුවී ඇති සහ දැනට සිදුවී ගෙන යන භූගෝලීය, ආර්ථික, සමාජ සහ සංස්කෘතික ආදී විවිධ කථිකාවන්වලදී ග්‍රාමීය සංවර්ධනය පිළිබඳව ඉතා ගැඹුරින් සාකච්ඡා සිදුවී ඇතත්, කොතෙකුත් ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය වී ක්‍රියාත්මක වුවත්, තවමත් ග්‍රාමීය ප්‍රදේශවල සංවර්ධනයේ බොහෝ හිඩැස් සහ අතිශය ගැටලුකාරී තත්ත්වයන් අපට දැක ගන්නටත්, අසන්නටත් ලැබේ. විශේෂයෙන් අප රටේ තිබෙන විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවල සෑම දිනකම පාහේ මෙම තත්ත්වයන් නිරන්තරයෙන් දැක ගැනීමට ලැබෙන අතර ඒවා එකිනෙක සඳහන් කිරීමට ගියහොත් පොත් දුසිම් ගණන් වුව ද ප්‍රකාශයට පත් කළ හැකිය. රජය විසින් වරින් වර ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රතිපත්ති හා වැඩසටහන් පිළිබඳව ප්‍රගති විවරණයන් සහ විවිධ සමාලෝචනයන්හිදී ග්‍රාමීය සවිබලකරණය, ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සහ තිරසාරවත්වය පිළිබඳව විවිධ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විග්‍රහයන් ඉදිරිපත් කළද, ඉහත කී හිඩැස් හා ගැටලුකාරී තත්ත්වයන් මඟහරවා ගැනීමට හෝ සංවර්ධනය වේගවත් කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගන්නා බවක් ප්‍රායෝගිකව දැක ගැනීමට නැතුවා සේය. ඒ පිළිබඳව තුලනාත්මක විවරණයක් සිදු කිරීමට කතුවරයා මෙම ලිපියෙන් බලාපොරොත්තු වේ.

ප්‍රථමයෙන්ම මාගේ අවධානයට යොමු කරනු ලබන කරුණක් වන්නේ ඉහත කී තේමාව ආශ්‍රය කොට ගෙන ඒ සඳහා දායක වීමට අදාළව ප්‍රතිපත්ති සම්පාදකයින් හෝ වැඩසටහන් ක්‍රියාකරුවන් හෝ සංවිධායකයන් විසින් රටේ ග්‍රාමීය සවිබලකරණය සහ ග්‍රාමීය අංශික සංවර්ධනය පිළිබඳව තුලනාත්මක / තිරසාර ප්‍රවේශයක් ලබාගන්නේ කෙසේද යන්නයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන ව්‍යුහය අනුව දැනට මුළු ග්‍රාම නිලධාරී වසම් 14,022 ප්‍රමාණයක් වන අතර, එයට අදාළ මුළු ග්‍රාමීය ප්‍රදේශයන් වේ.

ප්‍රථමයෙන්ම අවධානය යොමු කළ යුතුව ඇත්තේ මෙම සියලූම ග්‍රාමීය ප්‍රදේශවල ඇති සියලූම භූගෝලීය ලක්ෂණයන්, ස්වභාවික සම්පත්, ඛනිජ සම්පත්, කෘෂි වාරිමාර්ග යනාදිය, ජන තොරතුරු, දැනට සිදුකර ඇති සහ කෙරෙමින් පවතින සමාජ, ආර්ථික, සංස්කෘතික, දියුණු කිරීම් ව්‍යාපෘති ප්‍රජා සංවිධාන ප්‍රජා

සවිබලකරණ තොරතුරු පිළිබඳ අතිශය සැලසුම් සහගත, ක්‍රමානුකූල සහ විධිමත් අධ්‍යයනයක් සිදුවිය යුතු බවයි. අප රට තුළ විවිධ මට්ටමේ අධ්‍යයනයන් සහ පර්යේෂණයන් සිදුවී ඇත ද ඉහත කී ඒකාබද්ධ අධ්‍යයනයක්/ පර්යේෂණයක් පිළිබඳව විශේෂ අවධානය යොමු කොට ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක් උදෙසා සමමිතික අවධානයක් සහ සංවර්ධන දායකත්වයක් ලබාදීම පිළිබඳව විශේෂ අවධානය සහ ප්‍රමාණාත්මක අවධානයක් යොමු වූ බව පෙනෙන්නට නැත. මෙය ඉතා අධික වෙහෙසකර හා අධික පිරිවැයක් දැරීමට සිදුවුවද සියලුම ආංශික නියෝජනයන් සිදුවන පරිදි ශ්‍රී ලංකාවේ සියලුම විද්වතුන් දැනට රජයේ සේවය කරනු ලබන බොහෝ උපාධිධාරීන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම් පිළියෙල කොට ස්වේච්ඡා දායකත්වය මත සිදුකර ගත හැක්කේ නම් අතිශය වැදගත් සංවර්ධන මාවතකට ප්‍රවිෂ්ට වීමට හැකියාව ඇත. මෙහිදී අවධානය යොමු කළ යුතු අනෙක් කාරණය වන්නේ දැනට ක්‍රියාත්මක හෝ වැඩ අවසන් වී ඇති සංවර්ධන ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් පිළිබඳ පසු විපරමක් නිසි පරිදි සිදු කිරීමේ හැකියාව ඇතිද, ඒ සඳහා ප්‍රවේශ වන්නේ කෙසේද යන්න විපරමක් සහ සමාලෝචනයක් සිදුකිරීමයි.

දෙවනුව අප විසින් සලකා බැලිය යුතු කාරණයක් වන්නේ මේ සඳහා ජනතා සහභාගිත්වය ලබා ගන්නේ කුමන ක්‍රමවේදයක් තුළින්ද යන්නයි. ඉහත අතීතයේ ග්‍රාමීය ප්‍රදේශවල පොකුරු රැස්වීම් හා ග්‍රාමෝදය මණ්ඩල වැනි ස්වේච්ඡා සංවිධාන රජය මගින් ගොඩනගා තිබුණද වත්මන් පරිසරය තුළ විවිධ රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූල සංවිධාන, ස්වේච්ඡා සමිති, කුඩා කණ්ඩායම් ( විවිධ ආර්ථික ආයතන, බැංකු, මූල්‍ය සමාගම් වලින්) රජයේ ලියාපදිංචිය සහිතව හෝ රහිතව ගොඩනැගී තිබීම දක්නට ලැබේ. එහෙත් එය කිසිදු විධිමත් බවක් හා ක්‍රමානුකූල ක්‍රියාකාරී සැලැස්මක් බොහෝ ගම්මානවල දක්නට නොලැබේ. එබැවින් මේ සඳහා විධිමත් ක්‍රමානුකූල සහ නීත්‍යානුකූල සැලැස්මක් මත සකස්වන ග්‍රාමීය සංවර්ධන සභාවක් හෙවත් ග්‍රාමීය සංවර්ධන කවුන්ලසියක් පිහිටුවා එම ග්‍රාමයේ වෙසෙන සියලු සියලු ස්තරවල සිටින පිරිස්වල දායකත්වය ලබාගෙන එමගින් එම ගම්මානයට විය යුතු සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කොට රාජ්‍ය සහ ඊට අනුබද්ධිත ආයතනවල අනුමැතිය හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කිරීමෙන් සියලු ග්‍රාමීය ජනතාවගේ සියලු අභිමතාර්ථයන් තුලනාත්මක ආකාරයෙන් ඉටුකර ගැනීමට අවකාශය සැලසෙනු ඇත. තවද මෙය ග්‍රාමීය සවිබලකරණය උදෙසා ග්‍රාමීය නායකත්වය පිළිගැනීමක් වන බවද සඳහන් කළ යුතුය. එයින් ග්‍රාමීය දියුණුව උදෙසා ග්‍රාමීය මට්ටමේ ඇති කැපවීම හා උනන්දුව ඇගයීමට ලක් කළ හැකි හොඳ අවස්ථාවක් වන බව කිව යුතුය.

මෙසේ විද්‍යාත්මක, තාක්ෂණික, නීතිමය දත්ත අධ්‍යයනයෙන් හෝ පර්යේෂණ සිදුකොට එමඟින් ලැබෙන්නා වූ දත්ත විග්‍රහයන් සහ නිගමන අනුව ඉහත ග්‍රාමීය සංවර්ධන කවුන්සලය පිහිටුවීමෙන් පසු තෙවනුව කුමකු සිදුකළ යුත්තේ ද යන්න සැලසුම් කළ යුතු වේ. විශේෂයෙන් රජය මඟින් වාර්ෂිකව අයවැය ඇස්තමේන්තු හා ප්‍රතිපාදන යටතේ මුදල් හෝ භෞතින සම්පත් බෙදා වෙන් වේ. ඒ සඳහා නිසි ඇගයීම් හා ක්‍රියාකාරී ක්‍රමවේදයන් ඔස්සේ ප්‍රතිපාදන වෙන් කිරීම හා ක්‍රියාත්මක විය යුතු වේ. මෙහි දී අවධානය යොමුවිය යුතු විශේෂ කරුණු නම් මනා විනිවිදභාවයක් හා වගවීමක් සහිතව දූෂණ හා වංචාවලින් තොර සීමිත සම්පත් මනා කළමනාකාරීත්වයකින් යුක්තව යෙදවිය හැකි පරිදි ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීමයි. ඒ සමඟම විවිධ ජාතික හා අන්තර්ජාතික ස්වේච්ඡා සංවිධාන හා මූල්‍යායතන මඟින් දෙනු ලබන ප්‍රතිපාදන හෝ සම්පත් දායක කර ගත හැකිය. එමෙන්ම ඉදිකළ පසු ඒවා නිසි පරිදි නඩත්තු වන්නේ කෙසේද ඒ සඳහා නිසි පසුවිපරම් සිදුවන්නේ ද යන්න අදාළ අංශ සමඟ මනා

සම්බන්ධීකරණයක් සිදු වන්නේ කෙසේ ද යන්න මනා ලෙස අවධාරණය කළ යුතු වේ. තවද මෙම ගම්මාවල පවතින ස්වභාවික සම්පත්, විශේෂයෙන් වන ජීවීන්, වනාන්තර, ජල මූලාශ්‍ර සංරක්ෂණයවන පරිදි ඒවා ආර්ථිකකරණයට ලක්කොට එමඟින් ග්‍රාමීය ජනතාවට ආදායමක් උපයාගත හැකි ආකාරයට කළමනාකරණය කර ගැනීමටත් ප්‍රාදේශීයව පවත්වාගෙන කර්මාන්ත ආරම්භ කිරීම හා ඒවායේ ධාරිතාවය වර්ධනය කොට එමඟින් ආදායම් උත්පාදක හැකියාව වර්ධනය කරමින් දළ දේශීය නිෂ්පාදනය වැඩිකිරීමට දායකත්වය ලබා දීමත්, මේ සම්බන්ධයෙන් බැංකු හෝ වෙනත් මූල්‍යායතන සමඟ අවශ්‍යතා මත පමණක් ණය මුදල් නිකුත් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදීමටත් හැකි ලෙස ග්‍රාමීය සංවර්ධන කවුන්සිලිය යටතේ පොදු වැඩපිළිවෙලක් සකස්කර ගැනීම අතිශය කාලෝචිත වන බව මාගේ හැඟීමයි. තවද මෙහිදී රජය විසින් අතිශය වැදගත් කටයුත්තක් සිදු කළ යුතු වේ. මන්ද රජය මඟින් ග්‍රාමීය සංවර්ධනය යන විෂයයට පරිබාහිරව සිදු කරනු ලබන විශාල පරිමාණ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතිවල දී ඒවායේ ඇති ආදේශිත විෂයය ක්ෂේත්‍ර හඳුනාගෙන එම කටයුතු සමඟ අප විසින් මූලික අදියරේ දී හඳුනාගන්නා විශේෂිත දත්ත හා පර්යේෂණ තොරතුරු සමඟ ගැලපීමෙන් සංවර්ධනය ද්විගණනය (දෙවරක් එකම ප්‍රදේශයකට මුදල් වෙන් වීම වැලැක්වීමෙන් දිවයිනේ සෑම ප්‍රදේශයකටම සම අවස්ථා කෙනෙකුටම ලබා දීම) වීම වැලැක්වීමට අවකාශය සැලසේ. එමඟින් නිසි සම්පත් නිසි ක්‍රමවේදය ඔස්සේ සෑම ගමකටම සම අවස්ථා ලබා දීමට හැකියාව ලැබෙන අතර එය විශේෂයෙන් අප රටේ සංවර්ධනය කඩිනම් කිරීම සඳහා ගත යුතු අත්‍යවශ්‍ය කරුණකි.

මෙසේ ක්‍රියාත්මක වන්නා වූ ග්‍රාමීය සවිබලකරණය හා සංවර්ධනය පිළිබඳ තුලනාත්මක ප්‍රවේශ රාමුව තුළ වැදගත් වන්නා වූ උප ක්ෂේත්‍ර වන කෘෂිකාර්මික වගා සංග්‍රාම, සුළු කර්මාන්ත සහ ජල සනීපාරක්ෂක කටයුතු, වැවිලි බෝග වගාව, සුළු පරිමාණ ව්‍යාපාර සහ කාර්මික කටයුතු, සාම්ප්‍රදායික කර්මාන්ත, ග්‍රාමීය සංචාරක ව්‍යාපාර, සූර්ය කෝෂ හා ජල විදුලි ව්‍යාපෘති, වඩු කර්මාන්ත සහ අනෙකුත් ව්‍යාපාර දියුණු කිරීම පිළිබඳව ග්‍රාමීය සංවර්ධන කවුන්සිලය හරහා නිරන්තර සාකච්ඡා කොට අදාළ ග්‍රාමීය ප්‍රදේශයේ සියලු ජන කොටස්වල අදහස් හා යෝජනා සැලකිල්ලට ගෙන පොදු වැඩපිළිවෙලක් සකස්කොට එය ප්‍රාදේශිය රාජ්‍ය යාන්ත්‍රණය ඔස්සේ නිසි මඟ පෙන්වීම සහ අධීක්ෂණය සහිතව ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබෙනු ඇත. එසේම මේ තුළින් ග්‍රාමීය ජනතාව තුළ සාමය සමඟිය සුහදත්වය හා සංහිඳියාව වඩා වර්ධනය වන අතර ඒ තුළින් සමාජ අපචාරයන් වළක්වා ගනිමින් සහපත් සමාජයක් ගොඩනගා ගැනීමට ද ඉවහල්වනු නොඅනුමානය. මෙම ක්‍රියාදාමයන් විධිමත් හා යහපත් ලෙස ක්‍රියාත්මක කිරීමට පුරවැසියන් ලෙස කටයුතු කරන්නේ නම් එය සමස්ථ රටක රාජ්‍ය පාලනයේ දී ඉතා ප්‍රශස්ථ හා සාධනීය වර්ධනයක් ඇති කිරීමට ජනතාවගේ ඇති උද්යෝගය හා කැපවීම වේ. එමෙන්ම ග්‍රාමීය ජනතාව තමන් විසින්ම ගොඩනගා ගන්නා ජනසම්මත වාදී පාලන ව්‍යුහයක් ඇති කර ගැනීමට මනා පිටිවහලක් අතර, එය රාජ්‍ය අංශයේ පාලකයින් හා ක්‍රියාත්මක කිරීමට දායකවන නිලධාරීන්ට ද ඉතා පහසුවන අතර ඒ තුළින් සැලසුම්ගත විධිමත් නෛතික රාමුවක් තුළ ක්‍රියාත්මක කිරීමෙන් රජයේ සමාජ ආර්ථික හා වෙනත් අරමුණු සියල්ල සාක්ෂාත්කර ගැනීමට හැකි වනවා සේම, ග්‍රාමීය ජනතාවගේ අභිමතාර්ථයන් මුදුන්පමුණුවා ගැනීමට ද මහඟු දායකත්වයක් සැපයේ. මේ තුළින් ව්‍යුහාත්මක හා අරමුණුගත ප්‍රශස්ථ සංවර්ධන මාවතක් සකස්කර ගැනීම තුළින් තිරසර සංවර්ධනයක් ළඟාකර ගැනීමට හැකියාව ලැබේ. මේ සමඟම රටේ ආර්ථික සහ සමාජ සංවර්ධනය උදෙසා නායකයින් මේ තුළින් බිහිවීම, නවෝත්පාදනය අරමුණු කොටගත් ව්‍යවසායකයින් බිහිවීම හා වැඩිදියුණු වීමත්, යහපත් රාජ්‍ය පාලනයක් , ප්‍රශස්ථ සමාජ සජීවීකරණයක් සහ

ස්වභාවික සෞන්දර්යයෙන් පිරිපුන් පරිසරයක් සහ ගුණගරුක සමාජයක් බිහිවීම යන රටක තිරසාර සංවර්ධනයක් උදෙසා ගුණාත්මක වශයෙන් ළඟාකරගත යුතු අරමුණු සාක්ෂාත් කර ගැනීමට මාවත සකස්කරගත හැකි වේ.

යථෝක්ත කරුණු අනුව ඉහත ක්‍රමෝපායන් සහ ඊට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම තුළින් ග්‍රාමීය ජනතාවගේ ජීවන අභිලාෂයෙන් මුදුන් පමුණුවා ගැනීමටත් ඒ තුළින් ඔවුන්ට තම ජීවන ක්‍රියාකාරකම්වල යෙදීමට මෙන්ම ස්වකීය ගම් ප්‍රදේශ දියුණු කර ගැනීම සඳහා කැපවිය හැකි යාන්ත්‍රණයක් සකස් කිරීමටත් ඒ තුළින් ග්‍රාමීය ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය පාලනයට දායක වීමටත්, අවසානයේදී ග්‍රාමීය ආර්ථිකය සවිබලගන්වා රටේ ජාතික ආර්ථික දියුණුවේ කොටස්කරුවෙකු වීමට ස්වකිය ජනතාවට ඇති අයිතිය තහවුරු කිරීමත් යන කරුණු ඉටු කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබිය යුතුවේ. පුරාතන ලංකා ඉතිහාසය තුළ අප රටේ ජනතාව රට තුළ ආර්ථිකය කෘෂිකර්මාන්තයෙන් ස්වයංපෝෂිත කරමින් අනෙකුත් අවශ්‍යතා ඉටුකර ගත හැකි ජීවන හා සමාජ වටපිටාවක් දක්නට ලැබුණද, දැනට ලෝකයේ තිබෙන ගෝලීයකරණයේ අත්දැකීම් අනුව මුළු ලෝකයම එක ඒකකයක් ලෙස බැඳී ඇත. එබැවින් දිගින් දිගටම අප සමාජය වෙනස් වේ. එහෙත් මෙහි දී විශේෂයෙන්ම අප අවධාරණය කරගත යුතු කාරණය නම් අදාළ වෙනස් වීම් ගෝලීය වශයෙන් සිදුවුව ද, අප රටේ තිබෙන්නා වූ සමාජ, ආර්ථික හා සංස්කෘතික දායාදයන් සහ අපට ම අනන්‍ය වූ සමාජ, ආර්ථික හර පද්ධතින් අනුව තුලනාත්මකව අවධානයට යොමු කොට එයින් ඇතිවන යහපත් ප්‍රතිඵල විශ්ලේෂණය කර අයහපත් තත්ත්වය මඟහරවා ගත හැකි ආකාරය සැලකිල්ලට භාජනය කරමින් අදාළ වෙනස්කම් අපගේ ක්‍රියාකාරකම්වලට ආදේශ කරගත යුතු බවයි. අද අප සංවර්ධන මාවතේ නැත්තේ ද මෙම කරුණු සැලකිල්ලට ගැනීම හෝ අඩුම සැලකිල්ලක් දැක්වීම බව අවධාරණයෙන් ප්‍රකාශ කළ යුතුය.

එමෙන්ම ඉහතකී ක්‍රියාපිළිවෙල අනුගමනය කරමින් ඉදිරි ප්‍රතිපත්ති හා වැඩසටහන් ග්‍රාමීය සවිබලකරණය හා රටේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කළ යුතු වන්නේ ඒවා ක්‍රියාත්මක කිරීමෙන් පසුව එහි තිරසාරාවය සහතික වීමෙන් අනතුරුවය. ඒ පිළිබඳව රටේ ලෝකෙ පුළුල් සංවාදයක් ඇතිවී තිබේ. බොහෝ සංවර්ධන ක්‍රියාදාමයන් රටේ ක්‍රියාත්මක වී ඇත ද ඒවායේ ප්‍රතිඵල දීර්ඝ කාලයක් තිස්සේ රටේ ජනතාවට අත් විය යුතුය. සංවර්ධනයේ ප්‍රතිලාභ රටට පොදුවේ අත්විය යුතුය. එහෙත් අද රටේ සංවර්ධනය දෙස විපරම් කොට බැලුවහොත් ඒවා ක්‍රියාත්මක වුවාට වඩා එයින් ඇති වූ අහිතකර බලපෑම හිතකර බලපෑමට වඩා ඉහළ බවයි බවයි. එමෙන්ම දීර්ඝකාලීන යහපැවැත්ම පිළිබඳ විශාල ගැටළුවක් පවතී. එබැවින් අප රටේ ප්‍රතිපත්ති සම්පාදකයින්, රජය අනෙකුත් සම්බන්ධිකාරක නියෝජිත ආයතනයන්, ග්‍රාමීය ජනතාව සහ අනෙකුත් සියලුම දෙනාටම එකටම පොදු වූ වේදිකාවක තුළ සිටගනිමින් සියලු දෙනාට පොදු වූ සංවර්ධන මාවතක් සකස් කොට අදාළ සියලු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් සොබාදහමත් ජීවන පරිසරය හා ආර්ථිකයත් එකට ඒකාබද්ධ වූ පොදු ග්‍රාමීය සවිබලකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කර ගැනීමටද ඒවායින් ඇති වන හිතකර හා අහිතකර බලපෑම සමතුලිත ලෙස කළමනාකරණය කර ගනිමින් තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට ක්‍රියා කළහොත් මෙම ලිපිය ලිවීමේ අරමුණ වන්නා වූ ප්‍රථමයෙන් ග්‍රාමී ජනතාව සවිබල ගන්වා ශ්‍රී ලංකාව තුළ තුලනාත්මක හා තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට දායක වීමට අප සියලු දෙනාටම හැකියාව ලැබෙනු ඇත. එවිට ලාංකීය ජනතාව සරුසාර හෙට දිනක ජීවන අරුණළු උදාවී මෙම අලංකාර රටේ ශ්‍රී විභූතිය අතීතයේ මෙන් නැවතත් ස්වයංපෝෂිත ආර්ථිකයට පෙර මඟ සකස් වනු ඇත.

# 09. සංස්කෘතික මානවයාගේ පුම්තිරිභාවය ......

## (ස්ත්‍රී පුරුෂ සමාජභාවය)

සුභාසිනී දිනූෂා අල්ගම
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**සංස්කෘතිය යනු**

සංස්කෘතිය ලෙස ඔබට කුමක් අදහස් කරන්නේ ද?...

ඔබගේ මනසට මෙන් ම මේ පැනයට පිළිතුරු සොයන බොහෝ දෙනාගේ සිත් තුළ විවිධ පිළිතුරු පැන නගිනු ඇත. එසේම ලෝකය පුරා සංස්කෘතිය නිර්වචනය කිරීමට උත්සහ දරණ ලද පිරිස් මේ පිළිබඳ අර්ථකථන කිරීමට කරන උත්සහයේ දී ඉදිරිපත් කරන ලද අර්ථකථන රාශියක් (250ක් පමණ) අපට සොයා ගැනීමට හැකි වේ. එසේනම් සංස්කෘතිය තේරුම් ගැනීමට මෙන්ම නිශ්චිත පිළිතුරක් සොයා ගැනීමට ද ඔබට මට මහත් අසීරු කරුණක් වන බව තේරුම් යනු ඇත.

එසේ නම් අපි ප්‍රථමයෙන් විවිධාකාර අර්ථ කථනයන් ඔස්සේ සංස්කෘතිය යන්න කුමක්දැයි විමසා බැලීමට උත්සාහ කරමු.

************

**සංස්කෘතියේ ආරම්භය**

ලෝකයේ සතුන් අතර මිනිසාට විශේෂ තැනක් හිමි වන්නේ නම් ඒ සංස්කෘතිය හේතුවෙනි. අතීත මිනිසාගේ ඉතිහාසය ලෙස අපට හෙළි කරන්නේ සංස්කෘතිය තුළ මිනිසාගේ විශේෂත්වය ළඟාකරගත් ආකාරයයි.

මී මැස්සන්, කොටියන්, කුහුඹුවන්, මාළුවන්, කුරුල්ලන් මේ ඕනෑම සතෙක් අතීතයේ හිටපු ඔවුන්ගේ මීමුතුන් සිදු කරන ලද ආකාරයට ම තම ජීවන රටාව පවත්වාගෙන යයි. මී මැස්සන් වද බඳින්නේ, කුරුල්ලන් පියාඹා යන්නේ, කූඩු සාදා ගන්නේ, සිංහයා, කොටියා දඩයමේ හැසිරෙන්නේ අතීතයේ සිට ම එක ම ආකාරයකට බව ඔබට තේරුම් යනු ඇත. එසේම කපුටා කූඩුව හදා ගන්නෙ මකුළුවා දැල වියන්නේ ස්වභාවධර්මය තුල ඔහුට හිමි වූ පරම්පරාවේ ගති ලක්ෂණ අනුව වසර දහස් ගණනක් අතීතයේ සිදු කළ ආකාරයට ම බව ඔබට අද ද නිරීක්ෂණය කළ හැකි වේ.

නමුත් අතීතයේ අනිකුත් සතුන් මෙන්ම ගමන් ඇරඹූ මිනිසා සොබා දහමේ දායාදයන් ඉක්මවා ගමන් කරමින් සිටින ආකාරය ද ඔබට නිරීක්ෂණය කල හැකි වෙයි.

මිනිසා යෝධයකු වූයේ කෙසේ ද?( M. Liyn, y Segal - how man become a giant) නම් කෘතිය ඔබට මිනිසාගේ මේ පරිවර්තනය මනාව පැහැදිලි කර දෙනු ඇත. මිනිසා ද සොබාදහමේ ම කොටසක් වන නමුත් ඔවුහු ස්වභාවධර්මය ද ඉක්මවා යමින් සිටින්නේ කෙසේ ද යන්න ඔබට මෙහිදී පැහැදිලි කර දෙනු ඇත.

දැන් නිදහස් කර ගෙන දෙපයින් නැගී සිටින මිනිසා නැතහොත් මානවයා අනිකුත් සතුන් මෙන් නොව සොබාදහම ඉක්මවා පුළුල් කර ගන්නා ලද තම හැකියාවන් මොහොතින් මොහොත වැඩි දියුණු කර ගනිමින් සංස්කෘතික මිනිසා ලෙස දීර්ඝ ගමනක යෙදී සිටී.

මේ ලෙස නැගී සිටින මිනිසා දිනෙන් දින දෙයාකාරයකින් තම සීමා පුළුල් කර ගනිමින් සිටී.

- මිනිසා සොබාදහම දායාද කරන ලද දැනුම, ශාරීරික ස්වභාවය හා හැකියාවන් උපකරණ හා යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් පුළුල් කර ගෙන ඇත. ඒ තුළ ඔහු හා සොබාදහම අතර අන්තර් ක්‍රියාවලිය පුළුල් වෙනස්කම් එක්කර ගනිමින් ගමන් කරයි.
- එසේම ඔවුන් එකිනෙකා අතර අන්තර් සම්බන්ධතා පුළුල් කර ගනිමින් වෙනස්කම් කර ගනිමින් මානව චින්තනමය හැකියාව සවිඥානිකවත් වර්ධනය කර ගනිමින් පුළුල් කර ගනිමින් කටයුතු කරයි.

මේ අනුව පැහැදිලි වන්නේ සංස්කෘතිය තුළ ද්‍රව්‍යමය නිෂ්පාදන, භෞතික කරුණු, මානසික (සවිඥානික) තත්ත්වයන් වෙන් කර දැක්වීමට ඔබට නොහැකි වන බව නොවේ ද?...

ලියොන් ට්‍රොස්කි ගේ අදහස් අනුව සංස්කෘතිය ලෙස හඳුන්වා ඇත්තේ,මිනිසාගේ සමස්ත ඉතිහාසය තුළ දී ස්වභාවධර්මය විසින් දෙන ලද දෙයට පටහැනිව මිනිසා විසින් නිර්මාණය කර ගන්නා ලද නැතහොත් ගොඩනගා ගන්නා ලද උත්සාහයන් හා ජයග්‍රහණය කරන ලද සියල්ල ම සංස්කෘතිය නම් වන බවයි.

ආරියවංශ රණවීරයන්ගේ  අදහසට අනුව චිරාත් කාලයක්  එක් ව සිටිමින් විශේෂයෙන්ම එක භාෂාවක් කථා කරමින් එකම ඇදහීම් රටාවක සිටින්න. ඒ සියල්ල ඇසුරින් තම තමන්ගේ ජීවිතයට අනුපූරක වන චර්යාධර්ම සකස්කර ගන්නා කණ්ඩායමක තිබෙන පොදු  සමස්තය අපිට සංස්කෘතිය ලෙස හැඳින්විය හැකි බවයි.

යුනෙස්කෝව විසින් ඉදිරිපත් කළ (our creative diversity පොතේ 'සංස්කෘතිය හා සංවර්ධනය'' පිළිබඳ ලියවී ඇති ලිපි මාලාව අනුව සංස්කෘතිය ඇතුළේ සිටින මිනිසා ට සිද්ද වෙනවා ඒ කණ්ඩායම් විසින් සකස් කරන ලද නිර්නායකයන් තුළ තමන්ගේ ජීවිතයත් පවත්වාගෙන යන්නට, හැඩගසා ගන්නට.  ඔවුන්ට ඉන් පිට යා නොහැකියි. හොඳ හෝ නරක  කුමක් වුවත් එය පිළිපැදීමට සිදුවෙනවා.

***************

එසේම සංස්කෘතිය ස්ථිරවම  හැමදා ම එලෙසම  පවතිනවා කියලා පැවසීමට ද අපිට නොහැකි වේ.

පෞද්ගලිකව සිතීම, අදහස් ප්‍රකාශ කිරීම ආදිය කෙරෙහි කොයි තරම් දුරට  සංස්කෘතිය උපකාරී වෙනවා ද මෙන්ම බාධාකාරී වෙනවද කියන එකත් වර්ථමානයේ අති විශාල ලෙස සාකච්ඡාවට ලක්වී ඇත.

උදාහරණයක් ලෙස සිංහල බෞද්ධ ධර්මය ඇසුරින් පෝෂණය වූ සංස්කෘතික රටාව තුළ මිනිසාට චර්යා ධර්ම කාවද්දා ඇත්තේ සැමට යහපතක් ඇති කරන්න, අනුන්ට උපකාර කරන්න, යහපත් මාර්ගයක ගමන් කරන්නයි. එසේම  බුදු දහමේ උගන්වන්නේ  බෞද්ධ ඉගැන්වීම් පවා ප්‍රශ්න කරන්න යි. ආගමික ඉගැන්වීම් එසේ නමුත්, සමාජීය වශයෙන් කර්මය ගැන කතා කරමින් සමාජයේ පවතින ඇති නැති ආදී විවිධ පරතරයන් පිළිගත යුතුයි කියන සංකල්පයෙන් කටයුතු කිරීමට සංස්කෘතිකමය වශයෙන් අපිව හුරු කිරීමට කටයුතු කර ඇති ආකාරයක් දක්නට ලැබේ.

ඒ අනුව බලනකල සංස්කෘතිය මිනිසාගේ ක්‍රියාකාරීත්වය තීරණය කිරීමට වැදගත් සාධකයක් වී ඇත.

****************

සංස්කෘතිය හා ඒ ඒ සමාජයේ මිනිසාගේ ක්‍රියාකාරීත්වය ගැන සොයා බැලීමේ දී ඒ ඒ සමාජයන් තුළ ජීවත් වන මිනිසා අපට උගන්වන දේවල් ඒ ඒ සමාජයේ සංස්කෘතිය බවට පත්වී තිබෙන ආකාරය සොගැනීමට හැකිවේ. මේ නිසා අපිට සංස්කෘතික මිනිසා සහ සංස්කෘතිය තුළ ජීවත්වන මිනිසා ලෙස අර්ථ ගන්වා

ගැනීමේ හැකියාව ඇත. සංවර්ධනය ගැන කතා කරන අපට මේ පිළිබඳ ව විමර්ශනය කිරීම ඉතාමත් වැදගත් බව මම ඔබට යෝජනා කරමි.

මම එසේ යෝජනා කරන්නේ ඇයි?. ඉන්දියාවේ කුලය, අරාබියේ කාන්තාවන්ගේ ලිංගේන්ද්‍රිය සුන්නත් කිරීම වැනි මානවීය අයිතීන් හා බැදී පවතින සංස්කෘතික කාරනා ඒ ඒ සංස්කෘතිය තුළ ජීවත් වන්නේ නම් පිළිගැනීමට අපට සිදුවෙනවා. නමුත් එම සංස්කෘතික කරුණු සාධාරණ ද අසාධාරණ ද කියන කරුණ විග්‍රහ කිරීමේදී ඒ සංස්කෘතිය තුළ සිටින පුද්ගලයාට සිදුවෙනවා ප්‍රජාවගේ පොදු මානව අයිතිවාසිකම් වෙනුවෙන් ද පෙනී සිටීමට. එසේම කලා ශිල්ප වැනි යහපත් දේවල් ද අපට ඒත්තු ගන්වන්නේ ද සංස්කෘතියයි. ඒ අනුව සංස්කෘතිය යනු ද්විත්ව ලක්ෂණ පෙන්නුම් කරන කාරණයක් බවයි. එනම් හොද නරක දෙකම පවතින බවයි.

මේ අනුව සංස්කෘතිය අපගේ පැවැත්මේ යහපත-අයහපත තීරණය කරන ප්‍රධාන සාධකයක් බව ඔබට පැහැදිලි වනු ඇත.

මේ වැනි විවිධ සංස්කෘතික කරුණු මත පිහිටා මිනිසුන් තමතමන්ගේ සංස්කෘතීන් උසස් බව හුවා දැක්වීමට උත්සාහ දරයි.

***************

එබැවින් ලොව ඇති විශිෂ්ටතම සංස්කෘතියේ හිමිකාරිත්වය ලබා ගැනීමට ඒ ඒ සංස්කෘතියට අයත් වන්නන් නිරතුරුව ම තරඟ කරන ආකාරය ඔබට ද අත්දකින්නට ලැබී ඇත.

සිංහල බෞද්ධ ප්‍රජාව, හින්දු ප්‍රජාව, කතෝලික ප්‍රජාව, මුස්ලිම් ප්‍රජාව තම තමන්ගේ සංස්කෘතීන් මුල් කර ගනිමින් ගැටුම් ඇති කර ගනිමින් සිටීම හොඳම නිදසුන යි.

සිංහල ප්‍රජාව අවුරුදු 2500 ක සංස්කෘතික ඉතිහාසයක් තියෙන ජාතියක් ලෙසින් සිතමින් සංස්කෘතික වශයෙන් සමාජයේ ඉදිරියෙන් ම සිටීමට උත්සාහ දරයි. ලෝකය අත්පත් කර ගත් විශිෂ්ට ජයග්‍රහණ ඊට බොහෝ කලකට පෙර අපි අත්පත් කර ගෙන තිබූ බව ඔප්පු කිරීමට හැම විටම උත්සහ දරයි. අභ්‍යවකාශය තරණය කිරීමට අවශ්‍ය මුල් ම නිපැයුම් සිදුකර ඇත්තේ රාවනා රජු විසින් බවත් බුදුන් වහන්සේ ලංකාවේ ඉපදී සිටි බවත් සිංහල බෞද්ධ ජනයා අභිමානයෙන් යුතුව ප්‍රකාශ කරමින් සිටි.

එසේම උසස්ම සංස්කෘතියක හිමිකාරිත්වය ඇත්තේ එංගලන්තයට බව අදහන පිරිසක් ද මේ අතරම සිටී. ඔවුන් විසින් ඒ බව සනාථ කිරීමට ද උත්සාහයන් දරමින් සිටී.

***************

එංගලන්ත සංස්කෘතිය ඇගයීම් පිළිබඳව සැලකීමේ දී එහි ආරම්භය විකාශය තුළින් අපට සංස්කෘතිය පිළිබද කරුණු රැසක් හදුනාගත හැකි වේ.

ඒ අනුව වික්ටෝරියානු සංස්කෘතිය පිළිබඳව අවධානය යොමුකිරීමේ දී සාමාන්‍ය ජීවිතයක් ගත කළ හතර වන විලියම් රජුගෙන් පසු කිරුළ හිමි වූ වික්ටෝරියා රැජින විසින් එරට සංස්කෘතික වෙනස්කම් රැසක් ඇති කිරීමට මූලික වී ඇති බව පෙනෙන්නට තිබේ. ඇය විසින් ම සිදු කරන ලද මෙම වෙනස්කම් වික්ටෝරියානු (එංගලන්ත) සංස්කෘතිය නිර්මාණයේ ප්‍රමුඛ සාධකය බව අපට හඳුනාගත හැකයි. ඇය බ්‍රිතාන්‍ය වැසියන්ගේ ජීවිතාදර්ශය වීමට අවශ්‍ය වීම නිසා සාමාන්‍ය ජීවිතය මෙන් පොදු ජීවිතයේ ද සියළුම

ආකාරයේ ශික්ෂාවන් ඇතිව හැඩගැසීමට පුරුදු විය. එසේ ශික්ෂණයකින් යුතු ඇගේ හැසිරීම්, ඇඳුම් පැළඳුම් ආදිය අනුගමනය කරන ප්‍රජාවක් එකල ඒ සමාජයේ බිහි වන්නට විය. එසේම ඔවුන්ද ඒ ආකාරයේ හැසිරීම් රටාවක් ඇතිකර ගනිමින් ශිෂ්ටත්වයකින් යුතු ඉහල සමාජයේ පිරිසක් බව පිළිගන්නා සංස්කෘතික වටපිටාවක් බිහිකර ගන්නට විය. ඒ අනුව ශිෂ්ට අශිෂ්ට ලෙසින් සංස්කෘතික ලක්ෂණ මතු කරමින් එංගලන්තය තුල වික්ටෝරියානු සමාජ සංස්කෘතියක් බිහි කරන ලදී. මේ ලෙස ඇති කරන ලද සංස්කෘතික වෙනස්කම් තුළ විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ වෙනස්කම් මත විවිධ සීමා ඇති කරන වෙනස්කම් රාශියක් ඇති වීමට හේතුව වී තිබෙ.

**වික්ටෝරියානු සමාජය හා පුම්තිරිබව**



ලිංගිකත්වය මත වෙනස් කම් රැසක් ඇති කිරීමට මෙම වෙනස හේතු වී ඇති අතර ඉන් ඇතැම් පිරිසකට පීඩාකාරී තත්ත්වයන්ට මුහුණ දීමට ද සිදු විය. නමුත් ඒ තත්ත්වය ඒ සංස්කෘතිය තුල ඒ ඒ සමාජ කන්ඩායම් වලට නිහඩවම දරාගැනීමට විශේෂයෙන් කාන්තාවට සිදු විය. එසේම එම කරුණු වලට විරෝධය ප්‍රකාශ කිරීම අශිෂ්ට දෙයක් ලෙස සලකන සමාජ සංස්කෘතියක් එකල බිහි වී තිබීම ඊට හේතු වී ඇත. එබැවින් ඒ සංස්කෘතිය හේතුවෙන් ම එංගලන්ත සමාජයේ ඉහල පාන්තික කාන්තාවන් බහුතරයක් ලිංගික කරුණු පිළිබඳ සාකච්ඡාවක්, හැදෑරීමක්, දැනුමක් නොමැති පිරිසක් ව සිටි බව සමාජ ඉතිහාසඥයින් ප්‍රකාශ කරයි. මේ බව ඒ අවදියේ පැවති සාහිත්‍යය කෘති විමර්ශනයේ දී ද සනාථ කෙරේ. එසේම එම කරුණු මතම පිහිටා ගොඩ නැගුණු වික්ටෝරියානු සංස්කෘතිය තුළ ඉහළ සමාජය පහළ සමාජය ලෙස විශමතාවයකින් යුතු සමාජීය වෙනස්කම් ඇතිවීම කැපී පෙනෙන කරුණක් වේ.

***************

වික්ටෝරියානු සංස්කෘතිය එසේ ගොඩ නැගුණ නමුත් පැරණි සිංහල බෞද්ධ සමාජයේ ස්ත්‍රිය හෝ පුරුෂයා සඳහා පැවතිය තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස් විය. පැරණි සිංහල සාහිත්‍යය තුල, පැරණි සන්දේශ කලාව තුළ ස්ත්‍රී පුරුෂ ශරීර වර්ණනා කිරීම් භික්ෂූන්ට පවා තහනම් වූ කරුණක් වී නැත.

එම ඓතිහාසික තොරතුරු නැතහොත් එම නිර්මාණයන් එදා ඒ ලෙස නිර්මාණය වී තිබුන නමුදු වර්තමානයේ වෙනස් වූ සංස්කෘතිය (වික්ටෝරියානු) මගින් එම තත්ත්වය වෙනස් කර ඇත. වික්ටෝරියානු සංස්කෘතියට අනුගතව ගොඩනැගුණු ඉහළ පාන්තික සමාජය ලෙස ගොඩනැගුණ ශ්‍රී ලාංකික සමාජය ද එංගලන්ත වික්ටෝරියානු සංස්කෘතියට අනුව ස්ත්‍රී පුරුෂ ලෙස තම ඇවතුම් පැවතුම් වෙසකට ලක් කර ගත් අතර ඒ ආභාෂය ඔස්සේ කටයුතු කරන ලද අනෙකුත් පුරවැසියාගේ ඇවතුම් පැවතුම් ද වෙනසට ලක්කර ගන්නට විය. ඒ අනුව ශ්‍රී ලාංකීය සංස්කෘතිය ද වෙස්කම් රැසකට ලක් වී ඇත.

එලෙස වික්ටෝරියානු සංස්කෘතිය පිලිගෙන හැඩගැසුන අපගේ සංස්කෘතිය තුළ විවිධ විෂමතාවයන් ඇතිකිරීමට සමත් වී ඇත.

ඒ අනුව ගොඩ නැගුන වර්තමානය සංස්කෘතිය තුල ස්ත්‍රිය පුරුෂයාට පහළින් ද තබා ඇති අතර ලිංගිකත්වයක් ප්‍රකාශකල නොහැකි හෝ ලිංගික විපර්යාසයන්ට ලක් වූ පුද්ගලයින් පහලින්ම දමා කටයුතු කරන සමාජ සංස්කෘතියක් නිර්මාණය වී ඇත.

***************

නමුත් ලොව බොහෝ සමාජයන් මේ වන විට ඒ ඒ සංස්කෘතීන් විසින් ඇති කරන ලද මෙවැනි අසමානතා නිසා අහිමිව යන මානව අයිතීන් ගැන සිතා කටයුතු කිරීමට පෙළඹී සිටී. ඔවුන්ගේ සමාජයේ සමාන අවශ්‍යතා ඇති මානවයාගේ සමානාත්මතාවය නැත හොත් මානව අයිතීන් පිළිගත යුතු බවට පිළිගෙන අවශ්‍ය කටයුතු සිදු කරනමින් සිටී. ළමා අයිතීන්, අබාධිත අයිතීන්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ආදී විවිධ මානවීය අයිතීන් දිනා දීමට නීති සම්පාදනය සිදුකරමින් සිටී.

ඒ අනුව අසමානතා ගොඩනගන ලද සංස්කෘතීන් වල පැවතින අයහපත් තත්ත්වයන් සාධාරණ මානවීය අයිතීත් දිනා ගැනීමට ඔවුන්ට හැකි වූ අතර ඒ අනුව ගොඩනැගෙන සංස්කෘතික වෙනස් කම් වලට අනුගතවෙමින් සංස්කෘතික වෙනස් කම් ඇති කර ගෙන සිටී. අප රටට බෙහෙවින් බලපාන ලද ඒ වික්ටොරියානු සංස්කෘතිය මේවන විට මේ ලෙස වෙනස් කරගෙන සිටී.

නමුත් අපිට ඒ ලෙස විෂමතාවයක් ඇති කරමින් වික්ටෝරියානු සංස්කෘතියට අනුව වෙනස් කර ගත් සංස්කෘතිය නිසා ඇතිවූ අහිතකර තත්ත්වය වෙනස් කරන සංස්කෘතික වෙනස්කම් සිදුකර ගැනීමට හැකියාව පවතී ද?.

*****************************************************************************

**ඊළඟ ප්‍රජාශක්ති කලාපයෙන්......................**

- **සංස්කෘතික ඉතිහාසය තුල පුමිතිරිබව**
- **ශ්‍රී ලංකික සංස්කෘතිය තුළ පුමිතිරිබවේ (ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ) වෙනස් වීම්**
- **ශ්‍රී ලංකික සංස්කෘතිය තුළ පුමිතිරිබවේ (ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ) බලපෑම්**

# 09. ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම

## ග්‍රාමීය සංවර්ධනය, අධ්‍යාපනය සහ ව්‍යවසායකත්වය තුළ කෘතීම බුද්ධිය (ARTIFICIAL INTELLIGENCE) හි බලය ……


බුද්ධික ලක්මාල්

අධ්‍යක්ෂ

කර්මාන්ත අමාත්‍යාංශය

විනාඩි 5ක් තුළ ලියන ලද මෙම ලිපිය %100කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) උපයෝගී කරගෙන සකස් කරන ලද එකකි .

සම්ප්‍රදායේ සහ ඔරොත්තු දීමේ තාලයට ජීවන රිද්මය ගැහෙන ශ්‍රී ලංකාවේ සශ්‍රීක ග්‍රාමීය ප්‍රදේශයේ හදවතේ නව යුගයක් උදා වේ. මෙම යුගය සනිටුහන් වන්නේ මහා ස්මාරක හෝ අහසට උස ගොඩනැගිලිවලින් නොව කෘත්‍රිම බුද්ධියෙන් (කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE)) බලගැන්වෙන නව්‍යකරණයේ සහ ප්‍රගතියේ නිහඬ හඬිනි. අප මෙම පරිවර්තන ගමන ආරම්භ කරන විට, ග්‍රාමීය ප්‍රජාවන් සවිබලගන්වන, අධ්‍යාපනයේ විප්ලවයක් ඇති කරන සහ දිවයින පුරා ව්‍යවසායකත්වයේ ආත්මය අවුළුවන නව චින්තන ක්‍රමයක් හඳුන්වා දෙමින් කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) සමාජ විප්ලවයක් සඳහා උත්ප්‍රේරකයක් වන්නේ කෙසේදැයි සොයා බලමු.



### ග්‍රාමීය සංවර්ධනය:

සශ්‍රීක කුඹුරු මැද පිහිටි ගම්මානයක් සිතින් මවා ගන්න. එහි දෛනික ඇඹරුම් බිම වගා කිරීම සහ පශු සම්පත් රැකබලා ගැනීම වටා කැරකෙන බව පෙනෙයි .දර්ශන විචිත්‍රවත් විය හැකි නමුත්, ග්‍රාමීය ප්‍රජාවන් මුහුණ දෙන අභියෝග සියල්ල සැබෑය. සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය වැනි අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා සීමිත ප්‍රවේශය, ආර්ථික අවස්ථා හිඟකම සමඟින්, දරිද්‍රතාවයේ සහ හුදකලා වීමේ චක්‍රයක් පවත්වාගෙන යයි. කෙසේවෙතත්, කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) පැමිණීමත් සමඟ ග්‍රාමීය සංවර්ධනය සඳහා බලාපොරොත්තුවේ ආලෝකයක් තිබේ.

කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) බලයෙන් ක්‍රියාත්මක වන විසඳුම් මගින් නාගරික මධ්‍යස්ථාන සහ දුර බැහැර ගම්මාන අතර පරතරය පියවාගත හැකි අතර අත්‍යාවශ්‍ය සේවා ළඟා කරගත හැකිය. ගොවීන් කෘෂි විද්‍යාඥයන් සමඟ සම්බන්ධ කරන ජංගම යෙදුමක් සිතන්න. බෝග කළමනාකරණය සහ පළිබෝධ පාලනය පිළිබඳ තත්‍යකාලීන උපදෙස් ලබා දෙයි. නැතහොත් ළඟම ඇති

රෝහල වෙත දිගු ගමනක් යාමට ඇති අවශ්‍යතාවය ඉවත් කරමින් වීඩියෝ ඇමතුම් හරහා වෛද්‍යවරුන් සමඟ සාකච්ඡා කිරීමට ගම්වැසියන්ට ඉඩ සලසන ටෙලිමෙඩිසින් වේදිකාවක්. ග්‍රාමීය ප්‍රජාවන්ගේ අද්විතීය අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා කෘතිම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) ප්‍රයෝජනයට ගැනීමෙන්, අපට ඔවුන්ගේ සම්පූර්ණ හැකියාවන් විවෘත කර සැමට වඩා සාධාරණ සමාජයක් නිර්මාණය කළ හැකිය.

**අධ්‍යාපන:**

අධ්‍යාපනය ප්‍රගතියේ මුල්ගල වන නමුත් ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය දරුවන්ට ගුණාත්මක පාසල් අධ්‍යාපනයක් ලබාගැනීම දුරස්ථ සිහිනයක්ව පවතී. සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ හිඟයේ සිට යටිතල පහසුකම් සහ සම්පත් ප්‍රමාණවත් නොවීම දක්වා අභියෝග විවිධ වේ. කෙසේ වෙතත්, කෘතිම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනය පරිවර්තනය කිරීම සඳහා බලාපොරොත්තුවේ කිරණ ලබා දෙයි.

සෑම සිසුවෙකුටම ඔවුන්ගේ පුද්ගලික අවශ්‍යතා සහ ඉගෙනුම් විලාසයන්ට ගැලපෙන පුද්ගලාරෝපිත ඉගෙනුම් අත්දැකීම් සඳහා ප්‍රවේශය ඇති පන්ති කාමරයක් ගැන සිතන්න. කෘතිම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) බලයෙන් ක්‍රියාත්මක වන අධ්‍යාපනික වේදිකාවලට එක් එක් ශිෂ්‍යයාගේ ඉගෙනීමේ වේගයට අනුවර්තනය විය හැකි අතර, ඉලක්කගත මැදිහත්වීම් සහ අවශ්‍ය තැන්වලට සහාය ලබාදේ. එපමණක් නොව, කෘතිම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) ගුරුවරුන්ගෙන් සමන්විත අතථ්‍ය පන්ති කාමරවලට, සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමවලට අනුපූරක විය හැකි අතර, කිසිදු දරුවෙකු ඉතිරි නොවන බව සහතික කරයි. කෘතිම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) හි බලය උපයෝගී කර ගැනීමෙන්, සෑම දරුවෙකුගේම පසුබිම හෝ තත්වයන් නොසලකා ඔවුන්ගේ හැකියාවන් අගුළු හරින වඩාත් ඇතුළත් සහ සාධාරණ අධ්‍යාපන ක්‍රමයක් අපට නිර්මාණය කළ හැකිය.

**ව්‍යවසායකත්වය:**

ව්‍යවසායකත්වය යනු ඕනෑම ආර්ථිකයක ජීවනාලිය, නවෝත්පාදනය මෙහෙයවීම, රැකියා උත්පාදනය කිරීම සහ ආර්ථික වර්ධනය පෝෂණය කිරීමයි. කෘෂිකර්මාන්තය සහ හස්ත කර්මාන්ත වැනි සාම්ප්‍රදායික ජීවනෝපායන් බහුලව පවතින ග්‍රාමීය ශ්‍රී ලංකාවේ, ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ඉමහත් විභවයක් ඇත. කෙසේ වෙතත්, අපේක්ෂා කරන ව්‍යවසායකයින් බොහෝ විට ප්‍රාග්ධනය, වෙළඳපොළවල් සහ ව්‍යාපාර ආධාරක සේවා සඳහා සීමිත ප්‍රවේශය වැනි බාධකවලට මුහුණ දෙයි.

ව්‍යවසායකත්වය සඳහා ප්‍රවේශය ප්‍රජාතන්ත්‍රීකරණය කළ හැකි සහ ග්‍රාමීය ප්‍රජාවන්ගේ නිර්මාණාත්මක ශක්තීන් මුදා හැරිය හැකි කෘතිම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) - බලවත් විසඳුම් ඇතුළත් කරන්න. ග්‍රාමීය ශිල්පීන් ලොව පුරා සිටින ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ කරන, ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට සහ ඔවුන්ගේ වෙළඳපළ ප්‍රවේශය පුළුල් කිරීමට ඔවුන්ට හැකි මාර්ගගත වෙළඳපොළක් ගැන සිතන්න. නැතහොත් ණය සුදුසුකම් තක්සේරු කිරීමට සහ අපේක්ෂා කරන ව්‍යවසායකයින්ට දැරිය හැකි ණය ලබා දීමට කෘතිම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) ඇල්ගොරිතම භාවිතා කරන

ක්ෂුද්‍ර මූල්‍ය වේදිකාවක්. ග්‍රාමීය ව්‍යවසායකත්වයට සහාය වීම සඳහා කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) හි බලය උපයෝගී කර ගැනීමෙන්, අපට ආර්ථික සමෘද්ධිය සඳහා නව මාවත් නිර්මාණය කළ හැකි අතර ප්‍රජාවන්ට ඔවුන්ගේම ඉරණම ප්‍රස්ථාරගත කිරීමට බලගැන්වීමට හැකිය.

**අභියෝග සහ අවස්ථා:**

ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකාවේ සමාජ විප්ලවය සඳහා කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) හි බලය උපයෝගී කර ගැනීම එහි අභියෝග නොමැතිව නොවේ. කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) හි ප්‍රතිලාභ සමාජය පුරා සාධාරණව බෙදා හැරීම සහතික කිරීම සඳහා සදාචාරාත්මක සලකා බැලීම්, දත්ත රහස්‍යතා ගැටළු සහ ඩිජිටල් සාක්ෂරතා හිඩැස් ආමන්ත්‍රණය කළ යුතුය. එපමණක් නොව, ග්‍රාමීය ප්‍රදේශවල කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) තාක්ෂණයන් යෙදවීමට සහාය වීම සඳහා ශක්තිමත් යටිතල පහසුකම් සහ නියාමන රාමු අවශ්‍ය වේ.

කෙසේවෙතත්, අවස්ථාවන් අභියෝගවලට වඩා බෙහෙවින් වැඩිය. සමාජ පරිවර්තනය සඳහා මෙවලමක් ලෙස කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) වැළඳ ගැනීමෙන්, අපට ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය, අධ්‍යාපනය සහ ව්‍යවසායකත්වය සඳහා නව හැකියාවන් විවෘත කළ හැකිය. එක්ව, අපි මෙම නව චින්තන ක්‍රමය වැළඳගෙන සියලුම ශ්‍රී ලාංකිකයින්ට දීප්තිමත් අනාගතයක් නිර්මාණය කිරීමට කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) හි බලය උපයෝගී කර ගනිමු.

මෙම ලිපිය %100කෘතීම බුද්ධිය )ARTIFICIAL INTELLIGENCE) උපයෝගිකරගෙන ලියා තිබේ

# 10. ග්‍රාමීය සංවර්ධනයට නව්‍ය ප්‍රවේශයක් - සුහුරු ගම්මාන සංකල්පය .....

කේ.බී.ධර්මප්‍රිය
සංවර්ධන නිලධාරී
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ **ජීවන තත්ත්වය** නගා සිටුවීම සහ ඉහළ නැංවීම ග්‍රාමීය සංවර්ධනයේදී ප්‍රමුඛත්වයක් හිමි කර ගෙන ඇත. වර්තමාන ලොකයේ සිදුව ඇති තාක්ෂණික පරිවර්තනයන් සමඟ සංවර්ධන ක්‍රියාවලිය ද, අත්වැල් බැඳ ගනිමින් ඉදිරියට ගමන් කල යුතුව ඇත. මෙහිදි සුහුරු ගම්මාන සංකල්පය (Smart Village Concept) ග්‍රාමීය සංවර්ධනයේ පරිවර්තනීය ප්‍රවේශයක් ලෙස ලොව පුරා විවිධ රටවල අවධානයට ලක්ව ඇත. මෙහිදි තිරසර සංවර්ධනය සහ වැඩි දියුණු කළ ජීවන තත්ත්වයන් ග්‍රාමීය සංවර්ධනයේදී, අත්පත් කර ගැනීමට අවස්ථාව සලසයි. මෙම සංකල්පය තුළින් ග්‍රාමීය ප්‍රජාවන් මුහුණ දෙන විවිධ අභියෝගවලට විසඳුම් සෙවීම සඳහා තාක්ෂණය හා බද්ධව නව්‍ය විසඳුම් ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කරයි.




සුහුරු ගම්මාන සංකල්පයේදී, ප්‍රජාව කෙරෙහි ඇඩි බලපෑමක් ඇති කරනු ලබන ක්ෂේත්‍ර වන කෘෂිකර්මය, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ යටිතල පහසුකම් සංවර්ධනය වැනි අංශයන් කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කරන අතර එහිදී ප්‍රජාවගේ සමස්ත යහපැවැත්ම වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් උසස් තාක්ෂණයන් භාවිතා කිරිමත්, හඳුන්වා දීමත් සිදු කරයි. ග්‍රාමීය සංවර්ධනය සඳහා භාවිතා කරනු ලබන සම්ප්‍රදායික ප්‍රවේශයන් මෙන් නොව **සුහුරු ගම්මානයක,** කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීමත්, අන්තර් සම්බන්ධිත පද්ධති නිර්මාණය කිරීම සඳහාත් උසස් තාක්ෂණික ක්‍රමවේද, අන්තර්ජාල හා ඩිජිටල් උපක්‍රම ඒකාබද්ධව උපයෝගි කර ගනී. මේ තුළින් ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම අරමුණු කර ගනු ලබන අතර එහිදි ආර්ථික වර්ධනය අපෙක්ෂා කරනු ලැබේ. මෙය සමස්ත ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට මහපාදයි.

**සුහුරු ගම්මානයක ප්‍රධාන කොටස්**

1. **ඩිජිටල් යටිතල පහසුකම් (Digital Infrastructure)**

සුහුරු ගම්මානයක අත්තිවාරම පවතින්නේ, තොරතුරු තාක්ෂණය, අධ්‍යාපනය සහ වෙළඳපොළ වෙත ප්‍රවේශය ලබා දෙන අධිවේගී අන්තර්ජාල සම්බන්ධතා වැනි දෑ ඇතුළත් වූ ශක්තිමත් ඩිජිටල් යටිතල පහසුකම් තුළ ය. මෙම අධිවේගී අන්තර්ජාල සම්බන්ධතා ඇතුළු ඩිජිටල් යටිතල පහසුකම් ග්‍රාමීය

සංවර්ධනයේ දී මුහුණදෙන ගැටළු සඳහා අවශ්‍ය විවිධ නවීන තාක්ෂණික විසඳුම් ක්‍රියාත්මක කිරීමට උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කරනු ඇත.

### 2. සුහුරු කෘෂිකර්මය (Smart Agriculture)

තොරතුරු සම්පාදනය, දත්ත විශ්ලේෂණය, කෘෂි උපකරණ භාවිතය හා උසස් තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතය, නවීන පසු අස්වනු තාක්ෂණික ශිල්පීය ක්‍රම වැනි දෑ මෙන්ම ගොවීන්ට කාලගුණික තත්වයන්, හිතකර පාංශු තත්ත්වයන් පවත්වා ගැනීම, භෝග වගා හා රටා නිරීක්ෂණය කිරීම, සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීම හා තිරසර තත්ත්වයන් පවත්වා ගැනීම යනාදිය නිරවද්‍ය කෘෂිකර්මයක් සඳහා අදාළ වේ. මේ සඳහා සුහුරු ගම්මාන සංකල්පයේදී නවීන අධිවේගී අන්තර්ජාල පහසුකම් මෙන්ම උසස් ඩිජිටල් උපක්‍රම භාවිතයට ගනී. මෙමගින් කෘෂිකාර්මික අංශයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩි කිරීමට හැකියාව ලැබේ.

### 3. අධ්‍යාපනය හා නිපුනතා සංවර්ධනය (Education and Skill Development)

සුහුරු ගම්මානයකදී ඩිජිටල් සාක්ෂරතාවය කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කරන අතර මාර්ගගත අධ්‍යාපනික සම්පත් හා ඒ සඳහා යටිතල පහසුකම් සපයයි. විද්‍යුත් ඉගෙනුම් වේදිකා සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් මඟින් ප්‍රජාව තුළ නව නිපුණතා ඇති කිරීමටත්, ව්‍යවසායකත්වය හා රැකියා අවස්ථා ප්‍රවර්ධනයටත් නිවැසියන් සවිබලගැන්වීම මෙහිදී සිදු වේ.

### 4. සෞඛ්‍ය සේවා (Healthcare Services)

දුරස්ථ ග්‍රාමීය ප්‍රදේශවල ගුණාත්මක හා කාර්යක්ෂම සෞඛ්‍ය සේවාවක් පවත්වා ගෙන යාම ඉතා වැදගත් වේ. සුහුරු ගම්මාන සංකල්පයේදී සිදු වන්නේ ග්‍රාමීය ප්‍රජාව වෙනුවෙන් ගුණාත්මක හා කාර්යක්ෂම සෞඛ්‍ය සේවාවක් පවත්වා ගැනීම උදෙසා වන ටෙලිමෙඩිසින් ක්‍රමවේද හා ප්‍රජා සෞඛ්‍ය නිරීක්ෂණ පද්ධති වෙත වන ප්‍රවේශය පුළුල් හා පහසු කිරීමයි. පැළඳිය හැකි උපාංග, ජංගම යෙදුම් හා නිවැසියන්ට වෛද්‍ය උපදේශන වැනි දෑ සඳහා ඉඩකඩ සලසා දෙනු ලැබේ. නාගරික හෝ දුර බැහැර මධ්‍යස්ථාන වෙත පුළුල්ව ගමන් කිරීමේ අවශ්‍යතාවය අඩු කිරීමට මෙහිදී අපෙක්ෂා කෙරේ.

### 5. පුනර්ජනනීය බලශක්තිය (Renewable Energy)

සුහුරු ගම්මාන සංකල්පය තුළ සූර්යය බලය, සුළං බලය, ජීව වායුව වැනි තිරසාර බලශක්ති ප්‍රභවයන්ට ප්‍රමුඛත්වය ලබා දේ. මෙහිදී ප්‍රජාවේ බලශක්ති අවශ්‍යතා සපුරාලීම, පුනර්ජනනීය බලශක්ති විසඳුම් ක්‍රියාත්මක කිරීම තුළින් ඉටු කෙරේ. සම්ප්‍රදායික බලශක්ති ප්‍රභවයන් මත යැපීම අඩු කිරීමට කටයුතු කරන අතර පරිසර හිතකාමී හා පරිසර සංරක්ෂණයට දායක වීමත් මෙහිදී අපේක්ෂිත ය.

### 6. ඊ - ආණ්ඩුව (E-Governance)

කාර්යක්ෂම රාජ්‍ය පාලනයකට ඊ පාලන පද්ධති (e-governance systems) හරහා පහසුකම් සැපයීමක් සිදු වන අතර ප්‍රජාවට රජයේ සේවාවන් වෙත අන්තර්ජාලය හරහා ප්‍රවේශ වීමට ඉඩකඩ ලබා දීම මෙහිදී සිදු

වේ. මෙමගින් පරිපාලන ක්‍රියාවලිය විධිමත් කරන අතර දූෂණය අවම කිරීම සහ විනිවිදභාවය වැඩි කිරිමත් සිදු වනු ඇත.

**සුහුරු ගම්මාන සංකල්පයේ ප්‍රතිලාභ** (Benefits of the Smart Village Concept)

සුහුරු ගම්මාන සංකල්පයේ ප්‍රතිලාභ ප්‍රධාන කරුණු 03ක් ඔස්සේ හඳුනා ගත හැකිය.

1. **වැඩි දියුණු කළ ජීවනෝපාය (Enhanced Livelihoods)**

විවිධ අංශවලට නව තාක්ෂණය ඒකාබද්ධ කිරිම තුළ සුහුරු ගම්මාන නව ආර්ථික අවස්ථා නිර්මාණය කරන අතර එමගින් ආදායම් මට්ටම් ඉහළ නැංවිමට දායක වේ. ඒ තුළ ප්‍රජාවගේ සමස්ත ජීවනෝපාය ක්‍රියාවලිය ඉහළ නැංවීමට මඟපාදයි.

2. **වැඩිදියුණු කළ ජීවන තත්ත්වය (Improved Quality of Life)**

අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා ඇතුළු අත්‍යවශ්‍ය සේවාවන් වෙත වන ප්‍රවේශය පහසු හා වැඩි දියුණු කිරිමක් මෙහිදි සිදු වන බැවින් එය ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට මඟ පාදයි. සුහුරු ගම්මාන සංකල්පයේදී නාගරික ග්‍රාමීය භේදය සමනය කිරීමට සහ සාධාරණ සංවර්ධනයක් සහතික කිරිමට උත්සහ කරනු ලැබේ.

3. **පාරිසරික තිරසාරත්වය (Environmental Sustainability)**

සුහුරු ගම්මාන සංකල්පයේදී දිගුකාලීන පාරිසරික තිරසාරත්වයට දායක වීමක් අපේක්ෂිත ය. යහපත් කෘෂිකාර්මික භාවිතයන්, පුනර්ජනනීය බලශක්තිය සහ එභි තිරසර භාවිතයන් අනුගමනය කිරීමත් තුළ එය පරිසර තිරසාරත්වයට ඉවහල් වේ.

**සුහුරු ගම්මාන සංකල්පයේ අභියෝග හා අනාගතය**

සුහුරු ගම්මාන සංකල්පයට අවශ්‍ය වන මුලික යටිතල පහසුකම් සඳහා ආයෝජනය, ඩිජිටල් සාක්ෂරතාවය ප්‍රවර්ධනය, සංස්කෘතිකමය පිළිගැනිම, වැනි අභියෝගවලට විසඳුම් සපයා ගැනීමට සිදු වේ. සුහුරු ගම්මාන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේදී, මෙම අභියෝග ජයගැනීමට රජයන්, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයේ සහයෝගීත්වයෙන්, තීරණාත්මක කාර්යය භාරයක් ඉටු කිරීමට සිදුවේ.

මෙම සුහුරු ගම්මාන සංකල්පය ග්‍රාමීය සංවර්ධනය සඳහා පරිපූර්ණ හා නව්‍ය ප්‍රවේශයක් නියෝජනය කරයි. දිගුකාලීන අභියෝගවලට විසඳුම් සෙවීමට සහ ග්‍රාමීය ප්‍රජාවගේ සවිබලගැන්වීම සඳහා තාක්ෂණික උත්තේජනයක් මේ තුළින් සපයයි. ලොව විවිධ ජාතීන් සුහුරු විසඳුම් සඳහා අඛණ්ඩව වැඩි වැඩියෙන් ආයෝජනය කරන විට, ග්‍රාමීය සංවර්ධනයේ අනාගතය හැඩගස්වන තිරසාර ජාලගත(සම්බන්ධිත) සහ සමෘද්ධිමත් සුහුරු ගම්මාන පිළිබඳ දැක්ම යතාර්ථයක් බවට පත් වනු ඇත.

(අන්තර්ජාලය ඇසුරින් )

# 11. ග්‍රාමීය සංවර්ධනයෙන් ඔබ්බට.........

හෝ

## ගමෙන් අන්තරයට .......

චන්දිම ද සොයිසා

සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව විවිධ යුග වල දී නොයෙක් සංවර්ධන ප්‍රවේශයන් හඳුන්වා දෙමින් ග්‍රාමීය සංවර්ධනය සිදුකිරීම සඳහා උත්සාහ ගෙන ඇති බව අතීත සංවර්ධන ප්‍රවේශයන් අධ්‍යයනය කිරීමේ දී පැහැදිලිව හඳුනාගත හැකි අතර එහි දී විශේෂයෙන්ම ගොවිජනපද ව්‍යාපාරය තුළ සිදුවූ ගල්ඔය, ඉඟිනිමිටිය, උඩවලව, ඉඟිනියාගල ආදී මහා පරිමාණ ව්‍යාපෘති වල සිට ප්‍රජා පාලිත සංවර්ධන ප්‍රවේශයක් දක්වා වූ සංවර්ධන උපාය මාර්ග පදනම් කරගනිමින් ග්‍රාමීය සංවර්ධනය සිදුකරලීමට කටයුතු කර ඇත.

මෙම විවිධ සංවර්ධන ප්‍රවේශයන් ග්‍රාමීය ජනතාව අතරට ගෙන ගොස් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා විවිධ ආයතන සහ සංවිධාන වරින් වර ස්ථාපනය කරනු ලැබූ අතර, මේ වන විට සක්‍රිය දායකත්වයක් සපයන ආයතන හෝ සංවිධාන ඇත්තේ ඉතාමත් අඩු සංඛ්‍යාවකි. එදා ගල්ඔය ව්‍යාපාරය, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය, මහවැලි සංවර්ධන අධිකාරිය වැනි රජය සෘජු ලෙස සම්බන්ධ වූ ආයතන පිහිටුවා ග්‍රාමීය සංවර්ධනය සිදුකර ඇති අතර, එම ක්‍රමවේදය තුලන් තීන්දු තීරණ ගැනීම ක්‍රියාත්මක කිරීම ඉහළ සිට පහළට ගලායාම සිදුවිය.

එහෙත් පසුකාලීනව ග්‍රාම නිලධාරි වසම් පදනම් කරගනිමින් ග්‍රාමීය සංවිධාන සඳහා විවිධ ව්‍යාපෘති හඳුන්වාදෙනු ලැබූ අතර, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (ගැමිදිරිය) වැනි ව්‍යාපෘති හඳුන්ව දෙමින් සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයන් තුළින් ග්‍රාමීය සංවර්ධනය සිදුකිරීමට කටයුතු කළ අතර, එහිදී විපර්යකාරක තවදුරටත් සමාජ සජීවිකාරයකයකු ලෙස ඉදිරියට යමින් සමාජ සජීවිකරණය, ප්‍රජා සංවිධාන ඇති කිරීම, ප්‍රජා සහභාගීත්වය ලබාගැනීම ආදී ධනාත්මක කාර්යයන්වල නියැලෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය ප්‍රජාව සැලසුම් කිරීමේ ක්‍රියාවලියේ සිට මෙහෙයුම් හා නඩත්තු කිරීමේ ක්‍රියාවලිය දක්වා වූ සියලුම අවදීන්වල දී තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රිය ලෙස දායකත්වය ලබාදෙන ලදී. මේ හේතුවෙන් ප්‍රජාවට තීරණ ගැනීමේ දී කේවල් කිරීමේ ශක්තිය ඇති විය.

ඒ අනුව මෙම ලිපිය මඟින් සාකච්ඡා කිරීමට අදහස් කරනුයේ ග්‍රාමයක් තුළ ප්‍රජාව විසින් තම බලප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් ගොඩනගා ගන්නා ලද ප්‍රජා සංවිධාන සංකල්පය තවදුරටත් ශක්තිමත් ලෙස ඉදිරියට ගෙන යමින් ප්‍රදේශයේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායකත්වය සැපයීම සිදුකිරීමට යොදාගත හැකි ක්‍රමවේදයක්වූ නවමු සංකල්පයක් වන "ප්‍රාදේශීය සභා අන්තර් ගම්මාන සංවර්ධන වැඩසටහන" (Pradeshiya Sabha Interconnectivity Development Program) පිළිබඳ ක්‍රමවේදයයි.

මෙහි දී වෙන් වෙන්ව හුදකලාව පවතින ගම් යාකරමින් ගම්මාන තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් විවිධ ක්ෂේත්‍රවලින් දියුණුවට පත් ප්‍රජාවක් බිහිකිරීමත්, ප්‍රාදේශීය සභාව හා ප්‍රජාව අතර සබඳතා වර්ධනය කිරීමත්, ප්‍රාදේශීය සභාව ශක්තිමත් කිරීම තුළින් ප්‍රජාවට සපයන සේවාවන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකියාව ලබාදීමත්, ප්‍රාදේශීය සභාව වඩා යහපාලිත ආයතනයක් වශයෙන් නඟා සිටුවීමට අවශ්‍ය පහසුකරණය ලබාදීමත් පොදුවේ මෙවැනි වැඩසටහනක් තුළින් අපේක්ෂා කරයි.

ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටුවන ප්‍රජා සංවිධාන සිය අවශ්‍යතාවයන් වසම තුළ ඉෂ්ඨ සිද්ධ කර ගත්ත ද ඊට පරිබාහිරින් වූ පාර්ශවයන් සමඟ ප්‍රදේශයේ ආර්ථික, සාමාජිය, සංස්කෘතික, දේශපාලනික, නෛතික හා පාරිසරික ආදී කරුණුවල දී සහභාගීත්ව සංවර්ධනය ප්‍රවේශය තුළින් දායකත්වයක් සැපයීම සිදුකර නොමැති තරම්ය.

ග්‍රාමීය ප්‍රදේශ සියල්ල නියෝජනය කර සමස්ථ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම කේන්ද්‍ර කරගනිමින් බිහිකරන යාන්ත්‍රණයක් ඔස්සේ මෙම සංකල්පය ක්‍රියාවට නංවන අතර, මේ සඳහා ග්‍රාමීය මට්ටමෙන් පවතින ග්‍රාමීය සංවිධාන ඍජු ලෙස බද්ධ වී පවතී. හඳුනාගන්නා ලද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති සියලුම වසම් ප්‍රජාවගේ සහභාගීත්වය මත කලාප (Zones) හෝ පර්ෂද (Clusters) ලෙස විවිධ නිර්ණායක යොදා ගනිමින් වෙන් කර ගැනීම පළමුව සිදුකළ යුතුය. එහි දී ජනගහනය, ජනඝනත්වය, මාර්ග පද්ධතිය, ග්‍රාමීය වෙළඳපොළ, නිෂ්පාදන ස්වභාවය ආදීය යොදාගත හැකි නිර්ණායක කිහිපයකි.

මෙහි දී වැදගත් වන්නේ ඒ ඒ වසම් හෝ පර්ෂද/ කලාප නියෝජනය කරන ග්‍රාමීය දේශපාලන නායකත්වය ද මෙම ක්‍රියාවලිය සඳහා සක්‍රිය ලෙස දායකකර ගැනීමත්, ග්‍රාමීය ප්‍රජා සංවිධාන නියෝජනය කරන නිලධාරින් ඇතුලු ප්‍රජාව මේ සඳහා දායක කර ගැනීමත්ය. මෙම සමස්ථ ක්‍රියාවලිය විවෘත වේදිකාවක් මත සිදුකිරීම අත්‍යාවශ්‍ය වන අතර, එහි දී පහසුකාරකගේ පහසුකරණ ක්‍රියාවලිය ඉතා වැදගත් වේ. සාමාන්‍යයෙන් ගත්කළ එක් කලාපයකට හෝ පර්ෂදයකට ග්‍රාම නිලධාරි වසම් 5 - 8 අතර සංඛ්‍යාවක් ඇතුළත් කළ හැක. කලාපය තුළ ගනු ලබන තීන්දු තීරණ ග්‍රාම නිලධාරි වසමෙන් හෝ තුලානෙන් ඔබ්බට විහිදුන ඍජු සම්බන්ධතා සහිත ප්‍රතිඵල ගෙනදෙන තීරණයන් වන්නේය.

මෙසේ පිහිටුවන ලද කලාප නියෝජනය කරමින් තෝරාගන්නා ලද නිලධාරින්ගෙන්, ප්‍රාදේශීය සභා නියෝජිතයන්ගෙන් සහ ප්‍රාදේශීය නිලධාරින්ගෙන් සැදුම්ලත් ප්‍රාදේශීය සංවර්ධන උපකමිටුවක් පිහිටුවාගත යුතුවේ.

මෙසේ එකතු වූ කලාප සභාවන් නියෝජනය කරමින් බිහිවන ප්‍රාදේශීය සභා සංවර්ධන උපකමිටුව නමින් කමිටුවක් කලාප කමිටුවලට ඉහළින් පිහිටුවනු ලබයි. එම ප්‍රාදේශීය සභා උපකමිටුව බහුතර ප්‍රතිශතයක් ප්‍රජාව නියෝජනය කරන අතර, ඊට සාපේක්ෂව ප්‍රාදේශීය සභා සභිකයින් අඩු ප්‍රතිශතයක් නියෝජනය කරයි.

> උදාහරණයක් ලෙස 70%ක් ප්‍රජාව නියෝජනය කරන විට ඉන් 30%ක් ප්‍රාදේශීය සභා සභිකයන් තේරී පත්වේ.

කෙසේ වුවත් මෙම කමිටුවේ සභාපතිත්වය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා උසුලන අතර, එම කමිටුවේ ලේකම්වරයා වන්නේ ප්‍රජාවගෙන් පත්වන අයෙකි. මෙම කමිටුව ප්‍රාදේශීය සභා මහසභාවට (Council)

වගකීමට යටත් වන අතර, මෙවැනි කමිටුවක් පිහිටුවීම සඳහා පළාත් පාලන පනත යටතේ ප්‍රතිපාදන ද සපයා ඇත.

මෙවැනි වැඩසටහනකට ප්‍රාදේශීය සභා අන්තර් ගම්මාන වැඩසටහන් ලෙස හඳුන්වනු ලබයි. මෙවැනි ක්‍රමවේදයක් ක්‍රියාත්මක වීම තුළ ප්‍රාදේශීය සභා අරමුදල් වඩාත් ඵලදායි ලෙස සහ තිරසාර ලෙස ප්‍රජාවගේ සෘජු මැදිහත්වීම හේතුවෙන් ප්‍රශස්ත අරමුණු කෙරෙහි යොමු කිරීමේ හැකියාව පවතී. එමෙන්ම ප්‍රජාවගේ යෝජනා සහ අදහස් ප්‍රාදේශීය සභා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී යොදා ගැනීමට සිදුවේ.

අන්තර් ගම්මාන වැඩසටහන් ක්‍රමවේදයක් හඳුන්වා දීමේ දී මූලික වශයෙන් ආයතන සංවර්ධන (Institutional Development) අංශයත්, යටිතල පහසුකම් සංවර්ධන (Infrastructure Development) අංශයත් ලෙස වෙන්කර ගැනීම දෙඅංශයේම ඵලදායීතාවයට ඉවහල් වේ. මේ සඳහා වෙන් වෙන් වූ සැලසුම් ඉහත කමිටුවල සක්‍රිය දායකත්වය ඔස්සේ ගොඩනගාගත යුතුය. විශේෂයෙන්ම ආයතන සංවර්ධන අංශය සඳහා යොදනු ලබන ආයෝජනයන් යටිතල පහසුකම් සංවර්ධන අංශයට සාපේක්ෂව අඩු වුව ද එමඟින් ඇතිකරන බලපෑම අතිමහත්ය.

ආයතන සංවර්ධනය විශාල ලෙස පැතිරුණු ප්‍රතිලාභ ගලා යන විෂය පථයක් සේම ආයතන සංවර්ධන අරමුදලේ දී කලාප ඇතුළු අනෙකුත් කමිටුවල හැකියා වර්ධනය, වගවීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම, මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාවලිය විධිමත්වීම ආදී ක්ෂේත්‍ර ගණනාවක තිරසර දියුණුවක් සමඟින් ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ සංවර්ධනය වෙනස්ම මගකට යොමු කරනු ඇත.

යටිතල පහසුකම් සංවර්ධනයේ දී භෞතික දෑ අපේක්ෂා කළ ද එම ක්‍රියාවලියම සමස්ථ ප්‍රජාවම ප්‍රාදේශීය හා දේශපාලන නායකත්වය හා ප්‍රාදේශීය පරිපාලන යාන්ත්‍රණය සමඟ බැඳ තබනු ලබන මෙවලමක් වන්නේය. මෙම ක්‍රියාදාමය තුළ ප්‍රජාව සෘජුවම මිලදී ගැනීමේ ක්‍රියාවලිය (Community Procurement), සමාජ විගණනය (Social Audit), මූල්‍ය කළමනාකරණය (Financial Management), වගවීමේ යාන්ත්‍රණයට (Accountability) මෙන්ම යහපාලන (Good Governess) ක්‍රියාවලියකටද සක්‍රීය ලෙස දායකත්වය සපයයි.

මෙවැනි ප්‍රාදේශීය සභා අන්තර් ගම්මාන සංවර්ධන වැඩසටහනක මූලික අරමුණු කිහිපයක් වේ. ඒ අතර ප්‍රධන වශයෙන්,

- ප්‍රජාව සහ ප්‍රාදේශීය සභාව එකට එක්වී බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා රැකබලා ගැනීම
- පළාත් පාලන පනත සක්‍රීය ලෙස ප්‍රාදේශීය සභාවක් තුළ ක්‍රියාවට නැංවීම
- අඩු පිරිවැයකින් වැඩි ප්‍රතිලාභ ජනතාවට ලබාදීම
- ඉහත සියලු කටයුතු කාර්යක්ෂම ලෙස කිරීමට හැකිවන පරිදි ආයතන හැකියා වර්ධනය සිදුවීම දැක්විය හැක.

මෙවැනි ප්‍රාදේශීය සභා අන්තර් ගම්මාන සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක වීම තුළ ලැබෙන ප්‍රධාන සේවාවන් කිහිපයක් වේ. එනම්,

- ප්‍රාදේශීය සභාවේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ යාම හේතුවෙන් ප්‍රජාවට කාර්යක්ෂම සේවාවක් සැලසීම
- ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම උදෙසා ඔවුන්ට වඩාත් දැනෙන ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට හැකිවීම
- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමට බාධා වන කරුණු ඉවත් කිරීමෙන් ප්‍රජාවට වැඩි ප්‍රතිලාභ ලැබීම

උදාහරණ ලෙස ප්‍රවාහන පහසුකම් දියුණුවීම, නිෂ්පාදන වෙළඳපොළට ගෙනයාමට පහසුවීම, ඉඩම්වල වටිනාකම් ඉහළයාම, ගම්මාන අතර අන්තර් සම්බන්ධතාවය වැඩිවීම

- මෙවැනි ශක්තිමත් වූ සංවර්ධන වැඩසටහනක් ප්‍රාදේශීය සභාව මූලික කරගනිමින් ක්‍රියාත්මක වීම තුළ ප්‍රජාව යැපීම් මානසිකත්වයෙන් මිදී ප්‍රජාව විසින් තීරණ ගැනීමේ ක්‍රියාවලියකට දායක වීම
- එමෙන්ම සංවර්ධන කාර්යයන් සඳහා වූ ගමනේ දී කාන්තා දායකත්වය ඉතා ඉහළින් ලබාගැනීමට හැකිවීම ඉන් කිහිපයක් වේ.

මෙවැනි සංකල්පයක් ශ්‍රී ලංකාව වැනි රටක නවමු අත්දැකීමක් වුව ද මීට පෙර අවස්ථාවක දී මෙම සංකල්පය ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරා ඇත. ඇතැම් බලධාරින්ගේ පටු දැක්ම හේතුවෙන් මෙවැනි විශිෂ්ඨ වූ සංකල්ප වැඩිදුරටත් ක්‍රියාත්මක නොවීමට සෘජුව ඉවහල් විය. එසේ වුවද, මෙවැනි වැඩසටහනක් ක්‍රියාත්මක වූ විට එහි ජයග්‍රහණයේ නියමුවන් වනුයේ ප්‍රදේශයේ ප්‍රාදේශීය දේශපාලන නායකත්වය සමඟ අත්වැල් බැදගනිමින් කටයුතු කරන සමස්ථ ප්‍රජාවම වේ.

මෙවැනි වැඩ සටහනක් ක්‍රියාත්මක වූ පසු එහි සැබෑ සාර්ථකත්වය මැනීම සඳහා ප්‍රජාවට දැනෙන නිර්ණායක යොදාගත හැකිය. එහිදී දිනෙන් දින ප්‍රජාව සහ ප්‍රාදේශීය සභාව අතර ඇතිවන බැදීම ඉහළ යන්නේ නිතැතිනි. එසේ යොදාගත හැකි නිර්ණායක අතරින් කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රාදේශීය සභාවේ වාර්ෂික අය වැය මඟින් සංවර්ධන යෝජනා තෝරා ගැණීමේදී ප්‍රජාව විසින් මෙම යාන්ත්‍රණය ඔස්සේ හඳුනාගෙන යෝජනා කරන ලද ව්‍යාපෘතීන් කොපමණ ප්‍රමාණයක් ක්‍රියාවට නංවන ලද්දේද යන්න
- ප්‍රාදේශීය සභා අරමුදලින් සෘජු ලෙස එකිනෙක කලාප සඳහා ආයෝජනය කරන ලද්දේද යන්න
- ප්‍රාදේශීය සභා මිලදී ගැනීමේ යාන්ත්‍රණයට ප්‍රජාව කොතෙක් දුරට දායක වන්නේද යන්න
- සමාජ විගණකයින් විසින් ඉදිරිපත්කර ඇති කරුණු කොතෙක් දුරට ප්‍රාදේශීය සභා මහසභාව (Council Meeting) තුළ සාකච්ඡාවට බඳුන්වී ඇද්ද යන්න
- ප්‍රාදේශීය සභා මහසභාව (Council Meeting) පැවැත්වෙන දිනවල ප්‍රජාවට මහජන ගැලරිය (Public Gallery) කොතෙක් දුරට විවර වන්නේද යන්න ආදිය ඉන් කිහිපයක් වේ.

එසේ වුවද අවසාන වශයෙන් මෙවැනි වූ ග්‍රාමීය සංවර්ධනයෙන් ඔබ්බට විහිදුන අන්තර් ගම්මාන සංවර්ධන වැඩසටහන්වල සාර්ථකත්වය රඳාපැවතීම සඳහා ශක්තිමත් පදනම වන්නේ ග්‍රාමීය සංවිධානය වන බැවින් ග්‍රාමීය සංවිධාන සහ එහි සාමාජික සාමාජිකාවන්ගේ හැකියා වර්ධනය සහභාගීත්ව සංවර්ධනය කෙරෙහි

දක්වන දායකත්වය බෙහෙවින් ඉවහල් වේ. එහි දී ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය ප්‍රමුඛතම කාර්යභාරයක් පැවරී ඇති රාජ්‍ය ආයතනයක් වන බව සඳහන් කළ යුතුය.

# 12. ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ගයක් ලෙස මහජන සම්බන්ධතාවය ......

ඒ.එන්. විතානගේ

සංවර්ධන නිලධාරී

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය




සංවර්ධනය යන්න තවමත් ලොව බොහෝ රටවලට සිහිනයක් පමණක්වී ඇති සංකල්පයකි. එය යථාර්ථයක් බවට පත්වීමට නම් සමාජ ප්‍රපංචයන්හි තුලනාත්මක වර්ධනයක් සිදුවිය යුතුය. රටක සමස්ත සංවර්ධන අභිලාෂයන් මුදුන්පමුණුවා ගැනීමේ දී ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත්ය. සංවර්ධන ක්‍රියාවලිය තුළ ගාමක බලවේගය බවට පත්වන්නේ මහජනතාවයි. එහි දී සමාජයේ කුඩාම ඒකකය පවුල නැතහොත් කුටුම්භය සවිබල ගැන්වීම තුළින් ග්‍රාමීය ප්‍රජාව සමස්ත සංවර්ධන ක්‍රියාවලියේම හවුල්කරුවන් බවට පත්කර ගැනීමට හැකිවේ. 1975 ලෝක බැංකු වාර්තාවට අනුව ග්‍රාමීය සංවර්ධනය (Rural Development) යනුවෙන් අරුත් ගන්වන්නේ ගැමි ජනතාව ජාතික ආර්ථික ක්‍රියාදාමයට මැදිහත්කර ගැනීම සඳහා සැලසුම් කෙරුණු ප්‍රතිපත්ති පද්ධතියක් හා සම්බන්ධවීම මගින් දිළිඳු බව තුරන්කරලීම සඳහා ප්‍රයත්න දැරීමයි. ග්‍රාමීය ජනතාවගේ ආදායම්, සේවා නියුක්තිය, අධ්‍යාපනය, සෞඛ්‍ය හා පෝෂණය, නිවාස සහ වෙනත් සමාජීය අවශ්‍යතා වර්ධනය කිරීම, ග්‍රාමීය මන්දපෝෂණය හා දිළිඳුකම අවම කිරීම, ආදායම් විෂමතාව අවම කොට ග්‍රාමීය නාගරික වශයෙන් පවත්නා අසමතුලිතතාව නැති කිරීම යනාදිය ග්‍රාමීය සංවර්ධනයේ අරමුණු අතර වේ. බිලියන 8කට ආසන්න ලෝක ජනගහනයෙන් 60% කට ආසන්න ප්‍රතිශතයක් ආසියානු කලාපය තුළ ජීවත් වේ. සංවර්ධනය වෙමින් පවතින රටවල් ගත්විට ජනගහනයෙන් වැඩි පිරිසක් ග්‍රාමීය ප්‍රජාව වේ. ශ්‍රී ලංකාවේ ද ජනගහනයෙන් 75% ක් පමණ තවමත් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වේ.

සංවර්ධන ක්‍රියාදාමය හා මුසුවන සෑම හවුල්කරුවෙකු, වැඩකරුවෙකු තුළම මනා සුහදත්වය, හොඳහිත ගොඩනභා ගැනීම හා පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. එහි දී උපායමාර්ගික වශයෙන් මහජන සම්බන්ධතාව භාවිතයට ගතහැකිය. වචනාර්ථයෙන් ගත්කල **මහජන සම්බන්ධතා**වෙන් මිනිස් කණ්ඩායමක් හෝ ප්‍රජාව සමඟ ඇතිකරගන්නා යහපත් බැඳීම යන්න සූචනය වේ. පුරාතන ශිෂ්ටාචාර යුගයන් දක්වාම මහජන සම්බන්ධතාව පැරණිය. පාලකයින් ස්වකීය ආධිපත්‍ය පවත්වාගෙන යාමේ දී පොළඹවාලීම හෙවත් ප්‍රලෝභනය (Persuasion) භාවිතාකර ඇත. 20වන සියවස මැද භාගය පමණවන විට මහජන සම්බන්ධතාව පිළිබඳ පුළුල් අවධානයක් යොමුවී ඇත. වර්තමානය වන විට බහු විෂයක සංකල්පයක් බවට පත්ව ඇති මහජන සම්බන්ධතාව වෘත්තීයමය වශයෙන් ද ලෝකයේ සුවිශේෂී ස්ථානයක් හිමිකරගෙන ඇත. මහජන

සම්බන්ධතාව යනු කුමක්දැයි හඳුනා ගැනීමේ දී සංවර්ධන ප්‍රවේශය ඔස්සේ විග්‍රහකර ගත හැකි නිර්වචන කිහිපයක් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ.

එඩ්වර්ඩ් එල් බර්නීස් Edward L Bernys මහජන සම්බන්ධතාව හඳුන්වා ඇත්තේ මූලික කරුණු 3ක් පිළිබඳ අවධානය යොමු කරමින්ය. එනම්,

I. මහජනතාව දැනුවත් කිරීම.
II. මහජනතාව ප්‍රලෝභනය කිරීම.
III. මහජනතාව ඔවුනොවුන් සමඟ එකිනෙකට අන්තර් ක්‍රියාකාරී කරවීම.

යනාදියයි. උක්ත කරුණු තුළින් පැහැදිලි වන්නේ මහජන සම්බන්ධතාව යන්නෙහි ජනතාව කිසියම් දෙයක් පිළිබඳව දැනුවත් භාවයකට පත් කිරීමක්, පෙළඹවීමක් ඇති කිරීමක් හෝ පාර්ශව කිහිපයක් අතර ක්‍රියාකාරීත්වයක් ඇති කිරීමක් අන්තර්ගත වන බවයි. එම අන්තර්ගතය දේශපාලන, සමාජීය හෝ ආර්ථික වශයෙන් සිදුවිය හැකිය.

මහජන සම්බන්ධතාව පිළිබඳ ඉදිරිපත්ව ඇති නිර්වචන විමසීමෙන් ඒවා සාරාංශගත කරන පිලිප් කිචන් (Philip Kitchen) මහජන සම්බන්ධතාව යනු,

I. කළමනාකරණ කෘත්‍යයකි.
II. අරමුණු සහ ක්‍රියාකාරකම් විශාල ප්‍රමාණයක් ප්‍රායෝගිකව ආවරණය කරනු ලබන්නකි.
III. ද්විපාර්ශ්වික හෝ අන්තර්ක්‍රියාකාරී ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.
IV. ව්‍යාපාරයක් හෝ සමාගමක් වෙත රැඳී පවතින මහජනතාව පමණක් එකම අවශ්‍යතාවය නොවී විශාල ප්‍රමාණයක අවශ්‍යතාවයන් හා අරමුණු අන්තර්ගත වන්නකි.
V. පවත්වනු ලබන අන්තර්සම්බන්ධතාවයන් කෙටිකාලීන ඒවාට වඩා දිගු කාලීන සම්බන්ධතාවක් ලෙස සලකනු ලබන්නකි.

ලෙස අර්ථ දක්වයි.

එමඟින් පැහැදිලි වන්නේ මහජන සම්බන්ධතාව සැලසුම්කරණය Planning, සංවිධානකරණය Organizing, මෙහෙයවීම Leading, පාලනය Controlling යන ක්‍රියාවලියෙන් යුක්ත කළමනාකරණ කෘත්‍යයක්වන අතර ඉලක්ක සපුරා ගැනීමට තාත්වික සැලසුම්සහගත ක්‍රියාකාරකම් වලින් හා පිරිසක් අතර සිදුවන අන්තර් ක්‍රියාවලියක් බවත් දිගු කාලීන සබඳතාවලින් යුක්තවන අතර අවශ්‍යතාවයන් හා අරමුණු පුළුල් පරාසයක් තුළ ව්‍යාප්තව පවතින්නක් බවත්ය.

යථෝක්ත කරුණු ඇසුරින් සමස්තයක් ලෙස ගත්කල ක්‍රියාවලියක් වශයෙන් අරුත් ගැන්වීමේ දී මහජන සම්බන්ධතාව හඳුනා ගැනීම, තොරතුරු අදහස් හුවමාරුව, අන්‍යෝන්‍ය සහයෝගය හා උපකාරය, පරිත්‍යාගය හා කැපකිරීම, වගවීම හා වගකීම, අනුබල දීම, පෙළඹවීම, සහජීවනය හා සක්‍රීයකර වීම ආදී සුවිශේෂී ලක්ෂණයන්ගෙන් හා ගුණාංගයන්ගෙන් සමන්විත වූවක් බව විග්‍රහකර ගැනීමට හැකිවේ.

**ග්‍රාමීය සංවර්ධනය හා මහජන සම්බන්ධතාව**

සංවර්ධනය සඳහා ඉවහල් වන ජනතා සහභාගීත්වය ක්‍රියාකාරීව හා කාර්යක්ෂමව ලබාගනුවස් ඔවුන් තුළ ආකල්පමය ප්‍රතිශෝධනයක් ඇති කළ යුතුව ඇත. ඒ සඳහා ආයතනිකව, ප්‍රජාව අතර මෙන්ම බාහිර පාර්ශ්ව අතර ද මනා සබඳතාවක් ගොඩනගා ගැනීම අත්‍යවශ්‍ය වූවකි. එහි දී ප්‍රජාව පොළඹවාලීමට සාධනීය අයුරින් බලපෑම් කිරීමේ ප්‍රබල ශක්‍යතාවක් මහජන සම්බන්ධතා ක්‍රියාවලිය සතු වන්නේ ය. මානව සංස්කෘතිය හා සම්බන්ධ වූ සියල්ල මහජන සම්බන්ධතා ක්‍රියාදාමය ගොඩනැඟීමෙහි ලා ඉවහල් වේ. එම විභවතාව සාධනීය අයුරින් උපයුක්ත කර ගැනීමේ හැකියාවක් සංවර්ධන ක්‍රියාවලිය හා සම්බන්ධ සියලු පාර්ශවයන් සතුවිය යුතුය.

සමාජ, ආර්ථික, දේශපාලනික වශයෙන් ග්‍රාමීය සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමේ දී හවුල්කරුවන්වන ප්‍රජාව, ඔවුන් සමඟ කටයුතු කරන ආයතන හා සංවිධානවල සියලු පාර්ශ්වයන් ද අභ්‍යන්තරව මෙන්ම බාහිරව ද මහජන සම්බන්ධතාව කෙරෙහි පුළුල්ව අවධානය යොමු කිරීම වැදගත්වේ. එහි දී පුළුල් වපසරියක විසිර පවතින මහජන සම්බන්ධතා නිලධාරියාගේ වෘත්තියිකභාවය හා කාර්ය භාරය, මහජන සම්බන්ධතා ප්‍රභේද, ආචාර ධර්ම ආදිය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්වේ.

මහජන සම්බන්ධතා නිලධාරියා ස්වකීය වෘත්තීය ජීවිතයේ දී විවිධ භූමිකාවන් නිරූපණය කරයි. ඔහු ඉතා හොඳ ***සන්නිවේදකයෙක් (Communicator)*** විය යුතුය. මනා සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමේ පදනම වන්නේ එයයි. තම අදහස් චතුර ලෙස මෙන්ම පැහැදිලිව ප්‍රකාශ කිරීමටත්, අන් අයට සවන්දිය යුත්තේ කුමන අවස්ථාවලදී ද යන්න පිළිබඳවත් අවබෝධයෙන් සිටිය යුතුය. එමෙන්ම තමා සාර්ථක සන්නිවේදකයෙකු බව වටහාගත යුතුය. ග්‍රාමීය ජනතාවගේ ආදායම්, සේවා නියුක්තිය, අධ්‍යාපනය, සෞඛ්‍ය හා පෝෂණය, නිවාස සහ වෙනත් සමාජීය අවශ්‍යතා වර්ධනය කිරීම, ග්‍රාමීය මන්දපෝෂණය හා දිළිඳුකම අවම කිරීම, ආදායම් විෂමතාව අවම කොට ග්‍රාමීය නාගරික වශයෙන් පවත්නා අසමතුලිතතාව නැති කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසුවිපරම් ක්‍රියාවලිය කළමනාකරණය කිරීමේ දී සන්නිවේදන කාර්යය ඉතා වැදගත් වේ.

සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, සංවිධානය, මෙහෙයවීම හා පාලනය යන සෑම අවස්ථාවන්හිදීම තොරතුරු වේගවත්ව හා නිවැරදිව ගොනු කිරීම හා නිර්මාණශීලිව ඉදිරිපත් කිරීම හා ඒ සඳහා සුදුසු මාධ්‍යයක් යොදා ගැනීමට සන්නිවේදකයෙකුට හැකිවිය යුතුය. සංවර්ධන ක්‍රියාවලිය සාර්ථකකර ගැනීමට සන්නිවේදක භූමිකාව ඉතා වැදගත් වේ.

එසේම ඉතා හොඳ ***මැදිහත්කරුවෙකු (Mediator)*** ලෙස ක්‍රියා කිරීමද සංවර්ධනය යථාර්ථයක් බවට පත්කර ගැනීමේ දී මහජන සම්බන්ධතාව ගොඩනගා ගැනීමට ඉවහල් වේ. ප්‍රජාව හා ප්‍රතිපත්ති සම්පාදකයින් අතර සිදුවිය යුතු තොරතුරු ගලනය විධිමත්ව හා ක්‍රමානුකූලව ඉටුකර ගැනීමේ දී පහළ සිට ඉහළම ධූරාවලිය නියෝජනය කරන සියලු නිලධාරීන් මැදිහත්කරුගේ භූමිකාව නියෝජනය කරයි. ප්‍රජාව හා ආයතන අතර සබඳතා ගොඩනගන්නේ මැදිහත්කරුවාය. දෙපාර්ශවයේම අවශ්‍යතා තෘප්තිමත් කරමින් ආයතනික කීර්ති නාමය හා ප්‍රතිරූපය ඉහළ නැංවීමට ඔහුට හැකිවිය යුතුය. නමුත් ග්‍රාමීය සංවර්ධනයේ දී

ප්‍රජාවගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන, ඔවුන් සතු ශක්තීන්, දුර්වලතා, අවස්ථාවන් හා තර්ජන ඔවුන් කෙරෙන්ම හඳුනාගෙන පවතින භෞතික හා මානව සම්පත කාර්යක්ෂමව හා ඵලදායීව යොදාගැනීමට මැදිහත්කරු වගවිය යුතුය. ඒ සඳහා ඔහු නිරික්ෂණශීලි, ඉක්මනින් දැනුවත්වන මනා ස්මරණ ශක්තියක් සහිත පුද්ගලයෙකු වීම වැදගත්ය. ඉලක්කගත ප්‍රජා කණ්ඩායම පිළිබඳව මනා අවබෝධයක් හා මානව සන්වේදිතාවය ඔහු සතුවිය යුතුය.

තව ද මහජන සම්බන්ධතා වෘත්තිකයෙකු හොඳ ***අලෙවිකරුවෙකු (Marketer)*** වීම ද බෙහෙවින් වැදගත්ය. අලෙවිකරණ හැකියාව ඇත්තෙකු නිරන්තරව පාරිභෝගික අවශ්‍යතාවයන් හඳුනා ගැනීමටත් ඒවා තෘප්තිමත් කිරීමටත්, ගතික ව්‍යාපාරික පරිසරය තුළ අවස්ථෝචිතව උපායශීලිව කටයුතු කිරිමටත් ඔහුට ශක්‍යතාවයක් තිබිය යුතුය. මනා පාරිභෝගික සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමට අවශ්‍ය ප්‍රචාරක හා ප්‍රවර්ධන කුසලතාවලින් යුක්ත වීම ද ඉතා වැදගත් වේ. ග්‍රාමීය ප්‍රජාව වෙත සංවර්ධන ව්‍යාපෘති හඳුන්වාදීමේ දී නිලධාරීන් සතුව උක්ත හැකියාවන් තිබීම ව්‍යාපෘතිවල සාර්ථකත්වයට හේතුවේ. ඒ සඳහා උචිත සන්නිවේදන මාධ්‍යයන් තෝරා ගැනීමට ද හැකිවිය යුතුය. මෙම හැකියාව තුළින් විභවතාවලින් යුත් පුද්ගලයින් සංවර්ධන ක්‍රියාවලියේ හවුල්කරුවන් බවට පත්කර ගැනීමට හැකිවේ. විශේෂයෙන් ආදායම් උත්පාදනය සඳහා අවැසි නව රැකියා අවස්ථා නිර්මාණය කිරීම, තරුණ කණ්ඩායම් හා ආන්තිකකරණයට ලක් වූ පිරිස් සමාජ ප්‍රගමනයේ හවුල්කරුවන් බවට පත් කිරීමට අවස්ථා ලබාදීම (කලා කුසලතා, නවෝත්පාදන හා නව නිර්මාණ සඳහා අවකාශ ලබා දීම) , සමාජ විරෝධි ක්‍රියාවන් අවම කිරීමට උචිත වැඩසටහන් සැකසීම ආදී සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අලෙවිකරුවෙකුගේ කාර්ය භාරය සංවර්ධන හවුල්කරුවන්හට අනුගමනය කළ හැකිය.

මහජන සම්බන්ධතා වෘත්තීකයා දක්ෂ ***කළමනාකරුවෙකු (Manager)*** වේ. කළමනාකරණ ක්‍රියාවලියට අදාලව කාර්යයන් (සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම, පාලනය) ඉටු කිරීම සඳහා වගකීම් දරනු ලබන පුද්ගලයා කළමනාකරුවෙක් වශයෙන් හඳුන්වයි. නොමැතිනම් ව්‍යාපාරයේ සම්පත් අරමුණු ළඟාකර ගැනීම සඳහා මෙහෙයවනු ලබන පුද්ගලයා කළමනාකරු ලෙස අරුත් දැක්විය හැකිය. *හෙන්රි මින්ස්බර්ග්* (Henry Mintzberg) ට අනුව කළමනාකරුවෙකුගේ භූමිකාව කොටස් 3කින් යුක්තවේ. එනම් අන්තර් පුද්ගල භූමිකාව Interpersonal Role, තොරතුරු භූමිකාව Informational Role, තීරණ භූමිකාව Decisional Role යනාදියයි.

මහජන සම්බන්ධතා ක්‍රියාවලියේ දී ගැටලු කළමනාකරණය Issue Management, අර්බුද කළමනාකරණය Crisis Management, මාධ්‍ය කළමනාකරණය Media Management, තොරතුරු කළමනාකරණය Information Management, උපායමාර්ගික සම්බන්ධතා කළමනාකරණය Strategic Relation Management, ඉසව් කළමනාකරණය Event Management, ප්‍රතිරූප කළමනාකරණය Image Management ආදි විවිධ ප්‍රවේශයන් ඔස්සේ අද්‍යතනයේ කළමනාකරණය යන්න සාකච්ඡාවට බඳුන්වේ. සමාජ, ආර්ථික හා දේශපාලනික ස්ථරයන් තුළ මෙකී ප්‍රවේශයන් නිරන්තර අවධානයට යොමුවේ. ඒවා සංවර්ධන ක්‍රියාවලිය තුළ සාධනීය අයුරින් කළමනාකරණය කරගැනීමට දක්ෂ කළමනාකරුවෙකුට හැකියාව තිබේ.

හදිසි අවශ්‍යතාවයන්වලදී කාර්යක්ෂමව සිතාබලා ක්‍රියාකිරීමටත්, කඩිනමින් තීරණ ගැනීමටත් දක්ෂ කළමනාකාරීත්වයකට හැකිවේ. තමාට සංවිධානය වීමටත් අන් අය සංවිධානය කිරීමේ හැකියාවෙන් යුක්ත විය යුතු අතර ප්‍රජාවගේ අවශ්‍යතාවය අනුව ප්‍රමුඛතා ලේඛනගත කර අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘතීන් හඳුනා ගැනීමට, සැලසුම්කිරීමට, සංවිධානය කිරීමට, මෙහෙයවීමට හා පාලනය කිරීමට උපායමාර්ගිකව දායක වීමට සංවර්ධන හවුල්කරුවන්ට හැකිවිය යුතුය.

පුද්ගලයා සමාජය සමඟ සම්බන්ධතා පැවැත්වීමේ දී ස්වකීය ප්‍රතිරූපය ගොඩනගා ගැනීම ද වැදගත් වේ. විශේෂයෙන් ග්‍රාමීය ජනතාව සමඟ කටයුතු කිරීමෙ දී ඔවුන්ගේ සෞඛ්‍ය හා පෝෂණය සම්බන්ධ වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීම, ඒ සඳහා ඔවුන් ආකර්ෂණය කරගැනීම හා යහපත් හුරුපුරුදු ඇති කිරීමේ දී ඔවුනොවුන් අතර අන්තර් සබඳතා ගොඩනගා ගනිමින් ඉදිරිවැඩ සැලසුම් කිරීම ආදියේ දී ප්‍රතිරූප කළමනාකරණය වැදගත් වේ. ප්‍රතිරූපය ආයතනික වශයෙන් ද අත්‍යවශ්‍ය අංගයක් වේ. එහිදී තමන් සම්බන්ධතා පවත්වන පුද්ගල කණ්ඩායම පිළිබඳව දැනුවත් වීම, තම ආත්ම විශ්වාසය ගොඩනඟා ගැනීම, සුදානම හා පුහුණුව, චර්යා රටාව හා ඇඳුම් පැළඳුමෙහි නිවැරදි භාවිතය ද වැදගත් වේ.

වර්තමානයේ දී ග්‍රාමීය සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමේ දී මාධ්‍ය හා තොරතුරු කළමනාකරණය ද අතිශය වැදගත් භාවිතාවක් ලෙස හඳුනාගත හැකිය. විශ්ව ගම්මාන සංකල්පයත් සමඟ විද්‍යුත් මාධ්‍ය හා තාක්ෂණික භාවිතය අත්‍යවශ්‍ය සාධකයකි. සංවර්ධන ක්‍රියාවලියේ දී තාක්ෂණික දියුණුව ද වැදගත් අංශයකි. එය සමාජීය ප්‍රගමනය උදෙසා සාධනීය අයුරින් භාවිතයට ගත යුතුය. සමාජ මාධ්‍ය භාවිතයත් සමඟ සන්නිවේදන ක්‍රියාවලිය වේගවත්ව හා කාර්යක්ෂමව සිදුවේ. ඒහා සමගාමීව තොරතුරු සම්ප්‍රේෂණය ද වේගවත් වී ඇත. ග්‍රාමීය ප්‍රජාව හුදෙකලා නොකර සංවර්ධන ක්‍රියාදාමයට එක්කාසු කරගැනීමේ දී ***මහාචාර්ය විල්බර් ශ්‍රාම්*** දක්වන පරිදි ජාතිකත්වය පිළිබඳ හැඟීම තහවුරු කිරීම, ජාතික අපේක්ෂා උසස් තත්ත්වයකට පත් කිරීම, වෙනස්වන සමාජයට අනුව නව ජාතික අපේක්ෂා ඇති කර ගැනීම, සාම්ප්‍රදායික සමාජයන්හි නව හැකියා ව්‍යාප්තකර ගැනීම, පොදු ජනතාව හැකිතාක් පාලන තන්ත්‍රයට සහභාගීකර ගැනීම, සංවර්ධන ඉලක්ක පැහැදිලිකර ඒ කරා ගමන් කිරීමට ජනතා සහභාගීත්වය ලබා ගැනීම, සංවර්ධන කටයුතු කෙරෙහි මහජනයා දක්වන ප්‍රතිචාර හෙවත් ප්‍රතිපෝෂණය ලබා ගැනීම යනාදිය සඳහා මාධ්‍ය උපයෝගී කරගත හැක. ඒ ඇසුරින් මනා මහජන සම්බන්ධතාවක් ගොඩනගා ගනිමින් සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට සංවර්ධන හවුල්කරුවනට හැකිවිය යුතුය.

උක්ත කරුණු අභ්‍යන්තර සන්නිවේදනය, මාධ්‍ය සම්බන්ධතා, අන්තර් සම්බන්ධතා, උපායමාර්ගික සන්නිවේදනය, කළමනාකරණය ආදී මහජන සම්බන්ධතා ප්‍රභේදයන් ඔස්සේ ද වර්ගීකරණය කිරීමට හැකිවේ. එකී භූමිකා හා කාර්යයන් සංවර්ධන ක්‍රියාදාමයේ හවුල්කරුවන් විෂයෙහි උචිතවේ. ග්‍රාමීය සංවර්ධනය තුළ හමුවන විවිධාකාර ප්‍රජා කණ්ඩායම් (අධ්‍යාපන මට්ටම, සේවා නියුක්තිය, වයස් කාණ්ඩ, ජාති ආගම්, ආකල්ප, දේශපාලනික මත දරන්නන්) හා ඔවුන් සමඟ කටයුතු කරන විවිධ තරාතිරම් දරන නිලධාරීන් අතර ද මනා සබඳතාවක් තිබීම සංවර්ධන අභිලාෂයන් මුදුන්පත් කර ගැනීමේ දී ඉතා වැදගත් වේ. එහිදී උපායමාර්ගිකව මහජන සම්බන්ධතාව යොදාගත හැකි වේ. මෙහිදී ආයතනික වශයෙන් සිත්ගන්නා සුලු කාර්යාලයීය පරිසරයක් තිබීම (සුහදශීලී කාර්ය මණ්ඩලයක්, පිරිසිදු ක්‍රමවත් හා කාර්යක්ෂම වැඩ බිමක්, පැමිණෙන සියලු සේවාලාභීන් සඳහා සමාන පහසුකම්) ද ඉතාම වැදගත් වේ.

වඩාත් යහපත් මහජන සම්බන්ධතා ක්‍රියාවලියක් තුළින් ගැටුම්, අර්බුද අවම, ප්‍රජා අවශ්‍යතාවයන් තෘප්තිමත් වූ, පවත්නා සම්පත්වලින් උපරිම ප්‍රතිලාභයන් හිමිකර ගත හැකි සංවර්ධන ක්‍රියාවලියකට හිමිකම් කිව හැකිවේ. ඒ සඳහා උපායමාර්ගික වශයෙන් මහජන සම්බන්ධතාව භාවිතයට ගැනීම වැදගත් වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. සංවර්ධන සන්නිවේදනය - බන්දුල අත්තනායක
2. සංවර්ධනාත්මක සන්නිවේදනය - සේන නානායක්කාර
3. ග්‍රාම සංවර්ධනය පිළිබඳව ශාස්ත්‍රීය සඟරාව - ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
4. මහජන සම්බන්ධතාව මාධ්‍ය නීතිය හා ආචාර ධර්ම - මනෝජ් පුෂ්පකුමාර ජිනදාස
5. තිලක ලකුණ - ජන සන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය

# 13. නව චින්තනයට සාම්ප්‍රදායික හරයන් මිහිදන් කළ හැකිද ……

ආයුර්වේද වෛද්‍යාචාර්ය

සුනීතා .සී.කරුණාරත්න

සිද්ධායුර්වේද වෛද්‍ය නිකේතනයේ කථිකාචාර්ය

සිද්ධායුර්වේදඥ D.S.AC - MACF

මෙම මාතෘකාව පිළිබඳ සාකච්ඡා කිරීමේදී  නව චින්තනය හා පැරණි චින්තනය ලෙසට ක්‍රම දෙකකට වෙන්කර සාකච්ඡා කළ යුතුයි.

නව චින්තනය යනු නව සිතුවිලි හෙවත් අලුත් සිතුවිලියි. එය මෙසේ දැක්වීමට හැකිය. එනම්, අප ජීවත්වන කාලය දශක අනුව ගණනය කළ හැකිය. ආසන්න කාලය දශක දෙකක පමණ කාලය නව චින්තන කාලය නම් ඉන් පෙර කාලය පැරණි චින්තන කාලය ලෙසට සැලකිය හැකිවේ. මේ සාමාන්‍ය අවබෝධයක් ඇති කර ගැනීම සඳහා යොදාගත් විධියකි.

මේ කාලපරාසය තුළ දී මිනිසුන්ගේ එදිනෙදා ක්‍රියාකාරකම් ජීවන රටා විවිධාංගීකරණයට ලක්වී හාත්පසින්ම වෙනස් වී ඇත. මෙසේ සිදුවීමට හේතු රාශියක් පවතී. ඒ අතර අධ්‍යාත්මික ආර්ථික, සෞඛ්‍ය හා සාමාජික ලෙසට ඒ ඒ අනුව ඇතිවන වෙනසක් ලෙසට සිතිය හැකිය. වර්තමානය වන විට විවිධ පරිවර්තනවලටද ලක්වෙමින් පවතී. වර්තමාන මානව සමාජය තුළ සංස්කෘතිය පිළිබඳව සලකා බැලීමේ දී මහාද්වීප වශයෙන් හා රටවල් වශයෙන් සංස්කෘතික ක්‍රම එකිනෙකට හාත්පසින්ම වෙනස් වේ.

ඉන්දුනීසියාව ලෝකයේ හොඳම සංස්කෘතියක් ඇති රටක් යැයි සලකයි. එමෙන්ම නව තාක්ෂණ භාවිතකරණය, ග්‍රහණය කරගන්නා රටවල් අතර ඇමරිකාව, යුරෝපා රටවල්, චීනය, ජපානය, රුසියාව තාක්ෂණයෙන් දියුණුම රටවල් වේ. එසේම ඔවුන්ගේ සංස්කෘතියට ගරු කරයි. උදාහරණ ලෙසට චීනය සැලකිය හැකියි. චීනකටු චිකිත්සා ක්‍රමය, ඉකබානා මල් කලාව චීන කෘෂිකර්මාන්තය, එම සංස්කෘකිය රැක ගැනීමේ ක්‍රම කිහිපයකි. ශ්‍රී ලංකාව සාරවත් සංස්කෘතික ගුණ පාරිසරික සම්බන්ධතා දුර්වල තත්ත්වයකට පත්වී ඇත. නව තාක්ෂණය ග්‍රහණයකර ගැනීමේ දී සංස්කෘතියට පමණක් නොව, අධ්‍යාපනය, සෞඛ්‍ය, අදහන ආගම්පවා මේ වන විට විනාශ මුඛයට පත්වී ඇත. උදාහරණයක් ලෙසට ශ්‍රී ලංකාවේ බුදු දහම ප්‍රධාන ආගම ලෙසට සැලකේ. ආගම (බුදු දහම) විකෘතිකරන විෂම මතවාදීන් නිසා බෞද්ධ ප්‍රතිපත්ති පවා වෙනස් කිරීම්වලට කටයුතු කරන සමාජයක් ඇති වී තිබේ. මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුවේ. ත්‍රිපිටක ධර්මයට පටහැනිව ක්‍රියාකරන මිෂනාරී අදහස් ඛණ්ඩණය කළ යුතුයි. විවිධ දේශපාලන පක්ෂයන්ට අයත් රජයන් බිහිවීමෙන් ප්‍රතිපත්ති වෙනස්වේ. එසේම සෞඛ්‍ය, අධ්‍යාපනය ආදී රටක ජීවනාලියට බාධා කරන අත්‍යවශ්‍ය අංග වෙනස් කිරීමේදී ද විශේෂ අවධානය යොමු කළ යුතුයි. එම නිසා අදාළ නීති කෙටුම්පත් සිදුකළ යුතුයි. මානව සමාජය තුළ විවිධ අසංවර ඇඳුම් පැළඳුම්

භාවිතා වේ. සංස්කෘතිය විනාශ කරන ආකාරයට මේවා වෙනස්වීම සදාචාර සම්පන්න නොවේ. නව තාක්ෂණය

යොදාගැනීම සුදුසු යැයි සලකන අංශ උකහාගනිමින් කටයුතු සම්පාදනය කළ යුතුයි. ඒ සඳහා මහජනයා තුළ යහපත් සිතුවිලි නිර්මාණය කිරීමට රටේ වගකිවය යුතු ආගමික නායකයන්, බුද්ධිමතුන්, වැඩිහිටියන්, වියතුන් මූලිකත්වය ගෙන කටයුතු කළ යුතුයි. නැතහොත් නව චින්තනය තුළින් සමාජයට අයහපත් ප්‍රතිඵල ඇතිවේ. එය අයහපත් පෙරළියකි.

දැනට දශක තුනකට පෙර දී ශ්‍රී ලංකාවේ සමාජ ගතව තිබූ සියලුම සංස්කෘතික ලක්ෂණ පිරිහීයාම සිදුවී ඇත්තේ මිනිසුන්ගේ නොමනා නව සිතුවිලිවල පෙරළියකිණි. කෘෂිකර්මාන්තය ගැනද සලකා බැලීමේදී පෙර තිබූ කෘෂිකාර්මික රටාව සම්පූර්ණයෙන්ම වෙනස්වී ගොස් තිබේ. දියුණුවන ලෝකයට ගැළපෙන යැයි සැලකෙන නවීන තාක්ෂණ මෙවලම් පරිහරණය කර සහල් ඔප කිරීමද (ඔපදැමීම හෙවත් කුරුට්ට ඉවත් කිරීම) සෞඛ්‍යයට හානි සිදුකරයි. සහල් ඇටවල මතුපිට සැකසී ඇති නිවුඩු ලෙසට සැලකෙන ආවරණය තුළ විටමින් වර්ග පෝෂ්‍ය පදාර්ථ අන්තර්ගතයි. එම කුරුටු යවා ඔප කිරීමෙන් ඒවා ආහාරයට ගැනීම නිසා සෞඛ්‍ය පිරිහී ගොස් ඇත. එසේම මනුෂ්‍යා ස්වභාවික ක්‍රම අතහැර නව සිතුවිලි ඔස්සේ නව තාක්ෂණයට ප්‍රිය කිරීම හේතුවෙන් ඇතැමුන් ආයුෂද කෙටිකරගෙන ඇත.

පැරණි කෘෂිකාර්මික කටයුතුවලදී “යල් කන්නය“ සහ “මහකන්නය“ ලෙසට වර්ෂය තුළ ගොවිතැන් කරන ක්‍රමය සැදී තිබුණි. එසේම පැරණි අය ඍතු භේදය පිළිබඳව මනා දැනුමක් ඇතිව කටයුතු කරන ලදී. උදලු, මුල්ලු ආදී උපකරණ භාවිතා කරමින් කායික නිරෝගීතාවයද ආරක්ෂාකර ගන්නා ලදී. පසද ස්වභාවික ලෙසට පෙරලීම නිසා පසේ ජීවත්වන කෘෂිකර්මයට හිතකර ක්ෂුද්‍රජීවීන් විනාශ නොවිණි. වර්තමාන චින්තනය මගින් දියුණු යැයි සලකන කෘෂිකාර්මික යන්ත්‍ර, කෘමිනාශක, රසායනික පොහොර වර්ග, දියර රසායන වර්ග යෙදීම හේතු කරගෙන පස තුළ ස්වභාවික යාන්ත්‍රණය වෙනස්වී විනාශකාරී සිදුවීම් දාමයක් ඇතිවිය. ඇළ,දොළවල ජීවත්වූ කුඩා කෘමීන්, මාළුවර්ග, මැඩියන් ආදී පරිසරයට කෘෂිකර්මයට හිතකාමී සතුන් විනාශ විය.එසේම ඩෙංගු, මැලේරියා ආදී රෝග නැවත හිස ඔසවමින් පවතී.

එසේම පුරාණයේ ගෙවල්වලින් එදිනෙදා ඉවතලන කුණුරොඩු ආදී අපද්‍රව්‍ය දැමීමට, කොම්පෝස්ට් පොහොර වළක් තිබිණි. නමුත් නවීන තාක්ෂණය මගින් මෙම කුණු නගරබදව නම් ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහනගර සභා මගින් රැගෙන ගොස් පුළුස්සා විනාශ කරනු ලබයි. පැරණි චින්තනය තුළින් එකල සාදාගත් කුණුරොඩු දිරාපත්වීමෙන් ලබාගත් කොම්පෝස්ට් පොහොර ගොඩමඩ ගොවිතැන් සඳහා යොදා ගන්නා ලදී. එම නිසා පරිසරයට හානි ඇතිවූයේ නැතිතරම්ය.

නව තාක්ෂණය මගින් සාදාගත් කෘෂිරසායන යෙදීමෙන් පරිසරය දූෂණය වන අතර, එම කෘෂි රසායන ද්‍රව්‍ය ජල මූලාශ්‍ර ගතවීමෙන් ස්වභාවික ජල පද්ධතියට, ළිං, ආදියට එක්වී එම ජලය පානය කිරීම නිසා වකුගඩු ආබාධ ආදියට ගොදුරුවී ඇත. එසේම සියලුම බෝ නොවන රෝගවලට හේතු ලෙසට මෙම නව චින්තනය තුළින් බිහිවී ඇති ඇතැතම් තාක්ෂණ ක්‍රම, කෙටි ආහාර ක්‍රම දැක්විය හැකිය. එම රෝග අතර

හෘදරෝග, මධුමේහ (දියවැඩියාව), චර්ම රෝග, පිළිකා, ආසාදනරෝග, ස්වසනරෝග ආදී රෝග හඳුනාගත හැකියි. එසේම “කුපෝෂණ“ (පෝෂණය නැති බව) කෙටි ආහාර ක්‍රම යොදා ගැනීම නිසාද, ව්‍යායාම

නැතිවීම, දුරකථන භාවිතය ද (දවසේ වැඩි වේලාවක් භාවිතා කිරීම) ආදිය හේතුකරගෙන අධික තරබාරුව වැඩිබර දරු උපත්, මානසික ආබාධ සහිත රෝගීන්, හෝමෝන ක්‍රියා විකෘතිවීම නිසා හටගන්නා රෝගී තත්ත්ව නව චින්තනයේම ප්‍රතිඵල ලෙසට දැක්විය හැකිය.

අද දිනෙන් දින උපත් අනුපාතය අඩුවීමට හේතුපාදක වී ඇත්තේ ද මේ නව චින්තන ක්‍රමයේ ප්‍රතිඵල ලෙසටයි. පැරණි පවුල් සංස්ථාව තුළ පැවති සමගියද අද නැත. ගම්වල කුඩා දරුවන් එක්වී ක්‍රීඩාවල යෙදුන අතර ඒ මගින් අධ්‍යාපනය, දැනුමද වර්ධනය කර ගන්නා ලදී. ආහාරපාන බෙදා හදා අනුභව කරන ලදී. දරුවන් අතර අදහස් හුවමාරු කරගෙන ජීවත් විය. මේ සියලුම ක්‍රියාකාරීත්වයන් මත දරුවන් කායික හා මානසික ශක්තිමත් ප්‍රබෝධයකින් යුක්ත දරු කැලක් නිර්මාණය විය.

අද දරුවන්ට හිතා මතා වැඩකිරීමට අවශ්‍ය ඉඩකඩ අහුරා ඇත. එබැවින් රොබෝවරුන්මෙන් දරුවන් කිසියම් කාර්ය කොටසක් පමණක් කිරීමට යොමුවී ඇත. නැතහොත් යොමුකර ඇත. වර්ථමාන දෙමව්පියන් දෙදෙනාම ජීවන අරගලයට මුහුණදීමට සිදුවී ඇත. නව පරම්පරාව තුළ සැදෙන දරුවන්ට කෘතිමව විටමින් වර්ගවලට හුරුකර ඇත. එසේම සාමාන්‍ය ප්‍රතිශ්‍යා උණකදී පවා ඉතාම ප්‍රබල ඖෂධ ආදිය දීමට කටයුතු කරයි. මේ හේතුවෙන් උපද්‍රව ඇතිවීම ද දක්නට හැකියි. අප ශරීරයට ගන්නා සියලුම බෙහෙත් වර්ග නිර්විෂීකරණයකට භාජන වේ. එම නිසාද නිරෝගී වකුගඩුවලට බලපා රෝගී තත්ත්වයට පත්වේ.

පුරාණයේ ගැමියන් සම්ප්‍රදායික ගොවිතැන් මගින් පවුල් සංස්ථාව පෝෂණය කරන ලදී. එම ගොවිබිම්වල විවිධ ආහාර භෝග, පලතුරු කෘෂි රසායන නොයොදා වගා කරන ලදී. අතුරු භෝග ලෙසට කැකිරි, පිපිඤ්ඤා , කොමඩු ආදී ජලය බහුල එළවළු, පලතුරු වගාකල අතර, ඒවා ආහාරයට ගන්නා ලදී. එම නිසා වකුගඩු ආශ්‍රිත ගල්, ආදිය හට නොගැනීමට හේතු විය. නමුත් වර්තමානයේ නව චින්තයට අනුව සැකසූ ආහාර එළවළු කිහිපයක් එක්කර කුළුබඩු යොදා සාදාගන්නා සුප්වර්ග වෙනුවට ඉතාම කුඩා සුප්කැට කෘතිම රසකාරකද එක්කර සාදා ආහාරයට ගනී. දරුවට උදෑසන නොමිලේම ලැබෙන හිරු කිරණ පවා අද ලබාදීමට දෙමාපියන්ට කාලයක් නොමැත. ඒ පිළිබඳව අවධානයක් ද යොමු නොකරයි. පැරණි චින්තනයට අනුව බිහිවූ දරුවන්ට යහපත් සිතුවිලි පහල විය. උදාසීන නැති දරුපරපුරක් බිහිවිය. නමුත් නව චින්තනය නිසා දරුවා කොටුවූ රාමුවක් තුළ ජීවත්වීමට සිදුවී ඇත. එබැවින් දරුවන්ට නිසියාකාර දෙමාපිය ආදරය, සෙනෙහස, රැකවරණය නොලැබී ඇත. එසේම රටේ සිටින බුද්ධිමතුන් රට හැරයාම ද අද මහත් අවුලක් වී ඇත. එම නිසා මෙම බුද්ධිමතුන් , රටතුළ රඳවා ගත හැකි ක්‍රම සංවිධානය කළ යුතුයි. එසේ වුවහොත් මේ මගින් රට සමෘද්ධිමත් වේ. අනාගත පරපුරට යහපත් වේ. නව සිතිවිලි හා නව තාක්ෂණය සමාජයේ උන්නතිය උදෙසා යොදා ගන්නා වැඩපිළිවෙලක් සකසා ගත යුතුවේ. පැරණි අදහස් හණමිටි අදහස් ලෙසට නූතනයන් විසින් හඳුන්වා දුන්න ද පැරණි සමාජයේ පැවති ඇතැම් හරවත් සාරධර්ම අද නව චින්තනය තුළින් ගෙඩනැගුණ සමාජය තුළ දැකගත නොහැකි වේ.

බෞද්ධ දර්ශනයට අනුව නම් , "චිත්තං ධම්මං සුඛා වහං"

සිත දැකිය නොහැකිය. එය ස්පර්ශකළද නොහැකිය. සිත ගැන අවබෝධයක් නැතිව ඇසුරු කළහොත් බොහෝ විට වැරදි දෙයට යොමු විය හැකිය. එම නිසා එලඹසිටි සිහියෙන් සිතුවිලි පරිහරණය කළ යුතුයි.

වර්තමාන සමාජයේ ලෝභය → ලෝභයෙන්ද

මෝහය → මෝහයෙන්ද

ද්වේශය → ද්වේශයෙන්ද

සමාජ ගතවූවොත් හැම විටම අයහපත් සිතුවිලි ද ඇතිකර නොගෙන සිටිය යුතුයි. එබැවින් යහපත් නව සිතුවිලි පුබුදුවා ගන්න. එවිට මඩෙහි නෙළුම් මල පිබිදීමේ දී මඩෙන් උඩට නෙළුම් කැකුල පැමිණ, සූර්යාලෝකය වැටීමෙන් නෙළුම් මල පිබිදී එය මඩේ නොගෑවී ස්වශක්තියෙන්ම පිබිදේ. එසේම යහපත් සිතුවිලි හදවත් තුළ ඇතිකරගත් විට යහපත් නව චින්තනය තුළින් සමාජ පරිවර්තනයක් සිදුකළ හැකියි. එබැවින් මානසික සතුට සහනය පිරි යහපත් සමාජයක් නිර්මාණය කිරීමට අපි සැම දෙනාම උත්සුක විය යුතුයි. ඒ අනුව සුදුසු පරිදි සකස් වූ යහපත් නව චින්තනයක් තුළින් සමාජ පෙරළියක් සිදු කිරීමට සපථ කළ යුතුයි.